www.guwansara.lk
Registered in the Sri Lanka Press Council Under No:P - 1388
Registered in the Department of Posts of Sri Lanka Under
No: QD/140/News/2013

# ගුවන්සර

## Guwansara

ගුවන් ක්ෂේත්‍රය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල අධ්‍යාපනික සඟරාව
හත්වන කලාපය | 2013
ISSN - 2012 - 6298
FREE ISSUE





මත්තල
**රාජපක්ෂ**
ජාත්‍යන්තර
**ගුවන් තොටුපළ**
2013 මාර්තු මස
18 වන දින
ජනතා අයිතියට
පත්වන වගයි......

**මත්තල, ශ්‍රී ලංකාවේ දෙවන**
ජාත්‍යන්තර ගුවන් තොටුපොළ

වරායක් මෙන්ම අලුතින් ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ද ලංකාවේ ඉදිවන්නේ යටත් විජිත අවධියෙන් පසුවය. කිලෝ මීටර 3.5 ක දිගින් යුතු ගුවන් පථයක් සහිත මත්තල ගුවන් තොටුපළ ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළයි. දකුණේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට මෙන්ම ආයෝජන සහ සංවර්ධන කලාපවල වර්ධනයටත් මෙමඟින් කදිම අවස්ථාවක් උදාවනු ඇති බව මම විශ්වාස කරමි.

***මහින්ද චින්තනය 2010***


Sri Lanka's *First*
**ECO**-FRIENDLY
AIRPORT


Mattala
**Rajapaksa** International Airport
is being implemented as an
Eco-Friendly AIRPORT

# CONTENTS
WHAT'S INSIDE


## Feature Articles

07
**ගුවන් සේවා**
සියවස් සැමරුම
**Centenary of**
Aviation in Sri Lanka

**රාජපක්ෂ**
**ජාත්‍යන්තර ගුවන් තොටුපළ**
ඓතිහාසික පස්දුන් මාවතේ පිහිටි
මත්තල මහා තැනිතලාවේ
නවීන කේන්ද්‍රස්ථානයයි
18

31
ආසියාවේ ගුවන් කේන්ද්‍රයේ
රන් සළකුණ
මත්තල
**රාජපක්ෂ ජාත්‍යන්තර**
**ගුවන් තොටුපළ**

## Mattala

Mattala As A
Potential
**SPACEPORT**
45

51
Remember when
going to the
**Airport**
was something special?
It still is!

மத்தள ராஜபக்ஷ
சர்வதேச
விமான நிலையம்
**(MRIA)**
60

## News

64
Launching of
Sri Lanka's First
**'Aviation**
**Sports Zone'**

ශ්‍රී ලංකන්
ගුවන් සමාගම
**oneworld සමඟ එක්වෙයි**
**Srilankan Airlines** to join
74

83
තුර්කිය ලොව **විශාලතම**
**ගුවන් තොටුපළ**
**ඉදිකිරීමට සූදානම් වේ**

## Guwansara

ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ
පාසල් සිසුන් දැනුවත් කිරීමේ
වැඩසටහන
පාදුක්ක
92

95
Principals Meeting for
**Galle District**

ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ
පාසල් සිසුන් දැනුවත් කිරීමේ
**ප්‍රධාන වැඩසටහන**
ගාල්ල දිස්ත්‍රික්කය
96

# EDITORIAL

**EDITOR IN CHIEF**
Dev Kowsala Samarajeewa

**EDITOR**
Chandima Kodithuwakku

**AVIATION NEWS EDITOR**
Ishara Gunawardena

**CO-EDITORS**
Gimhan Dabarera
Gayani Millawithanachchi
Dulanjali Mapitiyage
Ashan Hettige
Chandula Minuwanga

**CIRCULATION**
Nilantha Tennakoon
Yohan Tennakoon

**DESIGN**
Madhushanka Wajira

**PHOTOGRAPHY**
Chandika Lakmal
Manjula Marasinghe

**PUBLISHER**
Civil Aviation Authority
No 04, Hunupitiya Rd, Colombo 2.
T/P 0112 350088

**ප්‍රධාන සංස්කාරක**
දේව් කව්සල සමරජීව

**සංස්කාරක**
චන්දිමා කොඩිතුවක්කු

**ගුවන් සේවා ප්‍රවෘත්ති සංස්කාරක**
ඉෂාර ගුණවර්ධන

**සහය සංස්කාරණය**
ගිම්හාන් දබරේරා
ගයනි මිල්ලවිතානච්චි
දුලාංජලී මාපිටියගේ
අෂාන් හෙට්ටිගේ
චන්දුල මිනුවංග

**බෙදාහැරීම් කළමණාකරනය**
නිලන්ත තෙන්නකෝන්
යොහාන් තෙන්නකෝන්

**පරිගණක පිටු සැලසුම්**
මධුශංක වජිර රත්නායක

**ඡායාරූප**
චන්දික ලක්මාල්
මංජුල මාරසිංහ

**ප්‍රකාශනය**
සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක : 04 හුණුපිටිය පාර,
කොළඹ 02.
දුරකථන : 0112 - 350088,

ගුවන් සේවා ජාතික
අධ්‍යාපනික වැඩසටහනේ සහ
ගුවන්සර සගරාවේ
උපදේශකත්වය
සිවිල් ගුවන් සේවා අමාත්‍ය
**ගරු පියංකර ජයරත්න**
**මැතිතුමා**





**මත්තල රාජපක්ෂ**
**ජාත්‍යන්තර ගුවන් තොටුපළ**
**සංවර්ධනයේ සමතුලිතතාවය**
**බේදී යාම පිළිබඳ හොඳම නිදසුනයි**

අපේ සටහන

FEATURE

# අළුතෙන් ලියවෙන ඉතිහාසය

2012 වසර මෙන්ම 2013 වසරද ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයට සුවිශේෂී වසරකි. ජාත්‍යන්තර ගුවන් යානා සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් 60 දශකය තුළ ආරම්භ කරන ලද කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකාව තුළ මේ දක්වා ලෝකයේ ගුවන් යානා, ගුවන් මගීන් මෙන්ම ගුවන් බඩු සඳහා සිය අඛණ්ඩ සේවාව ලබා දුන් ගුවන් තොටුපළයි. නමුත් එවක දී මගීන් 150,000 කට පහසුකම් සැපයිය හැකි අයුරින් නිර්මාණය කර තිබූ කටුනායක ගුවන් තොටුපළ කාලානුරූපීව ගමන් කරමින් පසුගිය 2012 වසරේ මගීන් මිලියන 07 ට වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් සිය දායකත්වය සපයා ඇත. ඒ සිය උපරිම ධාරිතාවය වන මගීන් මිලියන 06 ද ඉක්මවා යමිනි. කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපළ තුළ හැසිරවිය හැකි මගීන් සංඛ්‍යාව උපරිමයක් වෙත පැමිණ තිබෙන මෙම වකවානුව ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආරම්භ කිරීමට සුදුසුම කාලයයි.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිළිබඳ සංකල්පය 2010 මහින්ද චින්තන ඉදිරිදැක්ම වැඩ පිළිවෙළ තුළින් එළි දක්වන්නේ මෙම අවශ්‍යතාවය යුගයේ අවශ්‍යතාවයක් වූ බැවිනි. 2009 වසරේ ආරම්භ කරන ලද මෙම සුවිසල් ව්‍යාපෘතිය සඳහා තෙවසරක් ගත වී ඇති අතර සිහිනයක්ව පැවති ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ යථාර්තයක් බවට පත්ව ඇත. එය සාමාන්‍ය ගුවන් තොටුපළක් නොව දැනට ලොව පවතින විශාලතම මගී ගුවන් යානය වන එයාර්බස් 380 වර්ගයේ ගුවන් යානා පවා ගොඩබැස්සවිය හැකි ආකාරයට නිර්මාණය කරන ලද ආසියාවේ ප්‍රමුඛ පෙළේ පරිසර හිතකාමී ගුවන් තොටුපළකි.

එහි ආරම්භය ඉතා සුබදායක වන්නේ දැනටමත් මත්තල ගුවන් තොටුපළ වෙත සිය ගුවන් මෙහෙයුම් සිදුකිරීම සඳහා ෆ්ලයි ඩුබායි, එයාර් අරාබියා ඇතුළු ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් කිහිපයක් කැමැත්ත පළ කොට තිබීම හේතුවෙනි. ඊට අමතරව ජර්මනියේ ලුෆ්තාන්සා ගුවන් සමාගම ගුවන් යානා නඩත්තු කර්මාන්ත ශාලාවක් මත්තල ප්‍රදේශය ආශ්‍රිතව ඉදිකිරීමට සැළසුම් කොට ඇත. ගුවන් තොටුපළට සමගාමීව හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිදුවන යටිතල පහසුකම් සංවර්ධනය ද අතිවිශාලය. මාර්ග පද්ධතිය, විදුලිබල පහසුකම්, ජල පහසුකම්, හෝටල් පහසුකම් මෙන්ම ඒ හා ආශ්‍රිත සාප්පු සහ වෙළඳ රැකියා අවස්ථා ද බොහෝමයකි.

බස්නාහිර පළාතට පමණක් සීමාව තිබූ සංවර්ධන ක්‍රියාදාමය මේ වන විට ඉතා කාර්යක්ෂම අයුරින් රට අභ්‍යන්තරයට ද ව්‍යාප්තව ඇත. ඉතා කෙටි කලකින් නිම කරන ලද මත්තල ගුවන් තොටුපළ ඊට කදිම උදාහරණයකි. මෙවැනි ව්‍යාපෘති හේතුවෙන් ඉදිරියට යන්නේ ශ්‍රී ලාංකේය ජාතිය මිස පුද්ගල නාමයන් නොවේ. රටක්, ජාතියක් ලෙස ඉදිරියට යාමට නම් ලෝකයේ අවධානයට පාත්‍ර වන මෙවැනි නවීන නිර්මාණයන් තිබිවිය යුතුය. යුගයේ අවශ්‍යතාවයකට අනුව ඉදිවන අභිනව මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සමගින් අතීත රුහුණේ අභිමානය නැවත ලෝකය ඉදිරියේ විදහාමින වනු ඇති අතර ලෝකයට පහසුකම් සැපයීමට සූදානම් වන රුහුණු දේශය ඉතිහාස පොත් තුළ රන් අකුරින් සටහන් වනු ඇත.



FEATURE

# ගුවන් සේවා සියවස් සැමරුම

## Centenary of Aviation in Sri Lanka

ගුවන් සේවා කර්මාන්තයට සියවසක් සපිරීම නිමිත්තෙන් වූ විශේෂ උත්සවය පසුගිය 2012 දෙසැම්බර් මස 07 වනදා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවැත්විණ.

ගුවන් සේවා කර්මාන්තයට සියවසක් සපිරීම නිමිත්තෙන් වූ විශේෂ උත්සවය පසුගිය 2012 දෙසැම්බර් මස 07 වනදා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න, සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන මහතා ඇතුළු මැති ඇමතිවරුන් රැසක්ද සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය රවීන්ද්‍ර රූපේරු, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති ජෙනරාල් රොහාන් දළුවත්ත, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් හා ප්‍රධාන විධායක නිළධාරී එච් එම් සී නිමල්සිරි, ශ්‍රී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගමේ සභාපති ප්‍රසන්න වික්‍රමසූරිය, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපති නිශාන්ත වික්‍රමසිංහ යන මහත්වරුන් ඇතුළු ආරාධිත අමුත්තන් රැසක් මෙන්ම ගුවන් සේවා කර්මාන්තයට සම්බන්ධ සියළු ආයතන මෙන්ම පාසල් ගුවන් සේවා සමාජ නියෝජනය කරමින් පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් රැසක් ද මෙම ඓතිහාසික අවස්ථාවට සහභාගී විය.

එහිදී ගුවන් සේවා සියවස සැමරීම නිමිත්තෙන් සමරු මුද්දර 04 ක්, කපිතාන් එල්මෝ ජයවර්ධන මහතා විසින් රචිත විශේෂ කෘතියක් ද මෙහිදී එළිදැක්විය. තව ද නිල් අහස ජයගනිමු තේමාව යටතේ වයස් කාණ්ඩ 06 ක් නියෝජනය වන පරිදි පැවැත්වූ දිප ව්‍යාප්ත චිත්‍ර තරගයේ ජයග්‍රාහකයිනට ත්‍යාග ප්‍රදානය ද එහිදී සිදු විය. එහිදී



වැඩසටහන සඳහා ගුවන් සේවා කර්මාන්තය මෙතෙක් පැමිණි ගමන් මග අළලා නිෂ්පාදනය කරන ලද වාර්තාමය වැඩසටහනක් ඇතුළු වර්ණවත් අංග රැසක් ඇතුළත් කර තිබුණි.



එහිදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපනික ඒකකය මගින් රට පුරා දිස්ත්‍රික්ක 18 නියෝජනය කරමින් පිහිටුවා ඇති පාසල් ගුවන් සේවා සමාජ නියෝජනය වන පරිදි භාෂා මාධ්‍ය තුනෙන් අදහස් දැක්වීමේ සුවිශේෂී අවස්ථාවක් ලද අතර එහිදී සිංහල මාධ්‍ය කථාව හම්බන්තොට, තිස්සමහාරාම පාසල් ගුවන් සේවා සමාජයේ සභාපති ටී ජී තෂාමි අරුණෝද්‍යා මෙන්ඩිස් සිසුවා විසින් ද ඉංග්‍රීසි මාධ්‍ය කථාව ගම්පහ, සිරිකුරුස විද්‍යාලයීය ගුවන් සේවා සමාජයේ සභාපති එස් එම් දිල්ෂා එරන්දි සිසුවා විසින් ද සිදුකරන ලද අතර දමිළ මාධ්‍ය කථාව මඩුරන්කුලිය ආදර්ශ මහා විද්‍යාලයීය ගුවන් සේවා සමාජයේ සභාපති, මොහොමඩ් නිල්හාන් සිසුවා විසින් සිදුකරන කරන ලදි.













ගුවන් සේවා සියවස සැමරීම නිමිත්තෙන් සමරු මුද්දර 04 ක්, කපිතාන් එල්මෝ ජයවර්ධන මහතා විසින් රචිත විශේෂ කෘතියක් ද මෙහිදී එළිදැක්වීය. තව ද නිල් අහස ජයගනිමු තේමාව යටතේ වයස් කාණ්ඩ 06 ක් නියෝජනය වන පරිදි පැවැත්වූ දීප ව්‍යාප්ත චිත්‍ර තරගයේ ජයග්‍රාහකයින් හට ත්‍යාග ප්‍රදානය ද එහිදී සිදු විය.

FEATURE



# අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගුවන් සේවා සියවස් සැමරුම් දින කථාව

අද ශ්‍රී ලංකා ගුවන් සේවා කර්මාන්තයට සියවසක් සම්පූර්ණවීමේ උත්සවය තමයි අපි මේ පවත්වන්නෙ. අපේ ප්‍රියංකර ඇමතිතුමා කිව්ව වගේ නියමුවකු සහිත ගුවන් යානයක් මුලින්ම සාර්ථකව ගුවන් ගත කෙරුවෙ රයිට් සහෝදරයො. වැඩි කාලයක් යන්න ඉස්සර ගුවන් යානයක් ලංකාවටත් ගෙනාව. ලංකාවට තමී ඉතින් ගුවන් යානයක් ගෙනාවනම ඒ තරම් පුදුම වෙන්නෙ නැතුව ඇති. මොකද ඒ කාලෙ හිටපු අය අවුරුදු සියයකට උඩදී ඒ ගැන අහල තිබුණ නිසා. ඒ අර ඇමතිතුමනි, ඔබ කිව්ව කතාව රාවණ රජුගෙ දඬුමොනරය ගැන. ඒක අහපු අයට මේක අළුත් දෙයක් වෙන්න බැහැ. කොහොම උනත් ලෝකෙ වගේම ලංකාවෙත් ප්‍රවාහන කටයුතු වල විශාල වෙනස්කම් රාශියක් ගුවන් යානය පැමිණෙවාත් එක්කම සිද්ධ වුනා. ඒක තමයි මිතුවරුනි, ලංකාවට ගුවන් යානා එන්න කලින් අපි රට රට වලට ගියේ නැවෙන්. එදා හුගක් අය නැවෙන් එහාට මෙහාට ගිය නිසා යුරෝපයේ ඉදන් චීනයට නැව් ගියේ සේද මාවතේ තමයි. ඒ සේද මාවතේ තමයි අපි ඉන්නෙත්. නමුත් ගුවන් යානා ජනප්‍රිය වෙන්න වෙන්න මගීන් නැව් වලින් ගමන් යන එක නතර වුනා. හැබැයි එක යුගයක් තිබුණ බොහෝම සුඛෝපභෝගී, හැමෝටම යන්න පුළුවන් දෙයක් නෙවෙයි මේක. සැහෙන කාලෙක් ගියා. දැන් ගණන් බලපුවාම දැන් ඒක තියෙන පහසුම, ලාභම ඉක්මන්ම ක්‍රමය බවට පත්වෙලා තියෙනවා අපේ රටේ. විදේශ ශ්‍රමික ජනතාව මිලියන 02 ට ආසන්න පිරිසක් නැව් එනාකන් බලන් ඉන්නෙ නෑ. ඒ කට්ටිය ඔක්කොම ගුවනින් යන්නෙ. ගුවනින් නොගිය කෙනෙක් අද හොයා ගන්නත් නෑ. මම හිතන්නෙ ගුවන් සේවයටත් විශාල ආදායමක් ලැබෙන්නෙ මේ අයගෙන්.

හාමුදුරුවනේ, ගුවන් යානය ලංකාවට ඇවිත් වසර 100 ක් ගතවුනත් අපේ රට ඒ ක්ෂේත්‍රය විශිෂ්ටත්වයට පත් කරන්න දැන්

තමයි අපි හිතන්න පටන් අරන් තියෙන්නෙ. එදා අපි ගුවන ගැන හිතුවෙ නෑ. අපේ කට්ටිය මුහුද ගැන හිතුවෙත් නෑ. මම හිතනව මේව අපි ඉතිහාසයේ කරපු වැරදි. අපි මේ අනාගත පරපුරට අපි විසින් කරන ලද වැරැද්දක් විදියට තමයි මම දකින්නේ. දේශපාලඥයින් විදියට මුලු රට වටේ මුහුද තිබුණත් අපි මුහුද ජයගන්න හිතුවෙ නෑ. ඒ දවස් වල මුහුදෙ ගියා අපි. නමුත් එදා ඉඳලම ලංකාවෙ විදේශ වෙළඳාම් වාසිය ගත්තෙ හුගක් වෙලාවට අරාබි, චීන ජාතිකයො කියල අපි දැකල තියනව. ඒක තමයි පරංගි, ලන්දේසි සහ ඉංග්‍රීසින් අපේ රට ආක්‍රමණය කරල වාසිය ගත්තෙ. මම හිතන්නෙ එකපාරක් විතරක් අපි ගිහිල්ල මියන්මාරය ආක්‍රමණය කළා. මම පහුගිය දවසෙ බුරුමයට ගිය වෙලාවෙ එහෙ ඉතිහාසයෙ තියෙනවා අපේ අය ගිහිල්ල සමූල ඝාතනය වෙච්ච කතාවක්. එහෙම වුනේ අපි ඒ කාලෙ අහස ගැන හිතපු නැති නිසා. අපිට එක කාලයක් ඇවිල්ල පරිප්පු දානකොටත් අපි උඩ බලාගෙන හිටිය. අහස ජයගන්න අපි හිතල තිබුණ නම් අපේ හිටපු මිතුරයො එහෙම ලේසියෙන් උඩින් ඇවිල්ල පරිප්පු දාන්න බෑ. එදා අපිට දෙවන ලෝක යුද්ධෙදි ජපන්නු ඇවිල්ල කොළඹටත් බෝම්බ දැම්ම. ජපන්නු බෝම්බ දැම්මට කමක් නෑ ඊට පස්සෙ කොටින් ඇවිල්ල බෝම්බ දැම්ම පහුගිය ඊයෙ පෙරේද. ඒ අවුරුදු තුනකට කලින් අපේ ස්වාධීනත්වය නැති වෙලා ගිය හැටි.

අපි එතනින් අපි මේ ගැන හිතන්න කාලය ඇවිල්ලා. අපිට හිතුන ගමන් එකපාරටම හාමුදුරුවනේ විකුණුව අපේ එකම ගුවන් සමාගමයි තිබ්බෙ. ඒ සමාගමත් විකුණුව ජාවාරම් කාරයින්ට. ඒකේ ප්‍රතිඵලය මොකද්ද මට හදිස්සියට, රාජ්‍ය නායකයට ජනාධිපතිවරයා වගෙයන් මට කොළඹට එන්න ඕනෑ වුනාම, එංගලන්තෙත් ඉඳල ගිය ගුවන් යානය ආපහු එන්න ටිකට් දෙන්න බෑ කිව්වා. මේ බලන්න මොන තරම් අපේ ලංකාව, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලොකුවට ගහලා තියෙනවා. එත් ඒකේ රටේ නායකයාට එන්න බෑ. ඕනනම් ඔයාට විතරක් එන්න දෙන්නම් තෝන්නට යන්නත් බෑ. ඒ අය හොඳටම දන්නවා එතකොට යන්නෙත් නැහැ කියල. මේ අපි, මම විඳපු අත්දැකීම්. අපිට එදා යාන්තම් මිහින් ලංකා හදලා තිබුණ හින්දා ඒක එහෙට ගෙන්නගෙන ඒකේ නැගලා තමා මම ආවේ. ඒ නිසා ලංකාවේ මුහුද ගැනත් ඒ වගේම අහස ගැනත් බරලපතල විදිහට හිතන්න ඕනේ. ඒක හිතුව එකම චින්තනය මහින්ද චින්තනය විතරයි. ඒක අපි පැහැදිලිව මහින්ද චින්තනයේ සඳහන් කරලා තියෙනවා නිල් ගුවන ජය ගනිමු කියලා. ගුවන් ක්ෂේත්‍රය ජයගන්න හිතුවේ අපි. ඒක හින්දා තමයි අපි කුණු කොල්ලයට විකුණලා තිබුණ එයාර් ලංකා ගුවන් සමාගම ආණ්ඩුවට ජනතාව අතරට ගත්තේ ආපහු නොදී. ඒක හින්දා තමයි අපි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එක එහෙම තියෙන්නේ. ඒක අද ආදායම් උපයන ආයතනයක් වෙලා.

අපි මහින්ද චින්තනයෙන් සඳහන් කරන පංච මහා ක්ෂේත්‍ර කේන්ද්‍ර වලින් ගුවන් කේන්ද්‍රය විශේෂ තැනක් ගන්නේ. ඒ හින්දා තමයි අපි ජාත්‍යන්තර ගුවන් තොටුපළක් හදලා පහුගිය කාලේ මම හිතන්නේ වසර කීයක් විතර වෙනවද? පනහක් විතර වෙනවා. ඒකත් මම හිතන්නේ සුද්දා හදපු එක මුලින්ම නේද? ඒක අපි ගත්තේ නොවැම්බර් පළවෙනිදා තමයි අපි අපිට ආපහු පවර ගත්තේ ඊට පස්සේ තමයි 63 දී කැනඩාවත් එක්ක සම්බන්ධ වෙලා මේ ගුවන් තොටුපළ වැඩිදියුණු කලේ. බණ්ඩාරනායක මැතිණිය විසින්. මම හිතන්නේ හැබැයි අවුරුදු 50 කට පස්සේ තමයි නව ගුවන් තොටුපළක් හදන්න අපි හිතන්න පටන් ගත්තේ. බලන්න මීට දශක තුන හතරකට කලින් අපි හිතුවනම් කටුනායක වගේම තවත් එකක්

අපි පැහැදිලිව මහින්ද චින්තනයේ සඳහන කරලා තියෙනවා නිල් ගුවන ජය ගනිමු කියලා. ගුවන් ක්ෂේත්‍රය ජයගන්න හිතුවේ අපි. ඒක හින්දා තමයි අපි කුණු කොල්ලයට විකුණලා තිබුණ එයාර් ලංකා ගුවන් සමාගම ආණ්ඩුවට ජනතාව අතරට ගත්තේ ආපහු නොදී. ඒක හින්දා තමයි අපි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එක එහෙම තියෙන්නේ. ඒක අද ආදායම් උපයන ආයතනයක් වෙලා.

මේ රටේ තියෙන්න ඕනේ, හදන්න ඕනේ. කියල හිතලා ඒ සඳහා කටයුතු කළා නම් අපිට මේ සිංගප්පූරුව ගැන ඩුබායි ගැන නෙදර්ලන්තය වගේ රටවල් දැන් ලබාගෙන තියෙන දියුණුව ගැන හුල්ල හුල්ල ඉන්න ඕනේ නැහැ. ඒක අපිටත් ලබා ගන්න පුළුවන්කම තිබුනා. අපේ ඇමතිතුමා කිව්වා මේක මත්තල අපි හැදුව. ඒක ලබන මාර්තු මස වෙනකොට විවෘත කරනවා.

අපි ඒ වගේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ දකුණු ආසියාවේ තියෙන ප්‍රධාන ගුවන් තොටුපළ බවට පත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙල හදන්න ඕනේ. ඒක හදනවා. ඒක දියුණු කල යුතුව තියෙනවා ඒක අපි දියුණු කරනවා. අපි දන්නවා මේ ගුවන් තොටට කොටි ඇවිල්ලා ගැහුවා. එතකොට කිව්වා ලංකාවේ සංචාරය එච්චර හොඳ නෑ කියලා. අනාරක්ෂිතයි කියලා තමයි කිව්වේ. ඒක ලෝකේ

ප්‍රචාරය වුනා. ඒක නමුත් අද වෙද්දි ඒක වෙනස් වෙලා දැන් ජාත්‍යන්තරය වෙන විදියකින් තමයි ඒක දකින්නෙ. මම සංචාරක දැක්ක ලංකාවට දැන් අළුත් තත්වයක් ඇවිල්ලා. එදා අනාරක්ෂිත අපේ එයාර්ලයින් දැන් අනාරක්ෂිතයි කියලා කියන්නෙ නෑ. ආරක්ෂාව හා නිරුපද්‍රිතකාවය අතින් අපි ආසියාවේ පළමුවනි තැනට අපි පත්වෙලා තියෙනවා. මේකට අපි ස්තූතිවන්ත වෙනවා පාලකයින්ට රජයේ අනුග්‍රහය වගකීම අපි නිසි පරිදි ඉටු කරන හින්දා. මේ වගේ කැපවීමකින් දැක්මකින් වැඩ කළොත් ලෝකයේ හොඳම ගුවන් සේවාවන් 10 අතරට යන්නට වැඩි කලක් යන්නේ නෑ කියලයි මම විශ්වාස කරන්නේ.

ඇමතිතුමා කිව්වා වගේ පොළොවේ සිඟවුවලා තියන ගගන භාවික ක්‍රම වලින් ඈත් වෙලා චන්ද්‍රිකා තාක්ෂණයට පිම්මක් අපි පනින්න ඕන. අපි ඒ පිම්ම පනින්න ඕන නම් ගුවන් සේවාව පිළිබඳ දැනුම ඇති විශිෂ්ටයන් බිහි කරන්න ඕන. දරුවනේ, දුවේ, පුතේ, අපි ඒ වගේම තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රය ගැන අවධානය යොමු කරන්න ඕන. මේ අයට එහෙම වුනොත් තමයි අපිට අවශ්‍ය වන මෘදුකාංග ලෝකයට සපයන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා දශක පහක් මේ රටේ ගුවන් සේවය ලබපු ජයග්‍රහණ වලට වඩා පසුගිය අවුරුදු හතේ අපේ උදා කළ ජයග්‍රහණය වැඩියි කියලා අපි විශ්වාස කරනවා. අපි මේ කරන්නෙ වසර දහස් ගණන් අතදැර දමා තිබූ ලෝකයක් ලංකාවට ලඟා කරලා දෙන්න උත්සහ කරන එක. ජාතියක් හැටියට අපි දුප්පත් මානසිකත්වයෙන් මිදෙන්න ඕන. මේක අපි මග හරවමු. පෙන්නන්න ඕන අපි හැම වෙලාවෙම සමහරු අපි දුප්පත් මානසිකත්වයෙන් ඉන්නේ. අපේ ජාතිය ගළවා ගන්න ගුවනේ වගේම සාගරයේ ඇති කරන්න සංවර්ධනය තුළින් පුළුවන්. මේ ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමෙන් අපට පුළුවන් ඒ මානසිකත්වයෙන් මිදෙන්න. අපි අපේ දරුවන්ට මග දෙන්නේ අහසත් සයුරත් දියුණු කරල තමයි. අපි මේ අනාගත පරපුරට මේ රටේ ජනතාවට මේ රට බත් දෙන්නෙ කියන එකත් අපි මතක් කරන්න කැමතියි.

**ඒ වගේම අපේ දරුවො වෛද්‍යවරු, ඉංජිනේරුවො, සුපර්ස්ටාර්ස්ල වෙන්න වගේම දැන් දැන් අහස ජයගන්නත් හිතල තියනවා, හැබැයි අපේ ගම් වල හුඟක් දෙනෙක් දන්නේ නැහැ ගුවන් නියමුවෙක් වෙන්න මොකක්ද කළ යුත්තෙ කියල, මේවා සමහර වෙලාවට අර ඉහළ පැළැන්තියකට නැත්නම් සල්ලි තියන මිනිස්සුන්ට දරුවන්ට විතරක් කියල, ගමේ කොල්ලට, කෙල්ලට වගේම ඒවා කාටත් උරුම කරන්න ඕන. ඒක නිසා මේ තත්වය වෙනස් කරල අපි අපේ රට අපි ආඩම්බර වෙන්න ඕන ඒ කාලෙ ගුවන් හමුදාවෙ ක්‍රියාත්මක වුනේ ගමෙන් ආපු කෙල්ලො, කොල්ලො, උන් ගමෙන් ආපු දරුවො. ඒ නිසා අපේ දරුවන්ටත් මහපොළව වගේ තවත් ලෝකයක් තියන බව පෙන්වන්න ඕන, මේ අහසත් සයුරත් ජයගන්න ඕන. ගුවන් යානා ක්ෂේත්‍රයට ඊළඟ සියවස උදාවෙන්න ඕන අහස ජයගන්න තරුණ දරුවන් පෙරටු කරගෙනයි කියල මා දැඩිසේ විශ්වාස කරනවා. මගේ ප්‍රාර්ථනයත් එයයි. ඔබට සුභ අනාගතයක්.......!**





අතිගරු ජනාධිපති මහින්ද
රාජපක්ෂ මැතිතුමන්ගේ මහින්ද
චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි
ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය
කරා යන ගමනේ ඉතා සුවිශේෂී
සංධිස්ථානයක් වන මත්තල
රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්
තොටුපළ ජනතා අයිතියට පත්
කිරීමේ ජාතික අවස්ථාව වෙනුවෙන්
මෙහිම පසුබිම ගුවන් සේවා සියවස
සම්පූර්ණ කරන ලද කාලසීමාව
සුවිසල් කාර්යභාරයක් ඉටු කළ
සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු
පියංකර ජයරත්න මැතිතුමා
ගුවන්සර වෙත ඒ පිළිබඳ දැක්වූ
අදහස් කිහිපයි මේ.



# මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ

## සංවර්ධනයේ සමතුලිතතාවය බෙදී යාම පිළිබඳ හොඳම නිදසුනයි

## සිවිල් ගුවන් සේවා අමාත්‍ය **ගරු පියංකර ජයරත්න මැතිතුමා**

අපේ බාල පරපුරට රටේ සංවර්ධන කාර්යයේ වගකීම දැනෙන ලෙසට කටයුතු කළ යුතු කාලය ඇවිල්ලා. 1911 ශ්‍රී ලංකාවට ගුවන් යානයක් ගෙන ආ දිනයේ සිට මේ දක්වා ගුවන් සේවා ක්ෂේත්‍රය සීමා වෙලා තිබුණේ එක්තරා පැලැන්තියකට විතරයි. අපේ අතිගරු ජනාධිපතිතුමා එය වෙනස් කරන්න තීරණයක් අරගෙන තියනවා.

සාකච්ඡා කළේ
දේවි **සමරජීව**

### ශ්‍රී ලංකා ගුවන් කර්මාන්තයේ අනාගතය

අපි කුඩා රටක් වුණත්, අපේ රටේ මිනිස්සු අනාදිමත් කාලයක සිට ආශ්චර්යමත් දේ නිර්මාණය කළ අය. මීට වසර දහස් ගණනකට පෙර ලෝකයට හිතා ගන්නවත් බැරි අත්දමේ නිර්මාණයන් වන පරාක්‍රම සමුද්‍රය, ලෝවාමහාපාය, ජේතවනාරාමය, සීගිරිය වැනි නිර්මාණ ලෝකයට දායාද කළ අපි මීට වසර දහස් ගණනකට පෙර දඬුමොනරය ජනප්‍රවාදය තුළින් ගුවන් යානා සංකල්පය පවා අපි නූතන ලෝකයට හඳුන්වාදී තිබෙනවා. ඒත් 1815 දී රට යටත් විජිතයක් බවට පත් වුනාට පස්සේ අපේ මිනිස්සු සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. අවාසනාවකට ඔවුන් විදේශ ගැති පිරිසක් බවට පත්වීම නිසා අප සතුව තිබූ නිදහස් චින්තනය, දේශමාමක බව වගේම ඔවුනම වෙනුවෙන් කළ කාර්යභාරයේ බිඳවැටීමක් අපි දකිනවා. 1815 දී යටත් විජිතයක් වූ පසු අපි දරුණු ලෙස හිරිහැර වලට ලක් වෙනවා. මීට විරුද්ධව 1818 දී ප්‍රථම අරගලය සිදුවෙනවා. එහිදී ඉංග්‍රීසීන් ඉතා දරුණු ලෙස අපව මර්දනයට ලක් කරනවා, ඉන් පසු නැවතත් පීඩාකාරී බදු, මවුබිමේ උරුමය නැතිකිරීමේ මුඩුබිම් පනත හේතුවෙන් 1848 දී ඉතා තිහිසුණු කැරැල්ලක් ඇතිවෙනවා. මේ කරුණු හේතුවෙන් ජාතියක් ලෙස අප සතුව තිබූ අභිමානය, අනභිභවනීයත්වය අහිමිවීම නිසා, 1815 සිට 2009 දක්වාම අප පරාදීන මනසක් සහිතව ජීවත් වුනා කීවොත් නිවැරදියි. නිදහස ලැබුණත් එසේ ලැබූ නාමික නිදහස තුළ අපට යහපත් පාලනයක් ගෙනයන්න හැකි වුනත් විදේශ අනුපෙවීම සහ ත්‍රස්තවාදය හේතුවෙන් අපට ජාතියක් ලෙස නැගී සිටින්නට තිබූ ඉඩ කඩ නැතිව ගියා. ඒත් දැන් අපි නිදහස් ජාතියක්. අපේ බාල පරපුරට රටේ සංවර්ධන කාර්යයේ වගකීම දැනෙන ලෙසට කටයුතු කළ යුතු කාලය ඇවිල්ලා. 1911 ශ්‍රී ලංකාවට ගුවන් යානයක් ගෙන ආ දිනයේ සිට මේ දක්වා ගුවන් සේවා ක්ෂේත්‍රය සීමා වෙලා තිබුණේ එක්තරා පැලැන්තියකට විතරයි. අපේ අතිගරු ජනාධිපතිතුමා එය වෙනස් කරන්න තීරණයක් අරගෙන තියනවා.

මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණක් වන්නේ මත්තල ගුවන් තොටුපළ නිමැවෙන්නේ ලෝකයේ දැනට භාවිතා වන විශාලතම මගී ගුවන් යානය වන එයාර් බස් 380 (A 380) ගුවන් යානා පවා ඉතා පහසුවෙන් ගොඩබැස්සවිය හැකි අයුරින්. එහි ගුවන් ධාවන පථයේ දිග මීටර 3500 වන අතර මීටර් 75 ක පළලකින් යුතුයි. මීට අමතරව එහි ගුවන් ගමන් පාලක කුළුණ මීටර 45 ක් උසකින් යුක්තව නෙළුම් මලක හැඩයකින් යුතුවයි නිර්මාණය වෙන්නෙ. ඒ ජාත්‍යන්තරයට ගමන් කරන අතරේ අපේම අනන්‍යතාවයකුත් රඳවා ගැනීමේ අරමුණින්. මේ හේතූන් නිසා මෙතෙක් කල් ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කළ සුවිසල් ගුවන් යානා වලට ලක් දෙරණේ පහස විඳීමේ අවස්ථාවත් මෙම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආරම්භ කිරීමත් සමග හිමිවෙනවා. මෙහි පළමු අදියරේ දී වසරක මගී ධාරිතාවය වන්නේ මිලියනයක්. එහිදී ගුවන් තොටුපළින් ප්‍රධාන කොටම 60% වෙන් වන්නේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහායි. මේ හේතුව නිසා අනාගතයේ දී වඩා හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම තුළින් බණ්ඩාරනායක ගුවන් තොටුපළේ ඇති වන මගී තදබදයකදී ඉතා පහසුවෙන් අපගේ සේවාවන් ලබාදීමේ අවස්ථාව හිමිවනවා.

**ගුවන් සේවා කර්මාන්තයට වසර 100 සම්පූර්ණ වෙන දවසේ එතුමාගේ මේ ප්‍රකාශය බලන්න.**

අපේ දරුවො වෛද්‍යවරු, ඉංජිනේරුවො, සුපර්ස්ටාර්ස්ල වෙන්න වගේම දැන් දැන් අහස ජයගන්නත් හීනල තියනවා, හැබැයි අපේ ගම් වල හුගක් දෙනෙක් දන්නේ නැහැ ගුවන් නියමුවෙක් වෙන්න මොකද්ද කළ යුත්තෙ කියල, මේවා සමහර වෙලාවට අර ඉහළ සැලැන්තියකට නැත්නම් සල්ලි තියන මිනිස්සුන්ට දරුවන්ට විතරත් කියල, ගමේ කොල්ලට - කෙල්ලට වගේම ඒවා කාටත් උරුම කරන්න ඕන. ඒක නිසා මේ තත්වය වෙනස් කරල අපි අපේ රට අපි ආඩම්බර වෙන්න ඕන ඒ කාලෙ ගුවන් හමුදාවෙ ක්‍රියාත්මක වුනේ ගමෙන් ආපු කෙල්ලො, කොල්ලො, උන් ගමෙන් ආපු දරුවො. ඒ නිසා අපේ දරුවන්ටත් මහපොළව වගේ තවත් ලෝකයක් තියන බව පෙන්වන්න ඕන, මේ අහසත් සයුරත් ජයගන්න ඕන. ගුවන් යානා ක්ෂේත්‍රයට ඊළඟ සියවස උදාවෙන්න ඕන අහස ජයගන්න තරුණ දරුවන් පෙරටු කරගෙනයි කියල මා දැඩිසේ විශ්වාස කරනවා.

(අතිගරු ජනාධිපතිතුමාගේ සියවස් සැමරුම් දේශනය ඇසුරෙනි)

බලන්න මේ ප්‍රකාශය.... කෙතරම් සංවේදීද? කෙතරම් නිහතමානී ද?

මේ නිසයි අපේ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලාංකේය තරුණ පරපුර වෙත දැනුම බෙදන්නට සිවිල් ගුවන් සේවා අධිකාරිය මෙහෙය වන්නේ. මේ වන විටත් එම වැඩසටහන ලංකාවෙ දිස්ත්‍රික්ක 18 පුරා පැතිරිලා තියනවා. මෙම වැඩසටහන 'ගුවන් සේවා ක්ෂේත්‍රයෙන් බිඳක් ශ්‍රී ලාංකේය දරුවනට' කියන තේමාව යටතේ තමයි ක්‍රියාත්මක කෙරෙන්නෙ. එහි ප්‍රතිඵලයක් විදියට දැනට දිවයින පුරා උසස් පෙළ පාසල් තුළ ගුවන් සේවා සමාජ 600 කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවලා ඒ තුළින් ගුවන් සේවා කර්මාන්තය පිළිබඳව දැනුම පිපාසයෙන් පෙළෙන පාසල් දරුවන්ට ඒ පිළිබඳ දැනුම ලබාදීම තමයි මූලිකවම සිදුකරන්නෙ.

මෙක අපි දකින සිහිනයක් නෙවෙයි. ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ඉටුකර ගත හැකි අපේක්ෂාවක් ලෙසයි මා දකින්නේ. ඔවුනට ගුවන් සේවා ක්ෂේත්‍රයට පැමිණීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, ජාත්‍යන්තර භාෂාව හැදෑරීමට අවස්ථාවක් ලබාදීමටත් ඉදිරියේ දී අප බලාපොරොත්තු වෙනවා. අපි නිදහස් ජාතියක් ලෙස ඔළුව උස්සනවට එරෙහිව විවිධ බලවේග ක්‍රියාත්මක වෙනවා. ඒව සුළු පටු ඒවා නොවුනත් ලෝකයේ බොහෝ රටවල් මේ වගේ තත්වයන්ට මුහුණ දීල තියනවා. මේ සඳහා අපේ තරුණ පරපුරට අවශ්‍ය වෙනවා ජාත්‍යන්තර මට්ටමේ අවබෝධයක් ලබා ගන්න අපිට පුළුවන් විදියට ඉඩ පහසුකම් සලසන්න ඕනෑ. ඔවුන්ට ගුවන් සේවා කර්මාන්තය පිළිබඳව දැනුම, අවබෝධය ලබාගන්න අවශ්‍ය පහසුකම් ලබා දුන්නම රටතොටේ ඇවිදල ලෝකයේ සිදු වන දේ පිළිබඳව හෝ ඊළඟ පරම්පරාව දැනුවත් බවක් ලබා ගනීවි. ඒ තුළින් අපේ මවුබිමේ වටිනාකම පිළිබඳවත් දැනගන්නට හැකි වේවි.

මේ සියළු අභියෝග මධ්‍යයේ අපේ ජනාධිපතිතුමන් මත්තල, ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ඉදිකරන්න ගත්ත තීරණය තුළ අපේ තරුණ පරපුරේ දෑස් ඉදිරිපිටම ගුවන් සේවා කර්මාන්තයේ ඇති වටිනාකම දැනෙන්න ගනීවි. ඔවුන් ඒ තුළින් ඵල ප්‍රයෝජන අරගෙන ශක්තිමත්ව ඉදිරියට යාවි යයි මා තරයේ විශ්වාස කරනවා. මෙමම අරමුණු කරා ළඟාවන්න රටේ සංවර්ධන ක්‍රියාදාමය පංච බල කේන්ද්‍රයක් තුළින් ඉටු කර ගැනීමට මහින්ද චින්තනය තුළින් හඳුනාගෙන තියෙන්නෙ ඒකයි.

## පංච බල කේන්ද්‍රය

මේ රට රුදුරු ත්‍රස්තවාදයෙන් නිදහස් කළ ජනාධිපතිතුමා කිව්වා, මම මේ රටේ අයිතිකාරයා නෙවෙයි භාරකාරයා විතරයි කියල. එතුමා ඉන් දෙන පණිවිඩය තමයි මේ රටේ උරුමකරුවන් වූ කෝටි දෙකකට

ආසන්න ජනතාවගේ වගකීම තමයි නැවතත් මේ රට ත්‍රස්තවාදීන්ට හෝ විදෙස් බලවේග වලට ගොදුරු කරගන්නට ඉඩ නොදී රටේ බාලපරපුර වෙනුවෙන් මාතෘභූමිය ආරක්ෂා කොට ගෙන ආශ්චර්යමත් දේශයක් බවට පරිවර්තනය කර ගන්න අවශ්‍ය කටයුතු කරන එක. රට ආශ්චර්යමත් දේශයක් කිරීමේ පංච බල කේන්ද්‍රය ලෙස සැළකෙන දැනුම, වාණිජ, බලශක්ති සහ නාවික යන සිව් කේන්ද්‍රයන් එක් කිරීමේදී ගුවන් කේන්ද්‍රයට පැවරෙන්නේ අතිවිශාල කාර්යභාරයක්. අද ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩි වෙනවා.



ඔවුනට අවශ්‍ය නවීන පහසුකම් සළසා දෙන්න ඕන. අපගේ සේවාවන් වල කාර්යක්ෂමතාව වැඩිකරගන්න ඕන. ඒ සඳහා මුළු ශ්‍රී ලංකාවම එකට යාවෙන පරිදි ගුවන් කර්මාන්තය වැඩි දියුණු කිරීමට අපි පියවර ගන්නවා.

මේ කරුණු සාර්ථක ලෙස ඉටු කිරීමට නම් ඒ හා සමගාමීව රටේ අභ්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය ඉතා වැදගත්. මේ හේතුන් නිසා අපි ජාත්‍යන්තර ගුවන් තොටුපළ පමණක් නොවෙයි රට අභ්‍යන්තර ගුවන් තොටුපළ 10 ක් සංවර්ධනය කිරීමේ කටයුත්ත ආරම්භ කරලයි තියෙන්නෙ. උතුරු නැගෙනහිර ඇතුළුව ඉදිවන මෙම ගුවන් තොටුපළ මගින් දේශීය මෙන්ම විදේශීය සංචාරකයනට සෘජුවම සහ ඉක්මනින් තමන්ගේ ගමනාන්ත වෙත ළඟාවීමේ අවස්ථාව ලැබෙනවා. බොහෝ විදේශිකයින් රට තුළට එන්නේ ඉතා ඉක්මනින් ඔවුන්ගේ ගමනාන්තය වෙත යාමේ අරමුණින්. ඒත් මේ වන විට අපේ මාර්ග පද්ධතියේ තිබෙන යම් යම් අඩුපාඩු නිසා එය තරමක් අපහසු වෙන්න පුළුවන්. නමුත් නවීකරණය වන අභ්‍යන්තර ගුවන් තොටුපළ හේතුවෙන් අම්පාර, නුවරඑළිය, පුත්තලම, යාපනය, මඩකලපුව වගේ ප්‍රදේශ වලට ඉක්මනින්ම ළඟාවීමේ හැකියාව ලැබෙනවා. දැනටමත් මඩකලපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය යන ගුවන් තොටුපළ වල වැඩකටයුතු ආරම්භ කරලා තියනවා. නුවරඑළිය ගුවන් තොටුපළ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා පසුගිය දින වල පෞද්ගලිකවම සොයා බැලුවා. මේ තත්වයන් තුළ අපේ ගුවන් සේවාවම ගුවන් ජාලයක් බවට ගොඩ නැගීම ලංකාවේ ගුවන් කර්මාන්තය ඉදිරියට යාම සඳහාත් අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍රයන් හි ජයග්‍රහණයන්ට හේතු වන්නටත් පුළුවන්. විශේෂයෙන් මේ ක්‍රියාවලිය තුළදී ලන්ඩන් හීත්‍රෝ ගුවන් තොටුපලේ සිට යාපනයටත්, යාපනයේ සිට ලන්ඩන් හීත්‍රෝ ගුවන් තොටුපළ දක්වාත් සෘජුවම ගමන් කළ හැකි පහසුකම් නිර්මාණය වෙනවා.

## දෙවන ගුවන් තොටුපළක අවශ්‍යතාවය

1957 දී ඒ කාලයේ පැවති කටුනායක රාජකීය ගුවන් හමුදා කඳවුර ශ්‍රී ලංකා රජයට භාරදීමෙන් පස්සෙ කැනඩා රජයේ ආධාර යටතේ 1963 වසරේ එය ජාත්‍යන්තර ගුවන් ගමන් කටයුතු වෙනුවෙන් මීටර 1800 ක්ව පැවති ගුවන් ධාවන පථය මීටර් 3300 ක් දක්වා විශාල කිරීම මෙන්ම ගුවන් තොටුපළේ මගී පර්යන්තය එවකදී මගී ලක්ෂ 1.5 පමණ හැසිරවිය හැකි පරිදි සකස් කරල එය ජාත්‍යන්තර කටයුතු සඳහා විවෘත කරන්නෙ 1968 වසරේ. ඒ කාලයේ ලක්ෂ 1.5 තිබූ මගී හැසිරවීමේ ධාරිතාවය මේ වන විට මිලියන 07 ඉක්මවා තිබීම නිසා තවත් ගුවන් තොටුපළ අවශ්‍යතාවය මෙන්ම කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපළේ දෙවන අදියරේ කටයුතු ආරම්භ කිරීමටත් මේ වන විට කටයුතු සූදානම් කර තිබෙනවා. බලන්න මේ තොරතුරු දිහා.

මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණක් වන්නේ මත්තල ගුවන් තොටුපළ නිමැවෙන්නේ ලෝකයේ දැනට භාවිතා වන විශාලතම මගී ගුවන් යානය වන එයාර් බස් 380 (A 380) ගුවන් යානා පවා ඉතා පහසුවෙන් ගොඩබෑස්සවිය හැකි අයුරින්. එහි ගුවන් ධාවන පථයේ දිග මීටර 3500 වන අතර මීටර් 75 ක පළලකින් යුතුයි. මීට අමතරව එහි ගුවන් ගමන් පාලන කුළුණ මීටර 45 ක් උසකින් යුක්තව නෙළුම් මලක හැඩයකින් යුතුවයි නිර්මාණය වෙන්නෙ. ඒ ජාත්‍යන්තරයට ගමන් කරන අතරේ අපේම අනන්‍යතාවයකුත් රඳවා ගැනීමේ අරමුණින්. මේ හේතුන් නිසා මෙතෙක් කල් ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කළ සුවිසල් ගුවන් යානා වලට ලක් දෙරණේ පහස විඳීමේ අවස්ථාවත් මෙම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආරම්භ කිරීමත් සමග හිමිවෙනවා. මෙහි පළමු අදියරේ දී වසරක මගී ධාරිතාවය වන්නේ

මිලියනයක්. එහිදී ගුවන් තොටුපළින් ප්‍රධාන කොටම 60% වෙන් වන්නේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහායි. මේ හේතුව නිසා අනාගතයේ දී වඩා හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම තුළින් බණ්ඩාරනායක ගුවන් තොටුපළේ ඇති වන මඟී තදබදයකදී ඉතා පහසුවෙන් අපගේ සේවාවන් ලබාදීමේ අවස්ථාව හිමිවනවා.

### සංවර්ධනයේ සමතුලිතතාවය

මෙතුවක් කාලයකට අගනුවර කේන්ද්‍ර කර ගනිමින් බස්නාහිර පළාතට පමණක් සීමාව තිබූ සංවර්ධන ක්‍රියාදාමය රට අභ්‍යන්තරයට නිසි පරිදි ගලා යාමක් සිදු වුණේ නැහැ. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත්වීමත් සමග මේ පිළිබඳ විශේෂ සැළකිල්ලක් දක්වා එම සංවර්ධන ක්‍රියාදාමය ඈත ගම් දනව් වෙත රැගෙන යාමට නිසි වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා හොඳම උදාහරණය තමයි මේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ. මෙමගින් ඇති වන වාසි ගැන කතා කළොත් විශාල මෙන්ම කුඩා පරිමාණයේ හෝටල් ඇතිවීම, වෙළඳ කලාප ඇතිවීම මෙන්ම ඒ හා සම්බන්ධ අනෙකුත් සේවාවන් මෙන්ම එම ප්‍රදේශයේ යටිතල පහසුකම් ශීඝ්‍ර දියුණුවකට ලක් වීම සහ ඒ ආශ්‍රිත සෘජු සහ වක්‍ර රැකියා අවස්ථා රාශියක් ඇති වීම සළකන්න පුළුවන්.

මෙතුවක් කාලයකට අගනුවර කේන්ද්‍ර කර ගනිමින් බස්නාහිර පළාතට පමණක් සීමාව තිබූ සංවර්ධන ක්‍රියාදාමය රට අභ්‍යන්තරයට නිසි පරිදි ගලා යාමක් සිදු වුණේ නැහැ. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත්වීමත් සමග මේ පිළිබඳ විශේෂ සැළකිල්ලක් දක්වා එම සංවර්ධන ක්‍රියාදාමය ඈත ගම් දනව් වෙත රැගෙන යාමට නිසි වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා හොඳම උදාහරණය තමයි මේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ. මෙමගින් ඇති වන වාසි ගැන කතා කළොත් විශාල මෙන්ම කුඩා පරිමාණයේ හෝටල් ඇතිවීම, වෙළඳ කලාප ඇතිවීම මෙන්ම ඒ හා සම්බන්ධ අනෙකුත් සේවාවන් මෙන්ම එම ප්‍රදේශයේ යටිතල පහසුකම් ශීඝ්‍ර දියුණුවකට ලක් වීම සහ ඒ ආශ්‍රිත සෘජු සහ වක්‍ර රැකියා අවස්ථා රාශියක් ඇති වීම සළකන්න පුළුවන්.

### භාණ්ඩ අපනයනයට අවස්ථාව ලැබීම

ඇත්තටම මේ මැත වකවානුවේදි අපි දකුණ, ඌව සහ නැගෙනහිර යන පළාත් නම් කළේ දුෂ්කර පළාත් කියල. ඒත් මෙම ගුවන් තොටුපළ ඉදිවීමත් සමගින් සංචාරක කර්මාන්තය එම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්ත වීම, සෘජුව භාණ්ඩ අපනයනය සඳහා අවස්ථාව හිමිවීම වගේම සංචාරකයින් සමගත් සෘජුව ගණු දෙනු කිරීමට අවස්ථාව ලැබීම මගින් පවතින දුෂ්කරතාවයන් අවම වෙලා ඒ ප්‍රදේශ වලට ජාතික ආදායමට පවා දායකත්වයක් ලබාදීමටත් අවස්ථාවක් ලැබේවි යයි මා විශ්වාස කරනවා. එහිදී ඒ ප්‍රදේශ වලට ආවේණික කිරි, නැටුම් කලාව, මල්, එළවලු සහ පළතුරු වැනි දේ පහසුවෙන් අපනයනය කිරීමේ අවස්ථාවන් වගේ අවස්ථාවන් ප්‍රදේශයේ දියුණුවත් එක්කම ලැබේවි. ඒවගේම ආරුගම්බේ දක්වා දිවෙන දියුණු මාර්ග පද්ධතිය භාවිත කරමින් එම ප්‍රදේශ වල ජනතාවගේ නිෂ්පාදනයන් පහසුවෙන් මත්තල ගුවන් තොටුපළ හරහා ජාත්‍යන්තර වෙළඳපොළට යොමු කිරීමට හැකියාවක් පවතිනවා. ඒ තුළින් ඉදිරියේ දී ඔවුන්ගේ ආර්ථික තත්වයන් පවා පෙරට වඩා ස්ථාවර වේවි.

**2002 සිට 2012 දක්වා ජාත්‍යන්තර ගුවන් මඟී මෙහෙයුම්**

Passenger and Cargo Movements for 2002 to 2012 by International Airlines

| Year | ගුවන් මඟීන් (Passengers) | | |
|---|---|---|---|
| | Uplifted | Discharged | Total |
| 2002 | 1,350,662 | 1,331,285 | 2,681,947 |
| 2003 | 1,630,292 | 1,602,470 | 3,232,762 |
| 2004 | 2,015,328 | 2,063,146 | 4,078,474 |
| 2005 | 2,133,413 | 2,105,748 | 4,239,161 |
| 2006 | 2,310,264 | 2,275,516 | 4,585,780 |
| 2007 | 2,442,332 | 2,398,666 | 4,840,998 |
| 2008 | 2,268,763 | 2,193,917 | 4,462,680 |
| 2009 | 2,136,055 | 2,100,361 | 4,236,416 |
| 2010 | 2,657,532 | 2,609,237 | 5,266,769 |
| 2011 | 3,101,915 | 3,085,768 | 6,187,683 |
| 2012 | 3,590,122 | 3,554,969 | 7,145,091 |

1912 ආරම්භ වූ ගුවන් සේවා කර්මාන්තය වසර 100 සම්පූර්ණ කරන මේ මොහොතේ ශ්‍රී ලංකාව ගුවන් සේවාවේ සංධිස්ථානයක් බවට පත්වෙමින් තියනවා. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමන් සතු නිවැරදි දැක්ම සහ දේශමාමක හැඟීම ඉවහල් වෙලා තියන බවයි මා කියන්න කැමතියි. අද මේ රට සියළුම ජාතීන්ගේ ශක්තියෙන් ගොඩ නැගෙන රටක් බවට පත් වෙමින් තියනවා. අවසන් වශයෙන් ඊළඟ පරපුරේ උරුමය වෙනුවෙන් සියළු භේද පසෙකලා ජනාධිපතිතුමන් වටා රොක් වෙමු කියන ඉල්ලීම මේ මොහොතේ දී සිහිපත් කිරීමටත් මා කැමතියි.

FEATURE



# රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ

## ඓතිහාසික සේද මාවතේ පිහිටි මත්තල මහා තැනිතලාවේ නවීන කේන්ද්‍රස්ථානයයි

**Rajapaksa International Airport** at Mattala is the modern hub on the ancient Silk Route

සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය
**ගීතාංජන ගුණවර්ධන මැතිතුමා**
Hon. Gitanjana Gunawardena,
Deputy Minister of CivilAviation

සාකච්ඡා කළේ
දේවී **සමරජීව**

ශ්‍රී ලංකා ගුවන් සේවාවේ සියවස් සැමරුම මෙන්ම රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ආරම්භය මත්තල දී සිදුවන මෙම කාල සීමාව සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට ඉතා කාර්ය බහුල අවධියකි. එහිදී සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමන්ට මෙන්ම නියෝජ්‍ය අමාත්‍යතුමන්ට ද ඒ වෙනුවෙන් පැවරෙන කාර්යභාරය අති විශාලය. කෙතරම් කාර්යය බහුල අවස්ථාවක් වුවද ගුවන්සර අප විසින් සිදු කළ ඉල්ලීම ඉවත නොදැමූ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමන් සංවාදයක් වෙනුවෙන් අප වෙත කාලය ලබා දුන්නේ ගුවන්සර පාඨකයින් බහුතරයක් වන පාසල් සිසුන් වෙනුවෙන් එතුමාගේ ඇති දැඩි කැමැත්ත හේතුවෙනි. අපගේ ඉල්ලීමට නිහතමානීව සවන් දුන් සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමන්ට අපගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර එතුමන් විසින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ ශ්‍රී ලංකාවේ වර්තමාන ගුවන් සේවා කර්මාන්තය පිළිබඳ ගුවන්සර සමග කළ සංවාදයකි මේ.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඉන්දියානු සාගරයෙන් වටවුණු රටක් ලෙස ශ්‍රී ලංකාවේ පිහිටීම වැදගත් වන්නේ කෙසේද කියා පැහැදිලි කිරීමක් කළොත්....?**

පළමුව කියන්න කැමතියි.. ශ්‍රී ලංකාව දිවයිනක් ලෙස ආසියාවේ කේන්ද්‍රයව පිහිටීම නිසා තමයි ලෝකයේ අවධානයට ලක් වෙන්නේ සහ ලෝකය සමග සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණේ. ඓතිහාසික කරුණු අරගෙන බැලුවත් ඒක එහෙමයි. අපේ රට බුදුන් වහන්සේ තෙවරක් වැඩම කරපු දිවයිනක්.. ඒවගේම මහින්දාගමනය සමඟ බුද්ධාගමින් අපේ සංස්කෘතිය, සාරධර්ම හා සිතුවිලි පෝෂණය වුණා. ඒක අපේ රටට [illegible] අවධානයට පාත්‍ර වීම වාසනාවක්.. විශේෂයෙන් ඓතිහාසික සේද මාවතේ කේන්ද්‍රස්ථානය වී තිබීම අපේ [illegible] මාවතේ ගමන් කරපු [illegible] අපගේ අවධානයට ලක් වුණා. අනෙක් අතින් ද කේන්ද්‍රීය පිහිටීම අභියෝගාත්මකයි.. මොකද [illegible]



1956 මහජන එක්සත් පෙරමුණු රජයේ අග්‍රාමාත්‍ය, අත්තනගල්ල පාර්ලිමේන්තු මන්ත්‍රී, එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මැතිතුමා, ආහාර හා සමූපකාර අමාත්‍ය අවිස්සාවේල්ල පාර්ලිමේන්තු මන්ත්‍රී, පිලිප් ගුණවර්ධන, ඉඩම් අමාත්‍ය, බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රී, ඩී ඒ රාජපක්ෂ මැතිතුමා, වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍ය, තිස්සමහාරාම පාර්ලිමේන්තු මන්ත්‍රී, ලක්ෂ්මන් රාජපක්ෂ මැතිතුමා ඇතුළු 56 නියමුවන් රුහුණේ උඩවළව ජල යෝජනා ක්‍රමයේ ආරම්භය වූ වක්‍රිකා වාන ඉදිකිරීම් ආරම්භ කරන අවස්ථාවට සහභාගී වූ මොහොත.

දෙන්න සිදු වෙනවා, ඒත් එවැනි බලපෑම් වලට මුහුණදීල ජය අරගෙන තියන බවත් මතක් කරන්න කැමතියි.

### ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග සඳහා රුහුණේ දායකත්වය...?

ක්‍රි.පූ.161 සිට 137 දක්වා අනුරාධපුරයේ රජකළ දුටුගැමුණු රජතුමන් දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන්ට එරෙහිව සිදු කළ සටන් මගින් රට එක්සේසත් කළා එසේම බුදු දහමේ චිරස්ථිතිය වෙනුවෙන් මහගු සේවයක් ඉටු කළා. විශේෂයෙන්ම එකල රුහුණ කිව්වෙ දකුණු ප්‍රදේශයටම පමණක් නොවෙයි නැගෙනහිරින් ත්‍රිකුණාමලය දක්වා භූමිය. ඌව වෙල්ලස්ස, හම්බන්තොට, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්ක සහ සබරගමුව පළාතත් සමගයි. ඉන්පසුවත් රුහුණෙන් බිහිව දියත් කල යුධ ක්‍රියාදාමය තුලින් විදේශ පාලකයන් පලවා විජයබාහු රජතුමන් රට එක්සේසත් කරමින් රටේ ස්වාධීනත්වය, සංස්කෘතිය රැකගන්න මහා කාර්යභාරයක් ඉෂ්ට කළා. රට සංවර්ධනය කළා. එසේම බටහිර යටත් විජිතවාදයට එරෙහිව සටන් වැදුණු වීර රජවරුවන්ට ද අපේ ගෞරවය හිමිවිය යුතුයි.

පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍යයන් විසින් අවුරුදු 400කට වැඩි කාලයක් කළ ආක්‍රමණයන් හා අවසානයේ පාලනය කළ හිරු නොබසින අධිරාජ්‍යයෙන් අපේ නිදහස දිනා ගැනීම සඳහා වූ සටන්වල අවසාන කාලය අප සිහිපත් කළ යුතුයි. 1930 දශකයේ සූරිය මල් ව්‍යාපාරයෙන් ආරම්භව දියත් කළ අධිරාජ්‍ය විරෝධී අරගලයේ වමේ ප්‍රගතිශීලී නායකයන් වූ පිලිප් ගුණවර්ධන මැතිතුමා, එන්.එම්. පෙරේරා මැතිතුමා, දොස්තර වික්‍රමසිංහ මැතිතුමා වැනි නායකයන් සමග රුහුණට නායකත්වය ලබාදුන් ඩී.එම්. රාජපක්ෂ මැතිතුමා හා ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමන් ද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ හා ඉන් පිටතත් සිට එම ව්‍යාපාරයට ඔවුන් ලබාදුන් ශක්තිය 1948 නිදහස ලබාගැනීමට එම නිදහස අර්ථවත් කිරීමටත් ඔවුන් කළ කැපවීම ඉතිහාසයේ රන් අකුරින් සටහන්වී තිබෙනවා.

### ගරු නියෝජ්‍ය ඇමතිතුමනි රුහුණට හා ඌව වෙල්ලස්සටවූ අසාධාරණය වෙනුවෙන් සාධාරණයක් ඉටුවෙමින් තිබෙනවා ද...?

විශේෂයෙන් 1818 කැරැල්ල මැඩපැවැත්වීමට බ්‍රිතාන්‍ය පාලනය ගම් නියම්ගම් ගිනිබත් කරමින් පමණක් නොවෙයි තරුණ ජීවිත හා වැඩ කරන්නට පුලුවන් වැඩිහිටියන් අවුරුදු 17න් ඉහළ පුරවැසියන් ඝාතනය කරමින් සිදුකළ ජන සංහාරයත් වැව් අමුණු හා වාරි ශිෂ්ටාචාරය විනාශ කරමින් සිදුකළ හානියත් නිසා සශ්‍රීක වෙල්යායවල් වලින් සමන්විත ඌව වෙල්ලස්ස වියළි මුඩුබිමක් බවට පත්වුණා. ඉඩම් කුණු කොල්ලයට සවරාගත් ඔවුන් එදා තිබූ ගම්මාන කැළයට පිවිදුන්නා, මත්තල වැනි ගම්මාන සර්පශ ගම්මාන බවට පත්වුණා. බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකළ මෙම පීඩනය උඩරට ගැමි කොමිසන් සභා වාර්තාවෙන් (1951) පවා හෙළිවී තිබුණා. එසේම 1840 අංක 12 දරණ රාජ්‍ය ඉඩම් ආඥා පනත, 1856 විහාර දේවාල ගම් පනත, 1897 කැලෑ හා මුඩුබිම් ඉඩම් ආඥා පනත, 1927 අංක

FEATURE

> එදා සිට අද වන තුරු අපට තිබුණෙ එක ජාත්‍යන්තර ගුවන් තොටුපළයි. විකල්ප තිබුණේ නැහැ. හදිසි තත්වයක දී කටුනායකට ගොඩබස්වන්නට බැරි ජාත්‍යන්තර ගුවන් යානා ඉන්දියාව කරා පියාසර කරන්න උපදෙස් දෙන්න සිදුවුණා. එම අඩුව පුරවමින් තමයි රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ බිහිවෙන්නෙ.

08 දරණ මුඩුබිම් පනත යන පනත් හරහා ද ඔවුන් උඩරට, ඌව වෙල්ලස්සේ හා රුහුණේ ජනතාවගේ ඉඩම් අත්පත් කරගත්තා. එසේම එම ප්‍රදේශ මැලේරියාව, වසූරිය වැනි වසංගත රෝග තුළින් තවදුරටත් පරිහානියට පත්ව ජනගහණයෙන් හීන ප්‍රදේශ බවට ද පත්වුණා.

ඌව වෙල්ලස්සේ සිදු කළ ගම්බිම් විනාශ කිරීම හේතුවෙන් වුනේ අපගේ වාපි සංස්කෘතිය කඩාවුරු කළ කෘෂිකර්මාන්තය විනාශ වීමයි. ඔවුන්ට අවශ්‍ය වුණේත් අපේ පාරම්පරික කෘෂිකර්මාන්තය විනාශ කොට ඔවුන්ගේ තිරිබෝග වගාවට අපේ ජනතාව යොමු කරවන්න. එහිදී අපට වුනේ ඔවුනට ණයගැති වී විදේශ වෙළඳ පොලට අවශ්‍ය බෝගයන් අපේ රටේ වගා කරන්න. නමුත් පෘතුගීසීන්ට එරෙහිව සීතාවකින් ආරම්භ වුණු සටන් සහ කන්ද උඩරටින් ඉදිරියට ගිය සටන් ජාතික අභිමානය ජනතාව තුළ අවධි කලා. අපේ නිදහස, ස්වාධීනත්වය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් කළා. එයින් අපේ රටේ බුද්ධධර්මත්, සාරධර්මත්, සංස්කෘතියත් ආරක්ෂා කර ගන්නට ස්වාමීන්වහන්සේලා ප්‍රධාන ජාතික නායකයන් පෙරමුණ ගත්තා.

මෙම ඓතිහාසික අසාධාරණය නිවැරදි කිරීමට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගත් තවත් වැදගත් පියවරක් ලෙස රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම ඉතිහාසයට එක්වනවා.

**1956 ඇතිවූ පුනරුදය මෙරට සංවර්ධනයට කළ සාධනීය බලපෑම ගැන ඔබේ අදහස...**

1948 අප නාමික නිදහස ලද නමුත් බ්‍රිතාන්‍යයන් විසින් අපේ රටේ ආර්ථිකය, වෙළඳාම හා ආරක්ෂාව තවදුරටත් ඔවුන්ගේ ග්‍රහණයේ පවත්වා ගත්තා. ඒ තුළ අපේ නිදහස් සිතුවිලිවලට, අපේ සංස්කෘතික හා දේශපාලන ඉදිරි ගමනකට වැට බැඳලයි තිබුණේ. මේ ප්‍රශ්නයන් ගැලවීම සඳහා එදා සංඝ, වෙද, ගුරු, ගොවි, කම්කරු පංච මහා බලවේගය පෙළගැස්වීමට හා අපේ නිදහස අර්ථවත් කරගැනීමට 1956 මහා පෙරළියේ නායකයන්ට හැකිවුණා.
නිදහසින් පසුව වුනේ ඔවුන් ලන්ඩනයේ සිට අපේ ආර්ථිකය පාලනය කිරීම මිසක් අපට පූර්ණ නිදහසක් තිබුණේ නැහැ. කටුනායක ගුවන් තොටුපළ පවා ඔවුනට යටත්වයි පාලනය කලේ. මේවාට එරෙහිව බලවේගයක් කැලණි මිටියාවතෙන් හා වළවේ ගංමිටියාවතෙන් එක්වුණා. 1956 පංච මහා බලවේගයේ ජයග්‍රහණය (56 පෙරළිය) සිදුවෙන්නේ එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමා, පිලිප් ගුණවර්ධන මැතිතුමා සහ ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා ඇතුළු ප්‍රගතිශීලී නායකයන්ගේ පුරෝගාමීත්වයෙන්. මෙම කාලයේ දී ශ්‍රී ලංකාව දිවයිනක් ලෙස ලද ප්‍රධාන ජයග්‍රහණ අතුරින් කොළඹ වරාය ජනසතු කිරීම සහ කටුනායක ගුවන් තොටුපළ අත් පත් කර ගැනීම ඉතා වැදගත්ය. අපිට අපි විසින් කළමනාය වන ආර්ථික මර්මස්ථාන ලැබුණා. විදේශ වෙළඳාම අපේ අදයක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබුණා. අපට අපේ මවුබස රජකරමින් නිදහසේ අපගෙන් සිතන්නට අවස්ථාව ලබාගත්තා. පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන වල මේ කාලයේ සිදුවූ වේගවත් පරිවර්තනයන් විශේෂ වන අතර 1956 කාලයේ තැබූ තවත් දැවැන්ත පියවරක් තමයි ස්වභාෂා අධ්‍යාපනය පාසලේ සිට විශ්ව විද්‍යාල උපාධිය දක්වා එකම ඉතිමගක් බවට පත්කිරීම. ඒ ස්වභාෂා අධ්‍යාපනයෙන් මතුවුණු උගතුන් බුද්ධිමතුන් 56 දරුවන් ලෙස අපේ ස්වාධීනත්වය හා නිදහස හා බැඳුණු සාරධර්මවල සංස්කෘතිමය හා ආගමික දේශපාලන වෙනසකට මුලපුරා තිබෙනවා. ඒවාට බාධා ඇතිවෙලා තිබෙනවා. එදත් බාධා තිබුණා. නමුත් ඒවා මැඩගෙන අප ඉදිරියට යන්න අවශ්‍යයි.

**ශ්‍රී ලංකා ගුවන් තලය අධිරාජ්‍යවාදීන් ගෙන් නිදහස් කර ගැනීම පිළිබඳව ඔබතුමාගේ මතකය අවධි කළොත්....**

ගුවන් ක්ෂේත්‍රයට 56 යුගයේ කළ සාධනීය බලපෑම වන්නේ එවකට බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාව (British Royal Airforce) සතුව තිබූ කටුනායක ගුවන් තොටුපළ 1958 නොවැම්බර් 01 වනදා අත්පත් කරගෙන අපේ ගුවන් තොටුපළක් බවට පත්විමයි. ඉන්පසු නිදහසේ ගුවනේ ගමන් කිරීම මෙන්ම ජාත්‍යන්තර ගුවන් ගමන්වල ශ්‍රී ලාංකික ආරම්භය ද සනිටුහන් වෙන්නෙ ඒ කාලයේදී යි. 1968 දී කටුනායක ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා එකතු වන අතරේ 1970 වසර වන විට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෙස නම් කෙරුනා.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදි කිරීමේ පසුබිම ඔබතුමා පැහැදිලි කළොත්...?**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අපේ රටේ අවුරුදු 30ක් පැවති ත්‍රස්තවාදය අවසන් කරාධින් පස්සෙ අවශ්‍යතාවය වුනේ රට ගොඩනගමින් සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්නෙ කොහොමද කියන එකයි. එහි ප්‍රතිඵලය උතුරු හා නැගෙනහිර සංවර්ධනය මෙන්ම එදා සුදු අධිරාජ්‍යවාදීන් විසින් විනාශ කළ කෘෂි ආර්ථිකය ගොඩනගමින් නැවත ඒ ප්‍රදේශ පෙරඅපරදිග යාකරන ශේද මාවතේ රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ඉදිකර එම ගම්මාන හා නිෂ්පාදනයන්ට වෙළඳපොළට සම්බන්ද කිරීම එදා අපට අහිමිවුනු අපේ සංවර්ධන වැඩ පිළිවෙළ නැවත ආරම්භ කිරීමක්.
එදා සිට අද වන තුරු අපට තිබුණේ එක ජාත්‍යන්තර ගුවන් තොටුපළයි. විකල්ප තිබුණේ නැහැ. හදිසි තත්වයක දී

කටුනායකට කෙටඩඹස්වන්නට බැරි ජාත්‍යන්තර ගුවන් යානා මත්තලට හරවා යැවීමට උපදෙස් දෙන්න සිදුවුණා. එම අඩුව පුරවමින් තමයි රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ බිහිවෙන්නෙ. මේම ගුවන් තොටුපළ සමස්ත ආර්ථිකයටත්, සංවර්ධන ක්‍රියාදාමයටත් විශාල පිටුවහලක්. එය ඌව, නැගෙනහිර, කන්ද උඩරට සහ සබරගමුව යන පළාත් වල පිහිටි දිස්ත්‍රික්ක ගණනාවක් මධ්‍යයේ තමයි පිහිටා තියෙන්නෙ. විශේෂයෙන් ම සඳහන් කරන්න ඕන, ඌව වෙල්ලස්ස සටනින් පසුව දැඩි පරිහානියකට පත්ව වනාන්තර විසින් ගිල ගෙන තිබූ අපේ ප්‍රදේශ හා ගම්මාන මෙම සංවර්ධනය මෙමඟින් එළියට ඇදගෙන විත් තියෙනවා කියා.

මෙවැනි සංවර්ධන ක්‍රියාවන් රුපියල් ශත වලින් තක්සේරු කරන්න බැහැ. මෙවාගේ වටිනාකම ගිණුම් වාර්තා වලට සීමා කරන්න බැහැ. ඒක අපි සියලු දෙනාම සැලකිල්ලට අවබෝධ කර ගත යුතු කාරණයක්. 1958 වසරේ සිදුවූ බස් ජනසතු කිරීම මෙයට හොඳ උදාහරණයක්. ඒවායේ වටිනාකම මුදල් වලින් තක්සේරු කරන්න බැහැ. අදටත් පාරේ රතු පාටට අපි දකින එවැනි බස් රථවලින් සාමාන්‍ය ජනතාවට සිදුකළ අවුරුදු 50කට වැඩි සේවය අපට සිහියට එනවා. ජනජීවිතයේ ගුණාත්මක බවට පවුල්වලට, තරුණයන්ට, සිසුයන්ට, රාජ්‍ය සේවකයන්ට, කාන්තාවන්ට, වැඩිමහල් ජනතාවට, රෝගී ජනතාවට ශ්‍රී ලංගමය සිදුකළ සේවය මිල කළ නොහැකියි. අවසානාවට ප්‍රයෝගිකව නොසිතා අපට උපදෙස් දෙන ආර්ථික

> විශේෂයෙන්ම මත්තල කියන්නෙ අපටම ආවේණික නිරසාර සංවර්ධන පරිසර හිතකාමී ව්‍යාපෘතියක්. පසුගිය වසරේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ විසින් මෙහෙය වන ලද මගීන් සංඛ්‍යාව මිලියන 6 ඉක්මවා ගියා. එය 2020 වන විට තෙගුණයක් බවට පත් වේවි. රාජපක්ෂ ගුවන් ජාත්‍යන්තර තොටුපළේ ප්‍රථම අදියරේදී මගී ධාරිතාවය මිලියනයක් නමුත් එහි දෙවන අදියරේදී එය දෙගුණයකින් වැඩිවනවා. එහිදී රටට පැමිණෙන මගීන්ට ගැටළුවකින් තොරව පහසුකම් සලසන්නට හැකිවෙනවා.

විශේෂඥයින් සහ ණය දෙන ආයතන මේවා රුපියල් වලින් තමයි ගණන් බලන්නේ. එයින් පොදු මහජනතාවට සිදුවන මහා සේවය තක්සේරු කරන්නේ නැහැ. ඒ කාලයේ ආරම්භ කරන ලද විවිධ සේවා සමූපාකාර, මහජන බැංකුව, කුඹුරු පනත හා කෘෂිකාර්මික සංවර්ධනය, ධීවර කර්මාන්තයේ නවීකරණය, රාජ්‍ය කර්මාන්තවල නායකත්වයෙන් ඇති කළ කාර්මීකරණය ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට හා ඔවුන් ණයගැතිභාවයෙන් මුදවා ගැනීමටත් රුහුණේ හම්බන්තොට වැනි දිස්ත්‍රික්කවලට සංවර්ධනයේ ප්‍රතිලාභ එම ගම්වලට ගලායාමටත් අවස්ථාව සකස්වුණා. රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා මෙයයි ලෝකයාට ලබා දිය යුතු පණිවිඩය. එදා බස්නාහිර පළාතට සීමාවුනු සංවර්ධනය අද මුළු රටටම ගෙනයන සංවර්ධනයේ පණිවුඩය මානුෂික මෙහෙයුමෙන් දිනාගත් සාමයේ ප්‍රතිලාභ සියලු ජනකොටස්වල දියුණුවට ගලායන බවයි ජිනීවා නගරයට එක්වන ලෝක නියෝජිතයන්ට අද අප ලබා දෙන පණිවිඩයයි.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, සංචාරක ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් රාජපක්ෂ ගුවන් තොටුපළේ දායකත්වය කෙසේ වේවිද...?**

විශේෂයෙන්ම මත්තල කියන්නෙ අපටම ආවේණික නිරසාර සංවර්ධන පරිසර හිතකාමී ව්‍යාපෘතියක්. පසුගිය වසරේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ විසින් මෙහෙය වන ලද මගීන් සංඛ්‍යාව මිලියන 6 ඉක්මවා ගියා. එය 2020 වන විට තෙගුණයක් බවට පත් වේවි. රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ප්‍රථම අදියරේදී මගී ධාරිතාවය මිලියනයක් නමුත් එහි දෙවන අදියරේදී එය දෙගුණයකින් වැඩිවනවා. එහිදී රටට පැමිණෙන මගීන්ට ගැටළුවකින් තොරව පහසුකම් සලසන්නට හැකිවෙනවා.
එසේම රටපුරා දියුණු වන මාගී පද්ධතිය සමඟ හම්බන්තොට සිට කඳුරටට හා උතුරු ප්‍රදේශයට, බෙන්තොට, රුමස්සල, උණවටුන, වැනි සුන්දර මුහුදු තීරයන් ද, කන්නෙලිය, සිංහරාජ කැලේ, කොට්ටව, නුවරඑළිය, කොස්ගල, මඩොල්දූව,



ගරු අමාත්‍යතුමා මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින්.

FEATURE

FEATURE



ගුවන් පාලන මධ්‍යස්ථානය අමාත්‍යතුමාගේ නිරීක්ෂණයට

යාල, කුම්න, උඩවලවේ සහ වස්ගමුව වැනි පාරිසරික වටිනාකමක් ඇති ස්ථාන ද කිරිවෙහෙර, ගාලු කොටුව, මුල්කිරිගල විහාරස්ථානය වැනි ඓතිහාසික ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට ද නැගෙනහිර හා දකුණු වෙළ තීරයන්ට ගමන් කිරීමට පැමිණෙන සංචාරකයන්ට ද මෙම ගුවන් [illegible] ආකර්ෂණීය අත්දැකීමක් වනවාට සැකයක් නැහැ.
සුනාමි ව්‍යසනයෙන් පස්සේ අපේ රටේ ආරම්භ කරපු දැවැන්ත ව්‍යාපෘතීන් 2 ක් තමයි මේ රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය. ඊට අමතරව ජාත්‍යන්තර මට්ටමේ මාර්ග පද්ධති, ක්‍රීඩාංගණ, හෝටල ය පහසුකම් අතින් මෙන්ම අනෙකුත් යටිතල පහසුකම් ද ඉතා වේගවත්ව සංවර්ධනය වුනා. මේවා ඉදිරි පරම්පරා ගණනාවකට කිසිදු ගැටළුවකින් තොරව ප්‍රයෝජන ගන්න පුළුවන් ව්‍යාපෘතීන් පත්වන බවට කිසිදු විවාදයකින් තොරව සඳහන් කල හැකියි. ඒකට හොඳ උදාහරණයක් තමයි 1956 ඇතිවූ පෙරළියේ යහපත් ප්‍රතිඵලයන් අදටත් අපි භුක්තිවිඳිනවා. ඒ වගේම තමයි මේ අපි අද ගන්නා පියවර තව දශක ගණනාවකට පසුවත් ජනතාව ප්‍රතිලාභ ලබා ගනීවි.

අනික් අතින් අපේ රටේ පැවතුණ විකල්ප ගුවන් තොටුපළක අවශ්‍යතාවයට විසඳුමක් ලෙස අද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ එකතු වෙනවා. කටුනායක ඉඳලා මිනිත්තු 22 න් මත්තලට පියාසර කරන්න අවස්ථාව ලබාදීලා තියෙනවා. මේ සංවර්ධනය නවතින්නේ නැහැ. තව වසර 10 කින් මේ ප්‍රදේශ හඳුනා ගන්නත් බැරි තරම් දියුණු වේවි. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හම්බන්තොට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති නාමල් රාජපක්ෂ මැතිතුමාටත් දිස්ත්‍රික්කයේ ඇමතිතුමන්ලාටත් මන්ත්‍රීතුමන්ලාටත් අවශ්‍යයි, මේ පරිසරය තිරසාර සංවර්ධනයකට ලක් කරන්න. තිරසාර සංවර්ධනයක් සඳහා තමයි ඒ ප්‍රදේශ වලට සම්බන්ධ වන අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග සහ සෞඛ්‍ය පහසුකම්, වාරි ව්‍යාපෘතීන්, සංචාරක කර්මාන්තය වැනි දේ ශීඝ්‍රයෙන් සංවර්ධනය කරන්නෙ. විශේෂයෙන්ම මේ වන විට සංචාරක කර්මාන්තය ඉලක්ක කර ගනිමින් දකුණ, නැගෙනහිර ඇතුළු මේ ආශ්‍රිත ප්‍රදේශ දියුණු කරන්න පියවර අරගෙන තියෙනවා. මීට සමගාමීව තවත් අභ්‍යන්තර ගුවන් තොටුපළවල් 13 ක් සංවර්ධනය කරන්නත් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි අප අමාත්‍යාංශය පියවර ගනිමින් සිටිනවා.

## විගමනික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් රාජපක්ෂ ගුවන් තොටුපළේ දායකත්වය කොහොමද?

දකුණු හා නැගෙනහිර ප්‍රදේශය වැඩිපුර විගමනික ශ්‍රමිකයන් පැමිණෙන ප්‍රදේශයක්, ඒක නිසා ඔවුන්ටත් මත්තල රාජපක්ෂ ගුවන්

ජාත්‍යන්තර තොටුපළ භාවිතා කරන්න පුළුවන්. මෙම ගුවන් තොටුපළ සංචාරක, විගමනිකයන් හා භාණ්ඩ ගුවන් ප්‍රවාහනයට ඒකාබද්ධ සේවාවක් සපයනවා. තවදුරටත් විග්‍රහ කළොත් මෙම ප්‍රදේශය වරාය හා ගුවන් තොටුපළ යන දෙකම තුදුරුව පිහිටීම හේතුවෙන් ආයෝජනයන්ටත් ඉතා වැදගත් වෙනවා. මේ සියලු හේතු නිසා දැනටමත් ගුවන් සමාගම් මෙන්ම සංචාර කර්මාන්තය ද මෙම ගමනාන්තය පිළිබඳ උනන්දුවක් දක්වනවා.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මෙම ගුවන් තොටුපළ ව්‍යාපෘතිය තුළින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ගැන සඳහන් කළොත්...?**

ගොඩබිම, මුහුද සහ අහස යන ප්‍රවාහන ජාලය හා බැඳුණු ආර්ථික දියුණුව තමයි රටක් ස්ථාවර කරවන්න සමත් වෙන්නෙ. එහිදී වැදගත් ප්‍රවාහන ජාලයක් වන්නේ ගුවන් ප්‍රවාහනයයි. අපේ රට ගත්තම මෙහි නිෂ්පාදනය වන කෘෂි භෝග මෙන්ම ඉක්මනින්ම නරක්වන සුළු ආහාර ද්‍රව්‍ය වැනි දේ නැවුම් ලෙසම ප්‍රවාහනය කරන්නත් මෙම ගුවන් ප්‍රවාහනය ඉතා වැදගත් වෙනවා. මේ හා සම්ගාමීව එම ප්‍රදේශය ආසන්නයේ කර්මාන්ත ශාලා රැසක් ඉදිරියේ දී ආරම්භ වේවි.

තවද මෙමඟින් ජනිත වන රැකියා ප්‍රමාණයක් ඉතා විශාලයි. කාර්මිකයන්, ඉංජිනේරුවන්, කම්කරුවන් හා අනෙකුත් සේවා සපයන්නන් විශාල පිරිසකට පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ රැකියා සඳහා අවස්ථාව හිමිවේවි. අද අපේ තරුණ තරුණියන් විදේශ ගතව කරන රැකියා හෙට දිනයේ ලංකාවේ දී කරන්න ලැබෙන විශේෂ අවස්ථාවක් තමයි මේක. ලංකාවේ තාරුණ්‍යයට විවෘත වන නැවුම් දොරටුවක් තමයි මෙම ජාත්‍යන්තර ගුවන් තොටුපළ. මෙය කිසිසේත් සුළු කොට තැකිය නොහැකියි. මෙමගින් අපේ ප්‍රධාන ගුවන් සමාගම් දෙක වන ශ්‍රී ලංකන් සහ මිහින් ලංකා යන ගුවන් සමාගම් දෙකටත් දේශීය හා විදේශීය පුද්ගලික ගුවන් සමාගම්වලටත් විශාල අවස්ථාවක් විවර වෙනවා ජාත්‍යන්තර හා දේශීය මඟීන් සංසරණයට එක්වීමට.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපගේ අනාගත පරපුරට/ දරුවන්ට ගුවන් ගමන් කර්මාන්තය තුළ අනාගතය කෙසේ වේවිද?**

මේ රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් ජාත්‍යන්තර තොටුපළ අපේ රටේ ගුවන් සේවා කර්මාන්තයේ තිබූ ලොකු අඩුපාඩුවක් සම්පූර්ණ කරනවා. ඊට අනුව මේ සමගින් විවෘත වන දොරටු තුළ මෙය මහා පරිමාණයේ ව්‍යාපෘතියක් වෙයි. අපේ රටේ ඓතිහාසික පිහිටීමට අනුව එය නාවික මෙන්ම ගුවන් ගමනාගමනය තුළත් වැදගත් පිහිටීමක්. එය පෙර අපර දිග ගමනාගමනයේ අත්‍යාවශ්‍යම ගුවන් ගමන් මාර්ග වල ප්‍රධාන සංධිස්ථානයක තමයි පිහිටලා තියෙන්නෙ.

මේ හේතූන් නිසා දැන් අධ්‍යාපනය ලබන අපේ දරුවන්ටත් ඉදිරියේ දී ගුවන් කර්මාන්තය සමග එකතු වෙන්න අවස්ථාව වැඩිවේවි. මොකද සමහර විට අද මෑද පෙරදිග හරහා ගමන් කරන ගුවන් යානා හෙට දවසේ අපේ රට හරහා ගමන් කරන්නත් පුළුවන්. මෙම ව්‍යාපෘති හරහා අපි ළඟා කර ගත යුත්තේ ඒ තත්වයයි. අද නාවිකව කෙරෙන කටයුතු සමහර වෙලාවට අවසන් වෙන්නෙ ගුවනින්. මේක තමයි අද ලෝකය ළඟා කර ගෙන තියන දියුණුව. එහිදී එයට සම්බන්ධ වන ගුවන් නියමුවන්, ගුවන් ඉංජිනේරුවන්, ගුවන් තාක්ෂණික ශිල්පීන්, ගුවන් ගමන් පාලකවරුන් ඇතුළු බොහෝ රැකියා අවස්ථාවන් සඳහාත් ඉඩ කඩ ලැබෙනවා. මේ සියල්ල සඳහා අපි ගුවන් ක්ෂේත්‍රය පිළිබඳ හැදෑරීම වැදගත්. මෙම ප්‍රදේශයේ දියුණුවට ඇති ඉඩකඩ මෙම පහසුකම් සමග තවත් ශක්තිමත්වනවා.

අපිට එදා තිබුණ දුම්රිය මාර්ග, වාරි මාර්ග නෙවෙයි අද තියෙන් ඒවා තිකාගන්නවත් බැරි ආකාරයෙන් ලෝකයේ දියුණුවත් එක්ක ඉදිරියට ඇවිල්ල. ඒවා නිර්මාණය කරන්න පවා දක්ෂ නිර්මාණකරුවන්, ඉංජිනේරුවන් අපේ රටෙන් බිහිවෙලා තියනවා. මේක අනාගතයේ ගුවන් කර්මාන්තයටත්

මෙමඟින් ජනිත වන රැකියා ප්‍රමාණයත් ඉතා විශාලයි. කාර්මිකයන්, ඉංජිනේරුවන්, කම්කරුවන් හා අනෙකුත් සේවා සපයන්නන් විශාල පිරිසකට පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ රැකියා සඳහා අවස්ථාව හිමිවේවි. අද අපේ තරුණ තරුණියන් විදේශ ගතව කරන රැකියා හෙට දිනයේ ලංකාවේ දී කරන්න ලැබෙන විශේෂ අවස්ථාවක් තමයි මේක. ලංකාවේ තාරුණ්‍යයට විවෘත වන නැවුම් දොරටුවක් තමයි මෙම ජාත්‍යන්තර ගුවන් තොටුපළ.

පොදු කරුණක් වේවි. අපේ ජනාධිපතිතුමා මේ සියළු ව්‍යාපෘති ආරම්භ කරන්නෙ අපේ රටේ අනාගත පරපුර ගැන හිතල. ඒවායේ ප්‍රතිඵල තුදුරු අනාගතයේම නෙලාගන්න පුළුවන් වේවි.

දැනට අපේ ගුවන් කර්මාන්තයට තියන ප්‍රධාන ගැටළුව තමයි ඉන්ධන අර්බුදය. නමුත් ඉදිරියේදී මත්තාරම් ද්‍රෝණියේ කැණීම්වලින් ඒ ප්‍රශ්නයටත් සහනදායී පිළිතුරක් ලැබේවි කියා මා විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයේ අනාගතය කෙසේ වේවිද...?**

ඇත්තටම, අපේ රටේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ භාණ්ඩ ප්‍රවාහනයෙන් වැදගත් කොටසක් විසිතුරු මසුන්, එළවළු, පලතුරු හා නැවුම් ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම් වලට හිමි වෙනවා. මැණික් වැනි වටිනා දේ ගෙනියන්නෙත් ගුවනින් මිසක් නාවික මාර්ග වලින් නෙවෙයි.

මම පසුගිය දවසේ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළේ නිරීක්ෂණ චාරිකාවකට ගිහින් එන කොට අතර මග කඩයකදී කුඩා දරුවෙක් හම්බවුනා, ඒ දරුවගෙන් මම අහන්නත් කලින් කිව්වා තව දවස් 12 යි කියලා. මෙහෙම තමයි මත්තල කුඩා දරුවන්ටත් දැනෙන හැටි. ඔවුන්ටත් ඒ පිළිබඳ නව සිතුවිලි ඇති වෙලා. මීට පෙර කවදාවත් ගුවන් සේවාව ඈත ගම් වලට පැතිරිලා නෑ. අද අපේ අතිගරු ජනාධිපතිතුමන්ට නායකත්වය නිසා ඒ තත්වයත් උදාවෙලා. ලෝකයේ විශාල මගී ගුවන් යානාත් හසුරවන්න පුළුවන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිරි පරම්පරාව වෙත ලබා දෙන විශාල ත්‍යාගයක් කියල තමයි මම හඳුන්වන්නෙ.

නගරයෙන් බැහැරව ඉදිවුනු මෙම සුවිශාල ගුවන් තොටුපළ වගේම සුවිශාල යානා හසුරවන්න හැකි ගුවන් නියමුවනුත් අපේ රටේ ඈත ගම් වලින් බිහිවෙන්න ඕන. එදාට තමයි මේ ව්‍යාපෘතියේ සාර්ථකත්වය හා වටිනාකම දෙගුණ වෙන්නෙ. ගුවන් නියමුවකුට දේශසීමා නැහැ. ලෝකයේ ගුවන් ගමන්වල ව්‍යාපාරිකයන් සමග ඔවුන්ට ගමන් කිරීමේ, රැකියාව කිරීමේ සුවිශේෂී අවස්ථාවන් ලැබෙනවා. එය දේශීය මෙන්ම විදේශීයවත් සේවය කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් බවට පත්වේවි.

**අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, වෘත්තියෙන් ඉංජිනේරුවෙක් වූ ඔබතුමන් අද දේශපාලන ක්ෂේත්‍රය තුළ කටයුතු කිරීම කොහොමද ඔබට දැනෙන්නේ...?**

මම වෘත්තියෙන් ඉංජිනේරුවෙක්. නමුත් කමා තමන්ගේ ක්ෂේත්‍රයටම පමණක් සීමා විය යුතු නැහැ. එය සමාජයට සේවය කිරීමට පුළුසුකමක් පමණයි. මම ඉංජිනේරු අධ්‍යයන කටයුතු කළේ උතුරු එංගලන්තයේ, එහිදී මාත් සමඟ සමකාලීනව කේම්බ්‍රිජ් සරසවියේ සාහිත්‍ය හදාරන ලද උපාධිධාරියකු පවා වැව කළා. ඔහු අදටත් ඉන්නෙ ඉංජිනේරු සේවා කර්මාන්තයේ. උසස් අධ්‍යාපනය හරහා උපාධිය ලබාගත් පසු එම සේවය එම විෂයට පමණක් සීමාවිය යුතු නැහැ. මම ඉංජිනේරු උපාධිය ගත්තත් දේශපාලන කටයුතු වල යෙදුණත් මම හදාරපු දේ ප්‍රයෝජනයට ගෙන තිබෙනවා. විවෘතව සිතීමයි වැදගත් වන්නෙ. උසස් අධ්‍යාපනය අභියෝග පිළිගන්නට අපව සූදානම් කර තිබෙනවා. ඒ සියල්ලට පෙර තමා උපන් මවුබිම ගැන සිතිය යුතුයි. ඒ නිසා තමයි මමත් ලංකාවට නැවත ආවේ. නැත්නම් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ අවස්ථාවකට යන්න තිබුණා. ඒත් අපේ මාතෘ භූමියේ වටිනාකම වැඩි වශයෙන් දැනෙන්නේ වෙන රටකට ගියාම තමයි.

මාගේ ආදරණීය පියාණන් හා මෑණියන් ලබාදුන් ආදර්ශය තුළ මව්බිමට හා ජනතාවට සේවය කරන්නට මහින්ද චින්තන වැඩපිළිවෙළ තුළ කැපවෙනවා. මාගේ සහෝදර සහෝදරියන් මෙන්ම මාගේ පුතණුවන් ද විදේශීය උසස් අධ්‍යාපනය ලබා නැවත මව්බිමට පැමිණ තම වෘත්තියත්, තම ජීවිතයත් මව්බිමේ උන්නතියට අදටත් කැපකරනවා. ඒ සඳහා තමයි ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනය තුළ අපි මේ කටයුතු කරන්නෙ.
මාතෘ භූමියේ නිදහසත්, ස්වාධීනත්වයත්, ඒකීයභාවයත් ආරක්ෂා කිරීමට කැපව කටයුතු ලෙස මා ඔබ සියලුදෙනාට ආරාධනා කරනවා.

සම්බන්ධීකරණය
**බුද්ධික රූපසිංහ**
ගරු සිවිල් ගුවන් සේවා
නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්

2013 ජනවාරි 29 වන දින පරීක්ෂණ ගුවන්ගමනයක් රාජපක්ෂ ගුවන් තොටුපළට නියෝජ්‍ය අමාත්‍යතුමන් සමග පැමිණි මොහොත.




ලෝකයේ විශාල මගී ගුවන් යානාත් හසුරවන්න පුළුවන් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිරි පරම්පරාව වෙත ලබා දෙන විශාල ත්‍යාගයක් කියල තමයි මම හඳුන්වන්නෙ.



# රට සංවර්ධනයේ දී වාණිජ ගුවන් බලය වටිනා සාධකයක්...

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ
හම්බන්තොට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති

## ගරු නාමල් රාජපක්ෂ

මැතිතුමාගේ පණිවුඩය

රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ජාතියට පවරන ඓතිහාසික අවස්ථාවට සමගාමීව එළිදකින ගුවන්සර සඟරාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳ මම ඉතා සතුටට පත් වෙමි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගේ නියෝජිතයකු ලෙසත් රටේ පුරවැසියකු ලෙසත් අප අද මහත් සතුටට පත් වන්නෙමු. අද අපේ ගුවන් ඉතිහාසයට නව පරිච්ඡේදයක් එක් වෙයි. රටේ සාධු ආර්ථික සංවර්ධනය කේන්ද්‍රගතව නව ගුවන්තොට ඉදිව තිබේ.

රටේ සංවර්ධනයේ දී වාණිජ ගුවන් බලය වටිනා සාධකයකි. ලෝකයේ දියුණුව කරා පියනැගූ බොහෝ රට වලින් අපට එය මනාව පැහැදිලි වෙයි. අද අප රට තබන්නේ ඒ සඳහා වූ ඓතිහාසික පියවරයි. අනාගතයේ හම්බන්තොට ජාතික ආර්ථිකයේ මර්මස්ථානයක් බවට පත්වෙයි. ශුෂ්ක කලාපයක් ලෙස අප පාසල් පෙළ පොතේ දුටු හම්බන්තොට අපේ නංගිලා, මල්ලිලාට අනාගතයේ දකින්නට ලැබෙන්නේ නැත. නව සංවර්ධනය සමඟ ජන ජීවිතය සේම මෙම කලාපයද සමෘද්ධිමත් වෙයි.

සම්පත් බෙදී යාමේ විෂමතාවය පිළිබඳව අපේ රටේ තරුණයන් තුළ වූ අසහනය අද තුරන් වී ඇත. හම්බන්තොටට, අම්පාරට, ත්‍රිකුණාමලයට සේම යාපනයට ද එදා කොළඹට කේන්ද්‍රව තිබූ සංවර්ධනය සමව ලැබෙයි. එබැවින් මේ රටේ තරුණයින් වශයෙන් මේ යුගය දෙස බලන්නේ දැඩි ගෞරවයෙන් යුතුවය. ඒ අතීතයේ අප අත්විඳි අඳුරු පරිච්ඡේද රටේ තරුණයින්ට නැවත දක්නට නොලැබෙන නිසාය.

ජාතික ආර්ථිකයටත්, පළාතේ ජන ජීවිතයටත් යෝධ ශක්තියක් වන මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ජාතියට පවරන අවස්ථාවේ රටේත් ප්‍රදේශයේත් තරුණ පරපුර සමඟ මම මහත් අභිමානයට පත් වෙමි.



අද ලෝකය විසින් පරිසරයට හානි වන අන්දමේ නිර්මාණ සිදුකරද්දී,

# පරිසර හිතකාමී ලෙසින් ඉදිවන රාජපක්ෂ ගුවන් තොටුපළ

ඊට ලබා දී ඇත්තේ කදිම පිළිතුරකි.

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්
**වෛද්‍ය රවීන්ද්‍ර රූබේරු**
මැතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව වැනි දියුණු වන ආර්ථිකයක් ඇති මුහුදින් වටවූ කුඩා දිවයිනකට, ස්වකීය සමාජීය සහ ආර්ථික සමෘද්ධිය ලබා ගැනීමේදී ගුවන් සේවා කර්මාන්තයෙන් ලැබෙන පිටිවහල අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ. ප්‍රමුඛතා හඳුනා ගනිමින් මනාව සැලසුම් කර, ක්‍රමිකව ක්‍රියාවට නංවන ගුවන් ප්‍රවාහන සැලැස්මක් තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ගුවන් සේවා කර්මාන්තය ප්‍රබලව දායක කර ගත හැක. නමුත් ගුවන් යානාව, ගුවන් තොටුපළ, ගුවන් ගමන් යනාදී වදන් පෙළවල් අප රටේ බොහෝමයකගේ මනසේ රැඳී ඇත්තේ සාමාන්‍ය මිනිසුන්ට ළඟා වීමට නොහැකි සුඛෝපභෝගී අංගයක් ලෙසටය.

මේ සියළු අවහිරතා දුරු කොට ගුවන් ගමන් කර්මාන්තය රටේ ජනතාවට සමීප කිරීම අතිගරු ජනාධිපතිතුමන් ගේ අරමුණකි. එහි එක් පියවරක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ අභිනවයෙන් ඉදිකර ජනතා අයිතියට පත් කරනු ලබන මත්තල, රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ හැඳින්විය හැකිය. ග්‍රාමීය ප්‍රදේශ අතහැර නාගරික ප්‍රදේශ වෙත ජනතාව එකතු වන මෙවන් අවධියක ඉදිකරන ලද රාජපක්ෂ ගුවන් තොටුපළ නිසැකවම ගම හා නගරය යා කරන මිතුරු පාලමක් වන බව නිසැකය.

අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව ඇමරිකානු ඩොලර් මිලියන 209 වියදමින් ඉදිකරන ලද ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලාංකාවාසී ජනතාවට නිහතමානීව ආඩම්බර විය හැකි අන්දමේ නිර්මාණයකි. මෙම ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධනය හා භාණ්ඩ හුවමාරුව මගින් අපනයන ක්ෂේත්‍රයේ වාසිදායක තත්වයක් ඇති කරන බව මාගේ විශ්වාසයයි. මෙම ගුවන් තොටුපළ වසරකට මගීන් මිලියනයකට පමණ පහසුකම් සැපයිය හැකි අයුරින් ඉදිකර ඇති අතර, අද ලෝකය විසින් පරිසරයට හානි වන අන්දමේ නිර්මාණ සිදුකරද්දී, පරිසර හිතකාමී ලෙසින් ඉදිවන මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ ඊට ලබා දී ඇත්තේ කදිම පිළිතුරකි.

තවද මේ හා සමගාමීව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන පාසල් ගුවන් සේවා සමාජ පිහිටුවීමේ වැඩසටහන මෙන්ම උසස් පෙළ පාසල් වෙත නොමිලයේ බෙදා හරිනු ලබන මෙම ගුවන්සර සඟරාව ද ශ්‍රී ලංකාවේ අනාගත පුරවැසියන් වන ශිෂ්‍ය ප්‍රජාව ගුවන් සේවා කර්මාන්තය පිළිබඳ දැනුමින් පෝෂණය කරනු ඇත. ඒ තුළින් ගුවන් තොටුපළ ආශ්‍රිත රැකියා සඳහා ඉදිරියේ දී දැනුවත් පිරිසක් යොමු වනු ඇත.

අවසන් වශයෙන් ශ්‍රී ලංකාවේ මේ සියවස තුළ ඉදිකරන ලද විශිෂ්ට නිර්මාණයක් වන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෝක ජනතාවට විවෘත කරන මේ අවස්ථාවේ එහි සියළු කටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.



# ශ්‍රී ලංකාව

## නව දුරටත් අන්ධකාර ලෝකයක සඟවා තැබූ **තනිවූ දූපත් රාජ්‍යයක් වශයෙන් පැවති අවධිය දැන් අවසාන වෙමින් ඇත.**

සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති
**ජෙනරාල් රොහාන් දළුවත්ත මැතිතුමාගේ පණිවුඩය**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පංච කේන්ද්‍රීය වැඩ පිළිවෙලෙහි එක් කේන්ද්‍රස්ථානයක් වන ගුවන් කේන්ද්‍රස්ථානයේ තවත් සුවිශේෂී සංවර්ධන කඩඉමක් 2013 මාර්තු 18 වන දාට සම්පූර්ණ වේ. ශ්‍රී ලාංකේය දූවා දරුවන්ගේ අනාගතය නව දුරටත් සුරක්ෂිත කරමින් ඔවුන් නව රැකියා මාන කරා ඔසවා තබමින් ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ එනම් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එදිනට ලෝකවාසී ජනතාවට ශ්‍රී ලාංකේය ජනතාව විසින් දායාද කරනු ඇත.

තවද ශ්‍රී ලංකාව තුළ පවතින ගුවන් සේවාව හා සම්බන්ධ ප්‍රධාන දුෂ්කරතාවයන් හඳුනාගත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ගුවන් සේවාව දුෂ්කර පළාත් සඳහාද යොමු කිරීමේ ආරම්භය ලෙස එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පවා ගුවන් සේවාව සම්බන්ධයෙන් පරිච්ඡේදයක් ඇතුලත් කරමින් සිවිල් ගුවන් සේවාව ව්‍යාප්ත විය යුතු බව පිළිගන්නා ලදී. එම කාරණය ප්‍රකාශනයකට පමණක් සීමා නොකොට රට තුළ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් හම්බන්තොට මත්තල ඉදිකිරීමට තීරණය කරන ලදී. එතුමාගේ මෙම මහඟු කාර්යයට අත්වැලක් වෙමින් ගම්බද පාසැල් දරුවන් ගුවන් සේවාව පිළිබඳ දැනුවත් කිරීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සංවර්ධන හා අධ්‍යාපන ඒකකය විසින් පවත්වා ගෙන යනු ලබන අධ්‍යාපනික වැඩපිළිවෙළ හා ගුවන්සර සඟරාවද මේ වන විට මහත් දායකත්වයක් දක්වා ඇත.

ශ්‍රී ලංකාව නව දුරටත් අන්ධකාර ලෝකයක සඟවා තැබූ තනිවූ දූපත් රාජ්‍යයක් වශයෙන් පැවති අවධිය දැන් අවසාන වෙමින් ඇත. ප්‍රවාහනයේත් සංනිවේදනයේත් නව තාක්ෂණික ක්‍රියාදාමයක් සමඟ මුසුවෙමින් ශ්‍රී ලංකාව ඉදිරියට ගමන් කරමින් පවතී. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දේශීය හා විදේශීය සියලු විවේචන හා සැඟවුනු අභියෝග හමුවේ නොසැලී කටයුතු කරන්නේ අප රටේ ඓතිහාසික හා සංස්කෘතික උරුමයන්ද සුරකිමිනි. ශ්‍රී ලංකාවේ අනාගතාවය ප්‍රභාපවත් ලෙස ලොවට කියා පෑ හැකි ප්‍රධාන මාර්ගය වන්නේ දියුණු ගුවන් සේවයයි.

අප රටෙහි පවතින ස්වාභාවික පිහිටීම අනුව පෘථිවියේ නැගෙනහිර සිට බටහිරට ගමන් කිරීමේදී ශ්‍රී ලංකාව හරහා ගමන් කිරීම පහසුම මාර්ගය වේ. එසේම ආකර්ශනීය සංචාරක පුරවරයක් ලෙසද අප රට ප්‍රසිද්ධියක් උසුලන බැවින් නව ගුවන්තොටුපළ සහ සේවාවන් පිහිටීම තුළින් ශ්‍රී ලංකාව හරහා නොගොස් මාලදිවයින හා ඉන්දියාව වෙත යන පිරිස් අප දිවයින කරා ගෙන්වා ගත හැකිවේ. එමෙන්ම රට තුළ ගුවන් ප්‍රවාහනය සම්බන්ධ රැකියා අවස්ථා තවදුරටත් ජනිත වීම හේතුවෙන් අනාගතය වෙත ගමන් කරන ශ්‍රී ලාංකේය දූවා දරුවන්ගේ රැකියා අපේක්ෂා තවදුරටත් ස්ථාවර වනු ඇත.

ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත වන මෙම අවස්ථාවේ මාගේ සුභාශිංසන මෙම මහා කර්තව්‍යයට දායක වූ සියලු පාර්ශවයන් වෙත පිරිනමමි.



# අහසේ ගුවන් යානයක් පියාසර කරන විට එළියට පැන ඇඟිලි දික් කරමින්

බැලූ කාලය දැන් අවසන් කිරීමට කාලය උදා වී ඇත.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් හා
ප්‍රධාන විධායක නිළධාරී
**එච් එම් සී නිමල්සිරි මැතිතුමාගේ පණිවුඩය**

වර්තමාන ශ්‍රී ලංකාව නව මානයක් තුළින් ශීඝ්‍ර සංවර්ධනයක් කරා යොමුව ඒ ඔස්සේ ඉදිරියට ගමන් කරමින් පවතී. මෙම ශීඝ්‍ර සංවර්ධන කාර්ය සඳහා ජවයක් ලබා දීමට එයට සාපේක්ෂව ගුවන් සේවා ක්ෂේත්‍රය ද ඉදිරියෙන්ම සිටිය යුතු බව මාගේ විශ්වාසයයි. ගුවන් සේවාව ලෝකයේ ප්‍රමුඛතම ප්‍රවාහන මාධ්‍ය වුවද ශ්‍රී ලාංකේය ජනතාවට මෙම සේවාව පරිහරණය කිරීමේ ප්‍රධාන ගැටළුවක් ලෙස දැක්විය හැක්කේ මෙම ක්ෂේත්‍රය පිළිබඳ පවතින දැනුම් ප්‍රමාණය අල්ප වීම හා ක්ෂේත්‍රය හා බැඳුනු සේවාවන් රට තුළ ව්‍යාප්ත නොවීම වේ.

රට පුරා සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයට අදාළ දැනුම සම්ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය පැහැදිළිව හඳුනා ගත් සිවිල් ගුවන් සේවා අධිකාරිය 'සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපනික ඒකකය' නමින් ඒකකයක් පිහිටුවා ගුවන්සර නමින් සිංහල මාධ්‍යයෙන් සඟරාවක් නිකුත් කරමින් එය දිවයින පුරා පොතිලයේ බෙදා හරිනු ලබයි. මෙම සඟරාව පසුගිය කාල වකවානුව පුරාම සිවිල් ගුවන් සේවාව පොදු ජනයා තුළට සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානතම මෙවලමක් ලෙස ක්‍රියා කරයි. එම වැඩසටහන සම්බන්ධව ලද සීඝ්‍ර ගුරු ප්‍රතිචාර තුළින් මා හට එය ඉතා හොඳින් පැහැදිළි වේ.

ශ්‍රී ලංකාව තවදුරටත් සංවර්ධනය වෙමින් පවතින රටක් නොව, සංවර්ධිත රටක් විය යුතුය. ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් වර්තමාන රජය පියවර රැසක් තබා ඇති බව අවංකව පිළිගත යුතු සත්‍යයකි. අහසේ ගුවන් යානයක් පියාසර කරන විට එළියට පැන ඇඟිලි දික් කරමින් බැලූ කාලය දැන් අවසන් කිරීමට කාලය උදා වී ඇත. ගැමි ප්‍රදේශවලට පවා අද බුද්ධිය දැනීම හා බැඳුනු ඉතා දියුණු ආකල්පයක් සම්ප්‍රේෂණය වෙමින් පවතී. ඒ ආකල්පය සංවර්ධනාත්මක ඵල සහිත කාර්යයන් බවට විවිධ අංශ වලින් ඉටුකරමින් ඇත. සිවිල් ගුවන් සේවා අංශය ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් තව දුරටත් ඉදිරියට ගෙන යාමට අවශ්‍ය සංවර්ධනාත්මක වටපිටාව දැන් සකස් වී ඇත.

තවද ශ්‍රී ලංකාවේ ගුවන් සේවාව දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය ප්‍රතිපත්ති ප්‍රකාශයේ ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් පිහිටුවීම හා අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම ඇතුළත් කරමින් එම ප්‍රකාශය ක්‍රියාවේන්ද මේ වන විට තහවුරු කර ඇත. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ එනම් 'මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ' වර්ෂ 2009 නොවැම්බර් මස 19 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතින් ඉදිකිරීමේ කටයුතු ආරම්භ විය. මෙහි පර්යන්ත ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීම 2011 අප්‍රේල් 24 දින සිදුවිය. සියලු කාර්යයන් සාර්ථකව නිමවී 2013 මාර්තු 18 දින මෙහෙයුම් සඳහා විවෘත වේ. මෙහි ආශ්චර්යය වන්නේ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාව ආරම්භ වී වසර 100 ක් සපිරීමද මෙයට සමගාමීව සිදු වූ බැවිනි.

මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළ තුළින් රටට විශාල ආයෝජන අවස්ථා ගලා ඒමක් සිදු වන අතර මේ වන විටත් දේශීය විදේශීය ආයෝජකයන් සඳහා ආයෝජන අවස්ථා ගොඩනගා ඇත. විදේශීය සංචාරකයින් වැඩි වශයෙන් මෙරටට ගෙන්වා ගැනීමද තවත් එක් අපේක්ෂාවකි. ග්‍රාමීය ප්‍රදේශ වැඩි දියුණු වීමද මේ වන විටත් ශ්‍රී ලංකාවේ වැඩි පිරිසක් විශේෂයෙන් පාසල් සිසුන් ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම සාර්ථකව සිදු වන බැවින් ගුවන් සේවා ක්ෂේත්‍රය ආශ්‍රිතව ජනිත වන රැකියා කෙරෙහි අනාගතයේ දී ශ්‍රී ලාංකේය දරු දැරියන්ම යොමු කරවා ගත හැකි වනු ඇත.

මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොළ මෙහෙයුම් සාර්ථක වී ඒ ඔස්සේ ශ්‍රී ලාංකේය ජනතාවට ඵලදායී සේවාවක් ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.



# අප රට ගුවන් කේන්ද්‍රයක් බවට පත් කිරීමේ වැදගත්ම **සාධකය මෙම රාජපක්ෂ ගුවන් තොටුපළ යි.**

**ප්‍රසන්න ජේ වික්‍රමසූරිය**
ඩබ්ලිව් ඩබ්ලිව් ටී, ආර් ඩබ්ලිව් පී, ආර් එස් පී
සභාපති සීමාසහිත ගුවන් තොටුපළ හා
ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

හම්බන්තොට මත්තල පිහිටි ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මෙහෙයුම් කටයුතු ආරම්භ කෙරෙන මෙම අවස්ථාවේ දී මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම මා ජීවිත කාලය තුළ ලැබූ අතිමහත් වරප්‍රසාදයක් ලෙස සලකමි.

වර්ෂ 2009 නොවැම්බර් මස 27 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමානන් විසින් මුල්ගල් තබා ආරම්භ කරන ලද මෙම නව ගුවන් තොටුපළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය දියත් කිරීමෙන් අනතුරුව අති විශාල වගකීමක් අප මත පැවරුණි. නාවුක, ගුවන්, වාණිජ, බලශක්ති සහ දැනුම් යන පංචවිධ අංශයන් හි කේන්ද්‍රය බවට අප රට පත් කිරීමේ දර්ශනය මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ අන්තර්ගත වේ. ඒ අනුවින් අප රට ගුවන් කේන්ද්‍රයක් බවට පත් කිරීමේ වැදගත්ම සාධකය ලෙස මෙම දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ හැඳින්විය හැක. එකිනෙකට තදින් බැඳී තිබුණු සීමාන්තික ව්‍යාපෘති අංශ වලින් දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ව්‍යාපෘති සැලැස්ම සමන්විත වූ අතර මෙහි ඉදිකිරීම් ආරම්භ කිරීමට සිදුවූයේ ඉතාමත් අවම පහසුකම් සහිත භූමිභාගයක් තුළදී ය. අතිගරු ජනාධිපතිතුමන්, සිවිල් ගුවන් සේවා ගරු අමාත්‍යතුමන් සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් ගේ මාර්ගෝපදේශකත්වය ද චීන මහජන සමුහාණ්ඩුවේ තාක්ෂණික හා මූල්‍ය සහයෝගීතාවය ද ගුවන් තොටුපළ හා සම්බන්ධ වෙනත් රජයේ ආයතන වලින් ලද සහයෝගය ද තුළින් සහ අප සමාගමේ සේවා නියුක්තිකයන්ගේ දැඩි කැපවීම තුළින් සැලසුම්ගත ව්‍යාපෘතිය නිසි කලට නිම කිරීමට අපට හැකි වූ බව මා ඉමහත් සතුටින් ප්‍රකාශ කරමි.

නවීන තාක්ෂණයෙන් යුත් අති විශාල A-380 වැනි ගුවන් යානා හැසිරවිය හැකි ලෙස සහ ඊට අවශ්‍ය නොයෙක් පහසුකම් සැපයිය හැකි ලෙස මෙම නව ගුවන් තොටුපළ ඉදි කර තිබේ. මේ තුළින් හම්බන්තොට දිස්ත්‍රික්කයට, පොදුවේ දකුණු පළාතට සහ යාබද නැගෙනහිර ඌව, මධ්‍යම සහ සබරගමුව පළාත් වලට විවිධාකාර වූ අවස්ථා උදාකරනු ඇත. මෙම ගුවන් තොටුපළ නිසා මීට කිලෝ මීටර් 20 ක් පමණ ආසන්නයේ ඇති හම්බන්තොට වරාය හා ඒකාබද්ධව ගුවන් සහ නාවුක බහාලුම් ප්‍රවාහනය සිදුකිරීම සඳහා ද අවස්ථාව උදාවනු ඇත. මා සහ මාගේ ආයතනයෙහි සේවක කණ්ඩායම කෙරෙහි දැඩි විශ්වාසයකින් යුතුව ගුවන් තොටුපළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ඊට සම්බන්ධිත අනෙකුත් මෙහෙයුම් කටයුතු සිදුකිරීම අප වෙත පැවරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමානන් වෙත ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි වසර ගණනාවක ඵලදායී මෙහෙයුම් කටයුතු වලින් ලද ශක්තිමත් අත්දැකීම් පාදක කොටගෙන අප ආයතනික කණ්ඩායම නව ගුවන් තොටුපළේ මෙහෙයුම් කටයුතු වලට අවතීර්ණ වනු ඇත. අපගේ සේවා ලබාගැනීම උදෙසා නව නවත් ගුවන් සේවාවන් නව ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත ලඟාවනු ඇතැයි මා අපේක්ෂා කරමි.

Where did it all begin?



# A Centenary Sky

By Capt. **Elmo Jayawardene**

" Captain takes us through an incredible journey of hope and achievement..."

Dr. Ruwantissa **Abeyratne**
ICAO

**Available at**
**Civil Aviation Authority of Sri Lanka,**
No. 04, Hunupitiya Road,
Colombo 02
**Tel: 0112 358 800**
and all leading book shops

**Rs. 3,000/-**

FEATURE

MATTALA
RAJAPAKSA INTERNATIONAL AIRPORT

දේවී සමරජීව

# ආසියාවේ ගුවන් කේන්ද්‍රයේ රන් සළකුණ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ



ගුවන් තොටුපළක් යනු රටක සංවර්ධනයේ ප්‍රධාන දොරටුවකි. මන්ද රට තුළට පැමිණෙන බොහෝ ව්‍යාපාරික පිරිස් මෙන්ම ඉහළ පෙළේ ආයෝජකයින්ද ලොව දැනට සුරක්ෂිත මෙන්ම කාර්යක්ෂම ප්‍රවාහන මාධ්‍ය වන ගුවන් සේවාව බහුලව යොදා ගන්නා බැවිනි. වසර 50 කට පසු ශ්‍රී ලංකාව තුළ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළක් මේ වන විටත් ඉදි කොට අවසන්ය. අගනුවරට පමණක් සීමාව තිබූ ගුවන් සේවාව ආශ්‍රිත ප්‍රධාන පහසුකම් සැළසීමේ මාර්ගය වන ගුවන් තොටුපළ මේ වන විට ඈත ගම්මානයක සුන්දරත්වය තුළින් මුළුමහත් ලෝකයටම පහසුකම් සැලසීමට සූදානමින් සිටී. හම්බන්තොටට පමණක් නොව ශ්‍රී ලංකාවටම අභිමානයක් වන බවට දැන් සිටම ඉසි පළ කරන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිළිබඳ ගුවන්සර විසින් තබන ලද සටහනකි මේ.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත කිරීමට තව දින ..............**

අද දින වන විට මේ වදන් පෙළ ඔබට කෙතරම් සමීපදැයි මා නොදනිමි. අද කිසිදු වයස් භේදයකින් තොරව මෙම විවෘත පෙළ භාවිත කිරීම එයට ප්‍රධාන හේතුවයි. එයිනුත් බහුතරය කුඩා දරුවන් වීම රටේ අනාගතයට ඉතාමත් වැදගත්ය. එය සතුටු වීමට කරුණක් වන්නේ පසුගිය කාලය පුරාවටම ගුවන් සේවා කර්මාන්තය අපේ රටේ ජනතාවගෙන් දුරස් වී තිබීම නිසාවෙනි. ඔවුන් රටේ ඉදිවන දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ද සමඟින් මෙතෙක් කල් දුරස්ව තිබූ ගුවන් කර්මාන්තය සමඟින් සමීප වීමට පටන් ගෙන ඇත.

## ඉතිහාසය

මෙම ගුවන් තොටුපළ මුල්කාලීනව ලුණුගම්වෙහෙර සහ තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වලට යාබදව පිහිටි එල්ලල නම් ප්‍රදේශයත්, මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ හඳපාන්ගල යන ප්‍රදේශ බලධාරීන්ගේ නිරීක්ෂණයට ලක් වූ අතර වීරවිල ප්‍රදේශය ඒ අතරින් සුවිශේෂ විය. මුල් කාලීනව වීරවිල ප්‍රදේශය මේ සඳහා යෝජිත ප්‍රදේශය වූ අතර ඇතැම් පාරිසරික හේතූන් නිසාවෙන් මේ සඳහා පහසුකම් සැපයීමට මත්තල වඩාත් සුදුසු යයි යෝජනා විය. මත්තල ප්‍රදේශය හම්බන්තොට නගර සීමාවේ සිට කිලෝමීටර 15 ක් පමණ දුරින් පිහිටා ඇති අතර ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ කලාපයට ඉතා ආසන්නයේ පිහිටා ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි මත්තල යන ප්‍රදේශයට එම නාමය ලැබී ඇත්තේ මහා තලය (උසස් තලය) යන අරුතෙන් බව ප්‍රදේශවාසීන් පවසයි.

## මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ මේ දක්වා පැමිණි ගමනමගේ **සුවිශේෂී කඩඉම්**

FEATURE

එදා මෙදා තුර ඉතිහාසයේ ජාත්‍යන්තර ගුවන් මෙහෙයුම් සඳහා පැවතියේ එක් ගුවන් තොටුපළක් පමණි. එහිදී හදිසි අවස්ථාවන් සඳහා ගුවන් යානා ගොඩබෑස්සවීම සඳහා ඉන්දියාවේ ගුවන් තොටුපළ භාවිත කිරීමට සිදුවිය. මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ හම්බන්තොට මත්තල ප්‍රදේශයේ නිර්මාණය කිරීමට තීරණය විය.




මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මගී පර්යන්ත ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තැබීම




මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා මුල් ගල් තැබීම



## 2013 ජනවාරි 29

ප්‍රථම ශ්‍රී ලංකන් ගුවන් යානය මත්තලට

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ අවසන් පරීක්ෂණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් පසුගිය දා ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් එයාර්බස් 330 වර්ගයේ ගුවන් යානයක් සාර්ථක ලෙස ගොඩබස්සවන ලදි. මෙම විශේෂ ගුවන් ගමනට සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න, සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය රවීන්ද්‍ර රූබේරු යන මහත්වරුන් ඇතුළු නිළධාරීන් රැසක් සහභාගී විය.




ප්‍රථම පරීක්ෂණ ගුවන් යානය

ගුවන් තොටුපළේ තාක්ෂණික උපකරණ පිරික්සීම සඳහා පකිස්ථාන සිවිල් ගුවන් සේවා අධිකාරියට අයත් අධිතාක්ෂණික, බීච්ක්‍රාෆ්ට් වර්ගයේ ගුවන් යානයක් මත්තල නව ගුවන් ධාවන පථයට ගොඩබස්සවන ලදි. එය එම ගුවන් ධාවන පථයට ගුවන් යානයක් ගොඩබස්සවන ලද ප්‍රථම අවස්ථාව වූ අතර එම පරීක්ෂණ කටයුතු ඉතා සාර්ථක විය.

FEATURE

**ගුවන් තොටුපළ ධාරිතාවය**

2009 නොවැම්බර් මස ඉදිකිරීම් ආරම්භ කෙරුණු මෙහි පළමු අදියරේ ඉදිකිරීම් සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 209 ක් වැය වී ඇති අතර, ව්‍යාපෘතිය හි ඉදිකිරීම් හෙක්ටයාර් 2000 ක් පුරා පැතිරී ඇත. ඉන් හෙක්ටයාර් 800 ප්‍රථම අදියර සඳහා යොදා ගෙන ඇති අතර දෙවන අදියර සඳහා ඉතිරිය යොදා ගනු ඇත. ඒයාර් බස් 380 (A 380) නම් දැනට ලෝකයේ විශාලතම ගුවන් යානය පවා ගොඩබෑස්සවිය හැකි මෙහි ගුවන් ධාවන පථයේ දිග මීටර් 3500 ක් වන අතර පළල මීටර් 75 ක් පමණය. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ නිර්දේශිත ප්‍රමිතීන්ට අනුව තොටුපළ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද අතර එය ආසියාවේ ඇති ප්‍රමුඛ පෙළේ පරිසර හිතකාමී ගුවන් තොටුපළකි. මේ සඳහා නවීනතම පහසුකම්වලින් යුත් මගී පර්යන්තයක් ද නිර්මාණය කර ඇත. ප්‍රථම අදියරේදී එහි ගුවන් මගී පාලම් 02 ක් ඉදි කොට ඇති අතර දෙවන අදියර යටතේ එය 15 ක් දක්වා වැඩිකිරීමට නියමිතය. ශ්‍රී/ස ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම මෙහි සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු භාරව කටයුතු කරන අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙහි කටයුතු සිදුවේ.

# මෙහි ඉදිකිරීම් කටයුතු අදියර 02 ක් යටතේ සිදුකරනු ලබයි

## ප්‍රථම අදියර
## STAGE I

- වසරකට මගීන් මිලියනයක් සඳහා පහසුකම් සැපයීමේ හැකියාව ඇත.
  01 million passengers per annum
- වාර්ෂිකව ප්‍රවාහනය කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 45000 කි
  45000 Mt of cargo per annum
- ගුවන් යානා මෙහෙයුම් 30000 කි
  30000 Aircraft Movements per annum
- ගුවන් යානා නැවතුම් අංගන 10 කි
  Ten Parking bays for Aircrafts
- ගුවන් මගී පාලම් 02 කි
  02 Aero bridges

The airport's development cost US$ 209 million. Eight hundred hectares of land had been used for the first phase, and 1,200 hectares will be used for the second phase.



දෙවන අදියර

## STAGE I

- වසරකට මගීන් මිලියන 05 ක් සඳහා පහසුකම් සැපයීමේ හැකියාව ඇත.
  05 million passengers per annum
- වසරකට ප්‍රවාහනය කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 150000 කි
  150,000 Mt of cargo per annum
- වසරකට ගුවන් යානා මෙහෙයුම් 45000 කි
  45,000 Aircraft Movements per annum
- ගුවන් යානා නැවතුම් අංගන 20 කි
  Twenty Parking bays for Aircrafts
- ගුවන් මගී පාලම් 15 කි
  15 Aero bridges





FEATURE

ගුවන් සේවා ක්ෂේත්‍රය හා සංචාරක ක්ෂේත්‍රය යනු ගහට පොත්ත මෙන් බැඳී ඇති, රටක පවතින වටිනාම ක්ෂේත්‍රයන් දෙකකි. එබැවින් ගුවන් තොටුපළද සමඟින් සංචාරක ක්ෂේත්‍රය ශීඝ්‍ර වර්ධනයක් පෙන්වනු ඇත. විශේෂයෙන් දකුණු පළාත යනු ශ්‍රී ලංකාව තුළ වෙනස්ම දේශගුණික තත්වයන් පවතින කළාපයකි. මෙහිදී මුහුදුබඩ ප්‍රදේශයන්හි සංචාරක හෝටල් සඳහා මින් අත්වන වාසිය අති විශාලය. තවද යාල ජාතික වනෝද්‍යානය, බූන්දල ජාතික වනෝද්‍යානය වැනි ජෛව විවිධත්වය බහුල ස්ථාන, උඩවලවේ වැනි ස්ථාන ද ගුවන් මගින් පැමිණෙන සංචාරකයින්ගේ නිරන්තර අවධානය දිනා ගනු ඇත. මෙම ස්ථාන කරා පහසුවෙන් හා වේගවත්ව ළඟා වීමට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිරියේදී වඩා හොඳ පහසුකම් ලබා දිය හැකි ස්ථානයක් වන බව දැන් දැන් ඉතා පැහැදිලිය. මේ හා සමගාමීව හම්බන්තොට, සූරියවැව ජාත්‍යන්තර ක්‍රීඩාංගණයට අනාගතයේ පහසුවෙන් ප්‍රවිෂ්ඨ වීමටද මෙම ගුවන් තොටුපළ ඉතා හොඳ පිවිසුම් දොරටුවකි.

මේ සමඟින්ම කේන්ද්‍ර ගත ප්‍රදේශය තුළ දියුණු වන අනෙක් ක්ෂේත්‍රය නම් සංචාරක ක්ෂේත්‍රයයි. ගුවන් සේවා ක්ෂේත්‍රය හා සංචාරක ක්ෂේත්‍රය යනු ගහට පොත්ත මෙන් බැඳී ඇති, රටක පවතින වටිනාම ක්ෂේත්‍රයන් දෙකකි. එබැවින් ගුවන් තොටුපළද සමඟින් සංචාරක ක්ෂේත්‍රය ශීඝ්‍ර වර්ධනයක් පෙන්වනු ඇත. විශේෂයෙන් දකුණු පළාත යනු ශ්‍රී ලංකාව තුළ වෙනස්ම දේශගුණික තත්වයන් පවතින කළාපයකි. මෙහිදී මුහුදුබඩ ප්‍රදේශයන්හි සංචාරක හෝටල් සඳහා මින් අත්වන වාසිය අති විශාලය. තවද යාල ජාතික වනෝද්‍යානය, බූන්දල ජාතික වනෝද්‍යානය වැනි ජෛව විවිධත්වය බහුල ස්ථාන, උඩවලවේ වැනි ස්ථාන ද ගුවන් මගින් පැමිණෙන සංචාරකයින්ගේ නිරන්තර අවධානය දිනා ගනු ඇත. මෙම ස්ථාන කරා පහසුවෙන් හා වේගවත්ව ළඟා වීමට මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිරියේදී වඩා හොඳ පහසුකම් ලබා දිය හැකි ස්ථානයක් වන බව දැන් දැන් ඉතා පැහැදිලිය. මේ හා සමගාමීව හම්බන්තොට, සූරියවැව ජාත්‍යන්තර ක්‍රීඩාංගණයට අනාගතයේ පහසුවෙන් ප්‍රවිෂ්ඨ වීමටද මෙම ගුවන් තොටුපළ ඉතා හොඳ පිවිසුම් දොරටුවකි.

අනෙක් අතින් දකුණු පළාත යනු ජලාශ බහුලව පවතින බවට නම් දරා ඇති පළාතකි. ඈත අතීතයේදී ද ජලචර ගුවන් ගමන් සඳහා පහසුකම් සැපයීමට දකුණු ලක පිහිටි රමණීය ජලාශයන් උපයෝගී වී ඇත. එබැවින් මත්තල ගුවන් තොටුපළ ද සමඟින් ජලචර ගුවන් යානාද (Float Planes) ප්‍රදේශයේ වැඩි වශයෙන් ව්‍යාප්ත වනු ඇත. මන්ද එම සේවාව සංචාරකයිනට පමණක් නොව ශ්‍රී ලාංකීය ජනතාවටද පහසුවෙන් ආකර්ශනය කර ගත හැකි බැවිනි. එහිදී විශේෂයෙන්ම රට තුළ විවිධ ප්‍රදේශ වෙත මුහුදුබඩ මාර්ග ඔස්සේ මෙන්ම ගොඩබිම් මාර්ග ඔස්සේද පරිසර සුන්දරත්වය විඳගනිමින් ගමන් කළ හැකි වනු ඇත. එමඟින්ද ප්‍රදේශයේ ජනතාවට ඇති වන ස්වයං රැකියා අවස්ථා විශාලය.

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින්නේ එක් ජාත්‍යන්තර ගුවන් තොටුපළකි. මේ වන විට එහි ධාරිතාවද



ඉන්මවා කටයුතු සිදුකරයි. එහෙයින් මත්තල ගුවන් තොටුපළේ සාර්ථකත්වය බණ්ඩාරනායක ගුවන් තොටුපළට මහත් අස්වැසිල්ලක් වනු ඇත. මේ වන විට අභ්‍යන්තර ගුවන් ගමන් කර්මාන්තය (Domestic Aviation) රටපුරා විහිදීයාම හේතුවෙන් මෙම ගුවන් තොටුපළ ඒම අවශ්‍යතාවයන්ට ද පහසුකම් සපයනු ඇත.

මෙහිදී තවත් විශේෂ කරුණක් ලෙස මෙම ගුවන් තොටුපළ කේන්ද්‍ර කර ගනිමින් ගුවන් සේවාව ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් වනු ඇත. පසුගිය දා කොග්ගල කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ වූ පැරාමෝටරින් සේවා මේ සඳහා හොඳම නිදසුනයි. ආදර්ශ ගුවන් යානා භාවිතය (Model Planes), උණුසුම් වායු බැලූන (Hot Air Balloons) භාවිතය හා ග්ලයිඩර් (Gliders) භාවිතය මේ අතර වේ. මෙයින් ප්‍රදේශය තුළ සිටින පාසල් සිසුනටද දැනුම මෙන්ම විනෝදාස්වාදයක්ද ලබා ගත හැකි වනු ඇත. නිදහස් රටක් තුළ මෙවැනි ක්‍රියාකාරකම් ආරම්භ කිරීම, අනාගතය වෙනුවෙන් යහපත් නිර්මාණ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සුවිශේෂී නිර්මාණකරුවනට අවශ්‍යවන වටපිටාව සකසා දීමකි. එමෙන්ම ඉදිරියේදී ලෝකය ජයගැනීමේ දක්ෂතා වලින් පිරිපුන් දරුවනටද මෙවැනි ප්‍රයෝගික ක්‍රියාකාරකම් මගින් වඩා වැඩි අත්දැකීම් සම්භාරයක් ලබා ගැනීමේ විරල අවස්ථාවද හිමිකර ගත හැකිය.

FEATURE





FEATURE

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සමගාමීව ජාත්‍යන්තර වෙළඳාම, සංචාරක කටයුතු ප්‍රවර්ධනය, රැකියා අවස්ථා බිහිකිරීම ඉලක්ක ගත කොට ඉදිකරන මෙම ගුවන් තොටුපළෙහි ගුවන් බඩු පර්යන්තය ආසන්නයේම විශේෂ නිදහස් කලාපයක් ඇති කිරීමටත් එමගින් මෙම කලාපය තුළට ආයෝජකයින් ගෙන්වා ගැනීමටද අපේක්ෂිතය. මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළත් මාගම්පුර වරායත් සම්බන්ධ කරගනිමින් නිදහස් වෙළඳ කලාපයක්ද ඉදිකිරීමට නියමිතය. එමගින් නව රැකියා අවස්ථා 15,000 ක් පමණ බිහිවීමද මෙම ගුවන් තොටුපළ ඉදිකිරීම සමග සිදුවනු ඇත. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිවීමත් සමග මෙතෙක් ඌන සංවර්ධිත ප්‍රදේශ ලෙස සැළකූ හම්බන්තොට, මොණරාගල, අම්පාර හා මඩකලපුව යන ප්‍රදේශවල ආයෝජන පහසුකම් විවෘත වීම සහ එම ප්‍රදේශ වල කාර්මික, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අන්තර්ජාතික වෙළඳපොළ වෙත සෘජු කේන්ද්‍රස්ථානයක් ලෙස ඉදිරියේදී මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ වැඩිදුරටත් ක්‍රියාත්මක වනු ඇත.

**අතිගරු ජනාධිපතිතුමනි,**

2009 වසරේ මත්තල තිබූ කටුක වන ලැහැබ වෙනුවට යම් වන විට දැස් මවිත කරවන සුළු අති නවීන පහසුකම් වලින් සපිරි ගුවන් තොටුපළක් ඉදිවී ඇත. ඔබතුමන්ගේ උත්සාහය සාර්ථකය. එය මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් පරිදි නිල් ගුවන ජයගැනීමේ මංගල පියවර වනු නිසැකය.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලාංකීය අභිමානය ලොවට පසක් කරදීම වෙනුවෙන් දැනට ලෝකයේ භාවිත වන කුඩාම ගුවන් යානයේ සිට විශාලතම ගුවන් යානාව දක්වා පහසුකම් සැළසීමට සූදානම් වේ. ආසියාවේ සුන්දර දිවයිනක් වන ශ්‍රී ලංකාවට ඉදිරියේදී මත්තල ගුවන් තොටුපළත් සමගින් ජාත්‍යන්තරය සමග උරෙන් උර ගැටීමට අවස්ථාව හිමිවේ. එක් අතෙකින් මෙය ආශ්චර්යමත් සිදුවීමකි. මන්ද දුරාතීතයේ රජකම් කළ රාවණ රජුද එවකට ගුවන් බලය හා විශ්මිත ගුවන් යානා අංගන ඔස්සේ ලෝකයම මවිත කළ බැවිනි. එනී ප්‍රෞඩ අතීතයකට උරුමකම් කියන්නාවූ අප අන් කිසිදු රටකට දෙවැනි නොවන්නට අතීතයේද සමත්කම් පා ඇත. අප අපගේ ප්‍රෞඩ අතීතය යුධ බලයෙන් ජීවමාන කළෙමු. දැන් නිල් ගුවන ජය ගැනීමට කාලයයි. ඒ සඳහා මත්තල ගුවන් තොටින් විවිධ පන්නයේ සුවිසල් ගුවන් යානා නිල් ගුවන කරා නික්මෙනු ඇත. එය මුළුමනින් ශ්‍රී ලාංකීය ජනතාවගේම ජයග්‍රහණයකි.





# රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙන් ශක්තිමත් වූ චීන ශ්‍රී ලංකා මිතුදමක මහිමය

දිවයිනක් වූ ශ්‍රී ලංකාව පුරාතනයේ සිට ලෝකයේ සෙසු රටවල් සමග 'නාවික සබඳතා' පැවත් වූ අතර පෙර අපර දෙදිග යා කරන ඓතිහාසික සේද මාවතේ ප්‍රධාන රාජ්‍යක් වූ මහජන චීනය ද අතීතයේ සිට ශ්‍රී ලංකාව සමග මිත්‍ර සබඳතා පවත්වන ලදී. ක්‍රි ව 5 වන සියවසේ දී අනුරාධපුරයේ රජ කළ මහානාම රජ දවස සේද මාවත ඔස්සේ ලංකාවට පැමිණි පාහියන් භික්ෂුව මුල්කිරිගල පාහියන් ලෙනෙහි නවාතැන් ගත් බව හා ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු මහජන චීනය වෙත රැගෙන ගිය බව ඉතිහාසයට එක් වී ඇති අතරම ඇත ඉතිහාසයට දිව යන චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය වර්තමානයේ දී උච්ච ස්ථානයට පැමිණ ඇති අද දින විවෘත වන රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ද ඓතිහාසික චීන ශ්‍රී ලංකා මිතුදම ලොවට හඬ නගා කියන ජීවමාන සාක්ෂියකි.

1950 දශකය චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය ශක්තිමත් වූ දශකයක් ලෙස සැළකිය හැකිය. 1952 ඇති වූ චීන ශ්‍රී ලංකා රබර් සහල් ගිවිසුමද අප දෙරට අතර මිත්‍රත්වය වඩා තහවුරු කිරීමට සමත්විය. එම කාලයේම ආරම්භ වූ චීන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය මගින් අප දෙරටෙහි සබඳතාව වඩා රාජ්‍යතාන්ත්‍රික බවක් ඇති කිරීමට සමත් විය. මෙම සංගමයේ ආරම්භක සභාපති ලෙස එවකට අවිස්සාවේල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය කුසුමා ගුණවර්ධන මැතිණිය ඉටු කළ කාර්යභාරය කෘතවේදීව සිහිපත් කළ යුතුය. චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය තවත් ශක්තිමත් කරමින් 1957 චීන අග්‍රාමාත්‍ය චෞ ඇන්ලායි (Zhou Enlai) මහතා ශ්‍රී ලංකා සංචාරයකට සහභාගී විය. 1956 දී බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු රජයේ විදේශ ප්‍රතිපත්තිය වඩා අර්ථවත් කරමින් 1957 වන විට ශ්‍රී ලංකාවත් චීනයත් අතර තානාපති සබඳතා ආරම්භ කිරීමට හැකි විය. එම තානාපති සබඳතාවයන් වලට දශක 5 කට වඩා වැඩි කාලයක් ගත වී ඇති අතර එම කාලය තුළ ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් මහජන චීන සමූහාණ්ඩුව විශාල සහායක් ලබා දෙන දී ඇත. ඒ අනුව ඉදි කළ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, උසාවි සංකීර්ණය, යනාදිය ඉදිකරන ලදි.

වර්තමානයේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ චීන ජනාධිපති හූ ජින්තාවෝ (Hu Jintao) මැතිතුමා අතර ඇති සමීප මිතුදම ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශාල ශක්තියක් ලබා දී ඇත. මෑත ඉතිහාසයේ මෙරට යටිතල පහසුකම් සංවර්ධනයේ දැවැන්ත ජයග්‍රහණයක් වූ හම්බන්තොට වරාය, නොරොච්චෝලේ බලාගාරය, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය වැනි දෑ ලබා ගැනීමට හැකි විය.

නිදහසින් පසු ශ්‍රී ලාංකිකයන් විසින් ඉදි කළ පළමු ජාත්‍යන්තර ගුවන් තොටුපළ වූ මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීමේ සිහිනය සැබෑ කර ගැනීමට මහජන චීන සමූහාණ්ඩුව පළමු අදියර සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 209 ක මුදලක් ලබා දීම වැදගත් සංධිස්ථානයකි. මහින්ද චින්තන ඉදිරි දැක්ම මත පදනම් වූ ශ්‍රී ලංකාව ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ සැලසුම් සාධනය ගමන් මග සාර්ථක කර ගැනීමට මෙම ජාත්‍යන්තර ගුවන් තොටුපළට හැකි වනු ඇත. මෙවැනි යටිතල පහසුකම් සංවර්ධනයට මෙන්ම මෙරට ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට ද මහජන චීනය ලබා දෙන සහාය අප ගෞරවයෙන් සිහිපත් කළ යුතුය. විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිෂේද බලය ඇති රටක් ලෙස චීනය අපට ලබා දෙන සහය වෙනුවෙන් ශ්‍රී ලාංකීය ජනතාවගේ ගෞරවයද මහජන චීන සමූහාණ්ඩුව වෙත පිරිනැමිය යුතුය.

කෝටි 130ක ජනගහනයකින් සමන්විත වර්ග කිලෝ මීටර් මිලියන 96 ක භූමි ප්‍රමාණයක පැතිරුණු ආසියාවේ විශාලතම රට වන චීනය ලෝකයේ නැගී එන ආර්ථික බලවතා බවට පත්වීම අප වැනි සංවර්ධනය වන රට වලටද සුබදායක වනු ඇත.

**බුද්ධික රූපසිංහ**
ගරු සිවිල් ගුවන් සේවා
නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්

FEATURE

# හම්බන්තොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ

## පණිවිඩය



**ආර් ඩබ් අමරවංශ**
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය හම්බන්තොට

**ඈත අතීතයේ ඉතා අසීරුවෙන් ජල බිඳක් පවා සොයා ගත නොහැකිව හේන් ගොවිතැන ජීවනෝපාය කරගත් ගොන්නොරුව, අන්දරවැව, මත්තල යන ප්‍රදේශ වල දුෂ්කර ජීවිත ගත කරමින් රටේ සංවර්ධනයට උරදුන් දුප්පත් ජනතාවගේ දහඩිය සුවඳ මුසු සුළඟින් සුවඳවත් වූ මත්තල ගුවන් ගැබ ජය ගැනීමට හැකි වීම එකී ජනතාවගේ දූ දරුවන්ට ද නව ලොවක් විවර කරන්නට සමත් වේ යැයි මම විශ්වාස කරමි.**

ශ්‍රී ලංකාද්වීපයේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ මත්තලින් ජනතා අයිතියට පත්වන 2013 මාර්තු 18 වන දින ශ්‍රී ලංකා ගුවන් සේවා ක්ෂේත්‍රයටම ඓතිහාසික දිනයකි. එවන් මොහොතක සුභාසිංශන සනිටුහන් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳ සතුට පළ කරමි.

ගරු කථානායක චමල් රාජපක්ෂ මැතිතුමාගේ අදහසකට අනුව හම්බන්තොට ප්‍රදේශයේ ගුවන් සේවාව පිළිබඳ ජනතාව සහ පාසල් දරුවන් දැනුවත් කරමින් ඔවුන්ට එහි වැදගත්කම සහ ප්‍රයෝජනවත් බව පැහැදිලි කරදීම ජාතික අවශ්‍යතාවයක් බව වටහා ගෙන කටයුතු කිරීම පිළිබඳව සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපන ඒකකයට ස්තූතිවන්ත වෙමි.

අප රටේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යයක් වූ ගුවන් සේවය දකුණු ආසියාවේ ප්‍රථමයා බවට පත් වෙමින් අභිමානවත් ලෙස නැගී සිටිමින් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළකට හිමිකම් කීමට හැකියාව ලැබීමත්, ශ්‍රී ලාංකීය ජාතියක් ලෙස අපහට මහත් ආඩම්බරයකි.

ඈත අතීතයේ ඉතා අසීරුවෙන් ජල බිඳක් පවා සොයා ගත නොහැකිව හේන් ගොවිතැන ජීවනෝපාය කරගත් ගොන්නොරුව, අන්දරවැව, මත්තල යන ප්‍රදේශ වල දුෂ්කර ජීවිත ගත කරමින් රටේ සංවර්ධනයට උරදුන් දුප්පත් ජනතාවගේ දහඩිය සුවඳ මුසු සුළඟින් සුවඳවත් වූ මත්තල ගුවන් ගැබ ජය ගැනීමට හැකි වීම එකී ජනතාවගේ දූ දරුවන්ට ද නව ලොවක් විවර කරන්නට සමත් වේ යැයි මම විශ්වාස කරමි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් අගනුවරට පමණක් සීමා වූ එහෙත් රටේ සංවර්ධනයේ ප්‍රධාන දොරටුවක් වූ මෙවන් යෝධ පියවරක් මත්තලට ගෙන ඒම දෑස් වනමින් ඉහළ අහසේ පියාසර කරන අහස් යානා දෙස බලා සිටි හම්බද ජනතාවට කරනු ලැබූ ගෞරවයක් මෙන්ම ඔවුන්ට ගුවන් සේවාව පිළිබඳ දැනුවත් වීමට ලබා දුන් මහඟු අවස්ථාවක් බව ගෞරවයෙන් යුතුව සිහියත් කරමි.

නමුත් ඔබතුමාගේ එම විනයාමය රජසැප සඳහා නොව රටේ අනාගතය භාර ගන්නට පෙළ ගැසී සිටින දෑයේ දරුවන් වෙනුවෙන් ඔවුන්ගේම ආඩම්බරකාර තාත්තා විසින් ලබා දුන් දායාදයක් ලෙස මම දකිමි.

මත්තල යන නාමය ජාත්‍යන්තරයේ සනාමිකෙනා නාමයක් ලෙස සනිටුහන් වේවා යනු මාගේ එකම පැතුමයි.

# හම්බන්තොට දිස්ත්‍රික් පාසල් ගුවන් සේවා සමාජ

## සම්බන්ධීකරණ නිලධාරීගේ පණිවිඩය



**රමිත් ගාමිණී විජේසිරි**
දිස්ත්‍රික් ප්‍රධාන සම්බන්ධීකාරක

**මත්තල අභිනව රාජපක්ෂ ගුවන් තොටුපළේ සමාරම්භය රුහුණු මාගම්පුර, ගිරුවාපත්තුව ප්‍රදේශයට පමණක් නොව මුළු මහත් ජාතියටම වටිනා බලාපොරොත්තු හා සෞභාග්‍ය නිසැකවම උදාකරනු ඇත.**

මත්තල අභිනව රාජපක්ෂ ගුවන් තොටුපළේ සමාරම්භය රුහුණු මාගම්පුර, ගිරුවාපත්තුව ප්‍රදේශයට පමණක් නොව මුළු මහත් ජාතියටම වටිනා බලාපොරොත්තු හා සෞභාග්‍ය නිසැකවම උදාකරනු ඇත.

දයාබර ශිෂ්‍ය ශිෂ්‍යාවනි, ඔබ සැම මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළේ සැබෑ උරුමකරුවෙකු වීම නොඅනුමානය.

හම්බන්තොට අධ්‍යාපන කලාපයේ හිටපු අධ්‍යක්ෂ වයි.කේ. පියසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සිවිල් ගුවන් සේවා සංවර්ධන හා අධ්‍යාපන ඒකකයේ පූර්ණ අනුග්‍රහයෙන් හම්බන්තොට අධ්‍යාපන කලාපයේ ආරම්භ කරන ලද ගුවන් සේවා සමාජ 46 අද වන විට වර්තමාන කලාප අධ්‍යක්ෂ ආර්.ඩබ්. අමරවංශ මැතිතුමා නිරන්තර අධීක්ෂණය යටතේ දියුණු මට්ටමකට පැමිණ ඇති බව මා පවසනුයේ අභිමානයෙන් යුතුවය.

තව ද, ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුවන් ගමන සිදුවී වසර 100 ක් පිරීම නිමිත්තෙන් අරලියගහ මන්දිරයේ දී පැවති උත්සව සභාවේ දී තිස්සමහාරාම මහා විද්‍යාලයේ සිසු දැරියකට සම්රු කථනයක් කිරීමට අවස්ථාව ලැබීම ද හම්බන්තොට අධ්‍යාපන කලාපයේ සිවිල් ගුවන් සේවා සමාජ ඒකතුව ලබාගත් ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකා මාතාව දිනෙන් දින ලබන ජයග්‍රහණ අතුරින් මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ ද සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

---



**මාස් රවිෂන්**
හ/සාමෝදාගම කණිටු විදුහල
හම්බන්තොට

මත්තල...., මත්තල මේ යැයි සිතා ගැනීමට පවා මට නම් නොහැකිය. මහා ඝන කැලෑවෙන්, අලි ඇතුන්ගෙන් පිරී පැතිරී ගිය මහ වනය විලිපෙනෙලී විය. දිව්‍ය විමානයක් බැව් ඇත්දැයි මට සිතේ. ලංකාව ලෝකය දකින මේ අවස්ථාවේ එය දකින පරපුරේ කෙනෙකු වීමට හැකිවීම මහත් ආඩම්බරයකි.

මා කුඩා දරුවෙකු ලෙස ඈත අහසේ අහස් යානා දකිද්දී කෑකෝ ගසමින් එය නොපෙනී යන තෙක් එය පසුපස දිව ගිය අතීතය සිහිනයක් දැයි මට සිතේ.

මේ මහා සංකල්පය මැවුනේ අතිගරු ජනපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සිතේය. අද එය සැබෑවක් වී ඇත. රට දියුණුව කරා පිය නගන දොරටුවක් විවරව ඇත. අදින් පසු හම්බන්තොට කාන්තාර පොළොවට ගුවනින් විදේශ විනිමය රැගෙන මෙරටට ඇදී එන ව්‍යාපාරිකයන්ගෙන්, ආයෝජකයින්ගෙන් මේ බිම අස්වැද්දෙනු ඇත. එහි සම්පූර්ණ ආඩම්බරය රට වැසියන් වන අපටත්, මේ සිතුවිල්ල ජනිත වූ සිතටත්, එනම් ජනපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සිතටත් දැනෙනු නොඅනුමානය.

රට සංවර්ධනය කරමින් ලෝකය ඉහළම ස්ථානයකට රැගෙන යන එක් දොරටුවක් ලෙස මත්තල ගුවන් තොටුපළ දිනෙන් දින දියුණුව කරා පිය නගමින් යෙහෙන් වැජඹේවායි හ/සාමෝදාගම කණිටු විදුහලේ ශිෂ්‍යයෙකු වශයෙන් සහ අනාගත හම්බන්තොට නගරයේ පුරවැසියෙකු වශයෙන් මාගේ අභිංසක පැතුමයි.



## ආර් ඒ ශෂිකා අවන්ති

සිවිල් ගුවන් සමාජය, සුචි ජාතික පාසල
හම්බන්තොට

මා හම්බන්තොට සුචි ජාතික පාසලේ 11 වසරේ ඉගෙනුම ලබන සිසුවියක්මි. දේශයට නව ජීවයක්, ආලෝකයක් ලබාදුන් අතිගරු ජනපතිතුමන් විසින් හම්බන්තොට වැනි දුෂ්කර දිස්ත්‍රික්කයක මෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ඉදිකිරීම පිළිබඳව මා පළමුව එතුමාට හදපිරි ස්තූතිය පුද කරමි.

අධ්‍යාපනික කටයුතු සඳහා ගුවන් තොටුපළවල් පිළිබඳව කරුණු සෙවීමට සිදුවූ අවස්ථාවන් හිදී අන්තර්ජාලය භාවිතයෙන් අපි තොතුරු සොයාගත්තේ ඒ වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයට ගොස් ගුවන් යානා අහසේ සැරිසරනා අයුරු තම දෙනෙතින් දැක තමන්ට හැගෙන අදහස කෙසේද යන්න පිළිබඳව දැකගැනීමට තිබූ නොහැකියාව නිසාමයි.

අධ්‍යාපනික සුදුසුකම් තිබෙන රැකියා විරහිත තරුණ/ තරුණියන්ට මෙන්ම කුසලා පූර්ණ රටේ අහිංසක දුප්පත් ජනතාවට ද රැකියා පිළිබඳව සැබෑ සිහින සිත්තුළ ඇතිකරගත හැකිය යන සතුටු ආරංචිය මුළු ලක්දිව පුරා පැතිරවීමේ අරමුණ ඇතුව මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ නිර්මාණය විණැයි සුචි ජාතික පාසලේ දියණියක් වශයෙන් මාහට හැගෙයි.

හම්බන්තොට දිස්ත්‍රික්කයට ඈලලී තිබෙන දුෂ්කරය යන වචනය සමීදත්‍යෝගයෙන් ඉවත් වී කොළඹට මෙන්ම අපට ද එක හා සමාන සළකන සමාජයක් ඉදිරියේ දී බිහිවනු ඇතැයි මා සිතමි.

මත්තල ගුවන් තොටුපොළ ජනතා අයිතියට පැවරීම තුළින් රටක් සංවර්ධනය වීමත් සමග ප්‍රධාන වශයෙන් ආදායම් මාර්ග බිහිවේ. මත්තල ගුවන් තොටුපොළ ජනතා අයිතියට පැවරීමත් සමඟ විදේශ සංචාරය ද අතිවිශිෂ්ට ලෙස සංවර්ධනයට ලක්වේවා යන උතුම් ප්‍රාර්ථනය පාසල් සිසුවියක් වශයෙන් මා පතමි.

කිසිදා නොදැකපු අපේ පුංචි නෙත්වලට මෙවැනි සුන්දර දසුන් දැකබලා ගතහැකිවීම මා ලැබූ භාග්‍යයකි. මෙවැනි උදාර වටිනා සම්පත් බිහිකර ජනතා අයිතියට පවරා දීම පිළිබඳව සුචි ජාතික පාසලේ සිසුවියක් වශයෙන් අපේ අනාගත දියුණුවේ මංපෙත් විවර කළ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මගේ හදපිරි ස්තූතිය පුද කරමි.



## එස්.පී. දිලිනි ශනනිකා ජයතිස්ස

හ/පහළ අන්දරවැව කනිටු විද්‍යාලය

"සුබ අනාගතයක් ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක්" යන්න අප ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ මුඛයේ නිරන්තරයෙන් රැඳුණු වචන මාලාවයි. දුෂ්කර ගම්මානයක් වන පහළ අන්දරවැව ගම් පියසේ පහළ අන්දරවැව කනිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබන මා හට එම වචන එතරම් සමීප නොවුණි. එහෙත් සැබෑ ජන නායකයෙකු, පියෙකු, තම රට, දරුවන් පිළිබඳව මෙතරම් සිතා බලා කටයුතු කිරීම නිසාවෙන් ඒ වචන සිහිනයක් නොවී සැබෑවක් වී ඇත.

මත්තල බිහි වූ ජාත්‍යන්තර ගුවන් තොටුපළ අප වැනි කැලෑවේ සුපිපෙන මල් කැකුළුවලට ඉඩෝරයට වට මල් වැස්සක් වැනිය. ගම්මුන්ගේ ද ආර්ථිකය එමගින් ශක්තිමත් විය. අද අප දියුණු දෙනාම අනාගතය පිළිබඳ සුබ සිහින දකින්නෙමු. ගුවන් යානයක් ළංව දැකීම පවා සිහිනයක්ව පැවති අප අද ගුවන් සේවිකාවක්, ගුවන් නියමුවෙකු වීමේ මාවතට පියමනින්නට අවැසි සුදුසුකම් සපිරීමට මග සොයන්නෙමු. සංචාරක හා විවිධ ව්‍යාපාරය ආදී ක්ෂේත්‍ර සඳහා මංපෙත් විවර වන අයුරු දක්නා විට මා හට ඇත්තේ අපමණ සතුටකි.

**'සිහන සැබෑ කළ අපේ**
**ඔබයි ජනපති අප රටේ**
**රකිත්වා සියලු දෙවි විසින්**
**ආයු වළඳන්නට ඉකුත් වූ සියවසක්'**



**තරිඳු සුරාජ් චතුරංග**
සභාපති

# ගුවන් පියාසර සංගමය
## කොළඹ, ආනන්ද විද්‍යාලය

රාවණාගේ දඬුමොනරයෙන් ඇරඹි ශ්‍රී ලංකාවේ ගුවන් ගමන නව මගකට එළඹෙන මොහොතේ දී ආනන්ද විද්‍යාලීය ගුවන් තාක්ෂණ සංගමය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකමි.

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවයට වසර 100 ක් පිරීමත් සමග විවෘත වන මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ මගින් අප රට ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත්වනු නිසැකය. මෙලෙස නව මගකට යොමුවන ගුවන් සේවය මගින් පාසල් ගුවන් සේවා සමාජ සඳහා විශාල පිටුවහලක් සපයන බව අපගේ විශ්වාසයයි.

මේ දිනවල වැදගත් මාතෘකාවක් බවට පත්ව ඇති මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිළිබඳව සොයාබලන සිසුන්, මේ ක්ෂේත්‍රයේ ඇති නව වර්ධනයන්, රැකියා අවස්ථා පිළිබඳව දැනුවත් වනු ඇත. එමගින් ඔවුන් ගුවන් යානා ඉංජිනේරුවන්, ගුවන් නියමුවන් බවට පත්වීම සඳහා තම පාසල් කාලය තුළ සිටම පියවර තබනු ඇත. මේ සඳහා ඔවුන්ට පිටුවහලක් සැපයීමට තරම් කොහෙත් ගුවන් සේවා සමාජ ශක්තිමත්ව තිබීම සතුටට කරුණකි.

මෙලෙස ශ්‍රී ලංකාවේ ගුවන් සේවයේ සිදුවන වර්ධනයන් සමග, මෑතක් වන තුරුම ගුවන් තාක්ෂණය පිළිබඳ සිද්ධාන්ත අධ්‍යයනයට පමණක් සීමාවී තිබූ අප සංගමය මේ වන විට ශ්‍රී ලංකා ගුවන ජයගෙන ඇත. පාසල් කාලයෙන් පසුව අප සාමාජිකයන් ලබා ඇති දුරස්ථ පාලක ගුවන් යානා නිර්මාණය හා පියාසර කිරීමට පුහුණු වීමේ අවස්ථාව මෙහිදී වැදගත් කොට සලකමු.

අප සහෝදරයන් අතින්ම නිපදවූ ගුවන් යානා ඔවුන් විසින්ම දුරස්ථ පාලක මගින් පියාසර කරවන විට ඇතිවන්නේ නිහතමානී ආඩම්බරයකි. කුඩා කල සිටම මෙලෙස දක්ෂතා පෙන්වන සිසුන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත වීමත් සමග නව නවත් උනන්දුවට පත්වනු ඇත. කාඩ්බෝඩ්, ප්ලාස්ටික් යොදාගෙන ගුවන් යානා නිර්මාණය කරන අපේම සහෝදරයින් අනාගතයේ ශ්‍රී ලංකාව තුළ ගුවන් යානා නිපදවීමේ සමාගම් ආරම්භ කිරීමට පුරෝගාමී වනු ඇත.

කලකට ඉහතදී පැවති යුද්ධමය වාතාවරණය හේතුකොට ගෙන පනවා තිබූ නීති රීති හේතුවෙන් පාසල් ගුවන් සේවා ක්ෂේත්‍රය පසුබෑමකට ලක්ව තිබුණි. නමුත් දැන් ඒ සියල්ලක්ම අවසන්ව ඇත. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මේ වනවිට ආරම්භ කර ඇති දුෂ්කර පාසල් දැනුවත් කිරීමේ හා ගුවන් සේවා සමාජ ආරම්භ කිරීමේ ව්‍යාපෘතියද මෙහිදී අගය කළ යුතුය. මෙතෙක් කලක් කොළඹ ප්‍රදේශයේ පාසල් කිහිපයකට සීමාවූ ගුවන් තාක්ෂණය ඉතාමත් කෙටි කලක දී අනෙකුත් ප්‍රදේශ වල පාසල් වලද පැතිර යනු ඇත.




Sri Lanka

Future **Aviation Hub** in Asia

# Mattala As A Potential SPACEPORT

## මත්තල අනාගතයේ **අජටාකාශ මධ්‍යස්ථානයක්** ලෙස දියුණු කළ හැකියි

**The opening of the Mattala airport, with it Code F runway (60m x 3.5 km; suitable for Airbus A380s) provides another opportunity for Sri Lanka beyond the obvious benefit of having a second international airport. If you are reading this while at Mattala airport, you may not realize that you are travelling eastward at 1,664 kph! It is Mattala's rotation speed which is only about half a percent less than the earth's maximum equatorial rotation speed that makes Mattala a potentially attractive spaceport.**



Tilak **Dissanayake**

Sri Lanka's location is a geographical blessing in many ways. Its strategic location as a maritime hub has been evident for many centuries.

The opening of the Mattala airport, with it Code F runway (60m x 3.5 km; suitable for Airbus A380s) provides another opportunity for Sri Lanka beyond the obvious benefit of having a second international airport. If you are reading this while at Mattala airport, you may not realize that you are travelling eastward at 1,664 kph! It is Mattala's rotation speed which is only about half a percent less than the earth's maximum equatorial rotation speed that makes Mattala a potentially attractive spaceport.

Traditionally, getting spacecraft, whether they be satellites or manned capsules, into space has been done from the ground on rockets that are launched vertically. These rockets are hazardous since they contain large amounts of highly combustible propellants and also produce noxious emissions . Thus, ground launch site are located far away from populated areas because of the aforementioned dangers. Additionally, since the earth's rotational speed can be used to advantage to launch a satellite

into low inclination (relative to the equator) orbits, it is better to have the launch site as close to the equator as possible. Therefore, Kourou (5 latitude) and Kwajalein Atoll (8 latitude) are launch sites favored by commercial launch operators for low inclination orbit satellite launching.

However, there is an emerging trend in rocket launching. Referred to as "air launch", it is less expensive, safer and environmentally friendlier to have the rocket carried aloft by a 'mothership' aircraft to about 50,000 feet and then released in mid air before igniting its rocket engines to carry it into space.

The pioneer in the commercialization of this air launch approach is Richard Branson's Virgin Galactic. Virgin Galactic uses a mothership (WhiteKnightTwo) designed by the famed Burt Rutan's Scaled Composites company to ferry aloft a reusable rocket called SpaceshipTwo which can carry six space tourists and a crew of two on a sub-orbital flight to the edge of space. Over 500 space tourists have signed up for the $200,000 flight which will allow them to experience 5 minutes of weightlessness during a parabola shaped flight into space. The first space tourist flights are expected to start in early 2014 from a purpose built Code F runway airfield in New Mexico, USA named Spaceport America.

Additionally, NASA has signed a contract with Virgin Galactic to use SpaceshipTwo to conduct science experiments. SpaceshipTwo can carry almost 600 kg of experimental equipment.

Recently, Virgin Galactic announced a new space craft named LauncherOne which can carry a small satellite (225 kg) to low earth, low inclination orbit or a smaller (100 kg) satellite to low earth, high inclination, sun synchronous orbit. LauncherOne is expected to revolutionize the cost of launching satellites and is expected to commence commercial operations in 2016.

Finally, StratoLaunch is using a similar air launch approach, but on a much bigger scale. They will mate two Boeing 747 airplanes together to make the world's largest airplane with a wing span of 117m (the Airbus A380 is 80m). The mothership will be able to carry aloft a rocket that weighs up to 220,000 kg, and mothership test flights are expected to commence in 2017.

In addition to having available a brand new Code F runway at Mattala, which is ideally located for the motherships to operate out of, Sri Lanka also has a very large FIR (Flight Information Region) of almost 98,000 sq. km (with much of it over water) with relatively low air traffic making it ideal to use for space launches.

So Mattala is indeed a well suited site for space tourism, space research flights and for commercial satellite launching.

**In addition to having available a brand new Code F runway at Mattala, which is ideally located for the motherships to operate out of, Sri Lanka also has a very large FIR (Flight Information Region) of almost 98,000 sq. km (with much of it over water) with relatively low air traffic making it ideal to use for space launches.**



FEATURE

# ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා ආරක්ෂක විගණනය

## Universal Security Audit Programme



දේවි සමරජීව

ගුවන්සර තෙවන කලාපය මඟින් ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතා විගණනය (Universal Safety Oversight Audit Programme ) පිළිබඳ ඔබව දැනුවත් කළ අතර මෙවර කලාපයෙන් එහි දෙවන කොටස වශයෙන් සැළකෙන සිවිල් ගුවන් සේවා ආරක්ෂාව සම්බන්ධව 2012 මැයි මස 24 වන දින සිට 31 වන දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ ජාත්‍යන්තර විගණනය පිළිබඳ දැනුවත් කිරීමට අදහස් කළෙමු.

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (International Civil Aviation Organization - ICAO) මඟින් සෑම සිව් වසරකටම වරක් තම සාමාජික රටවලහි සිවිල් ගුවන් සේවා ආරක්ෂාව පිළිබඳ විගණනයක් පවත්වනු ලැබේ. මෙම විගණනය විශ්ව සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන. (Universal Security Audit Programme) යටතේ පවත්වනු ලබන්නකි.



ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා විගණන නිලධාරීන් සමඟ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් එච් එම් සී නිමල්සිරි මහතා

**අන්තර්ජාතික සිවිල් ගුවන් සේවාවට හඳුන්වා දී ඇති චිකාගෝ සම්මුතියෙහි එන ඇමුණුම් 18 හි අන්තර්ගත ප්‍රමිතීන් හා නිර්දේශයන් අනුගමනය කිරීම සියලුම සාමාජික රටවල් විසින් සිදු කළ යුතුව ඇත. මෙහිදී චිකාගෝ සම්මුතියට අදාළ සිවිල් ගුවන් සේවා ආරක්ෂාව පිළිබඳ වූ 17 වන ඇමුණුම** (Annex 17 - Security) **හා ඇමුණුම් 09** (Annex 09 - Facilitation) **හි ආරක්ෂාවට අදාළ අංශයන් වෙනුවෙන් මෙම විගණනය පවත්වන ලදි.**

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවාවට හඳුන්වා දී ඇති චිකාගෝ සම්මුතියෙහි එන ඇමුණුම් 18 හි අන්තර්ගත ප්‍රමිතීන් හා නිර්දේශයන් අනුගමනය කිරීම සියලුම සාමාජික රටවල් විසින් සිදු කළ යුතුව ඇත.

මෙහිදී චිකාගෝ සම්මුතියට අදාළ සිවිල් ගුවන් සේවා ආරක්ෂාව පිළිබඳ වූ 17 වන ඇමුණුම (Annex 17 - Security) හා ඇමුණුම 09 (Annex 09 - Facilitation) හි ආරක්ෂාවට අදාළ අංශයන් වෙනුවෙන් මෙම විගණනය පවත්වන ලදි. එහිදී චිකාගෝ සම්මුතියේ, ඇමුණුම 17 සහ ඇමුණුම 09 හි අඩංගු ප්‍රමිතීන් හා නිර්දේශයන් ප්‍රධාන මූලික අංග/නිර්ණායක අටක් (08 critical elements) ඔස්සේ විමර්ශනයට ලක්වුණි.

1. ගුවන් සේවා මූලික නීතිය (Aviation Security Legislations)
2. ගුවන් සේවා වැඩසටහන් හා රෙගුලාසි (Aviation Security Programme & Regulations)
3. ගුවන් සේවාව පිළිබඳ වූ රාජ්‍ය අධිකාරිය හා එහි වගකීම (State appropriate Authority for Aviation Security & its responsibilities)
4. පුද්ගල සුදුසුකම් හා පුහුණුවීම (Personnel Qualifications & Training)
5. තාක්ෂණික මඟපෙන්වීම්, උපකරණ සහ ආරක්ෂක තොරතුරු සැපයීම (Provision of Technical Guidance, Tools & Security critical information)
6. බැඳුම්කර අනුමත කිරීම හා සහතික කිරීම (Certifications & approval obligations)
7. තත්ව පාලන බැඳුම්කරයන් (Quality Control Obligations)

8. සුරක්ෂිතභාව පිළිබඳ කරුණු කාරණා විශ්ලේෂණය හා නිවැරදි කිරීම (Resolution of Security Concerns)

මෙම ප්‍රධාන නිර්ණායක 08 සිවිල් ගුවන් සේවාවේ ආරක්ෂාවට අදාළ සියළු ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වන ආකාරය ගැඹුරින් පරීක්ෂා කර බැලීමේ පහසුව තකා සිවිල් ගුවන් සේවා ආරක්ෂක ක්ෂේත්‍රය අංශ 09 ට බෙදා ඇත.

1. ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂණ නියාමන රාමුව (Regulatory Frame work and the National Civil Aviation Security System)
2. ගුවන් සේවා ආරක්ෂණ සේවා නියුක්තියන්ගේ පුහුණුවීම (Training of Aviation Security Personnel)
3. තත්ව පාලන ක්‍රියාදාමයන් (Quality Control Functions)
4. ගුවන් තොටුපළ ආරක්ෂණ මෙහෙයුම් (Airport Operations)
5. ගුවන් යානා සහ ගුවනේ දී යානා තුළ ආරක්ෂක කටයුතු (Aircraft & in-flight Security)
6. මගීන් සහ ගමන් මළු සඳහා වූ ආරක්ෂාව (Passenger & Baggage Security)
7. ගුවන් බඩු, ගුවන් කෑපැල සහ ගුවන් යානා වලට ආහාර සැපයීමේ කටයුතු වලදී ලබාදෙන ආරක්ෂාව (Cargo, Catering & Mail Security)
8. නීති විරෝධී මැදිහත් වීමේ ක්‍රියාවන්ට ප්‍රතිචාර දැක්වීම (Response to Acts of Unlawful Interference)
9. ගුවන් ප්‍රවාහනය සඳහා පහසුකම් සලසන අතරම එහි ආරක්ෂිත බව පවත්වාගෙන යාම (Security Aspects of Facilitation)

එක් එක් අංශයන් තුළ ඉහත සඳහන් කරන ලද ප්‍රධාන නිර්ණායකයන් මනා ලෙස ක්‍රියාත්මක වේදැයි විගණනය තුළදී විශ්ලේෂණය කරනු ලබයි.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී එච් එම් සී නිමල්සිරි මහතාගේ අධීක්ෂණය යටතේ විගණනය සම්බන්ධව සියළු කටයුතු සූදානම් කිරීමේ වගකීම පැවරී තිබුණේ වැඩසටහනේ ජාතික සම්බන්ධීකාරක ලෙසින් පත් කොට තිබූ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා විගණන පරීක්ෂකවරයකු සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කරනු ලබන පී ඒ ජයකාන්ත මහතා වෙතය. එහිදී මෙම භාරදූර කාර්යය සාර්ථක කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, ගුවන් ආරක්ෂක අංශයේ සේවය කරන ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රවීණ නිලධාරීන් මෙන් හා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ගුවන් සේවා ආරක්ෂක අංශයට අනුයුක්ත කළ උපාධිධාරීන්ගේ මෙන්ම එම අංශයේ සේවය කරන සියළුම නිලධාරී මහත්ම/මහත්මීන්ගේ දායකත්වය මේ වෙනුවෙන් නොඅඩුව ලැබී තිබිණි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට අමතරව, සිවිල් ගුවන් සේවා කටයුතු වලට සම්බන්ධ ප්‍රධාන ආයතන වන ශ්‍රී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකන්, මිහින් ලංකා, එම්සර්විස් යන ගුවන් සමාගම්ද මෙම විගණනයට ලක්වූ අතර සිවිල් ගුවන් සේවා ආරක්ෂාව හා සබඳතා පවතින ආගමනවිගමන දෙපාර්තමේන්තුව, ජාතික බුද්ධි අංශය සහ ශ්‍රී ලංකා රේගුව යන රාජ්‍ය ආයතනයන් හි යම් යම් අංශයන්ද මෙම විගණනයේ දී නිරීක්ෂණයට ලක්විය.

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ උපරිම මගී ධාරිතාවය වන මගීන් මිලියන 06 ක ප්‍රමාණය ඉක්මවා ගොස් ඇති නිසා එහි දෙවන අදියරේ ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කරන බව සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න මහතා පවසයි. මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් සැපයීමට එකඟවී ඇති ජපාන ජයිකා ආයතනයත් උපදේශන සේවා සැපයීමට එකඟත්වය පළ කොට ඇති ජපාන එයාර්පෝට් කන්සල්ටන් ආයතනය සමග සාකච්ඡා කොට හැකි ඉක්මනින් ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා බවද අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන අදියර 2015 ඉදිකොට අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර මේ සඳහා භාණ්ඩාගාරයෙන් ඇමරිකානු ඩොලර් දශලක්ෂ 100 ක් ලබාදීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී බී ජයසුන්දර මහතා එකඟවී ඇති බවත් එහිදි අමාත්‍යවරයා පැවසීය.



# සිනමන් එයාර් ගුවන් සමාගම මාර්තු මසදී ඇරඹෙයි
# 'CINNAMON AIR'
## domestic air taxi service

NEWS



සිනමන් එයාර් ගුවන් සමාගම John Keells, MMBL Leisure සහ Phoenix යන සමාගම් විසින් ඒකාබද්ධව සිදුකරනු ලබන ව්‍යාපෘතියකි. මෙම සමාගම් පසුගිය දා ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කරන ලද අතර එහි මූලික ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 6.8 කි. සෙස්නා වර්ගයට අයත් ආසන 09 සහ 12 බැගින් වූ ගුවන් යානා 02 ක් භාවිත කරමින් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කේන්ද්‍ර කර ගනිමින් සිය අභ්‍යන්තර ගුවන් මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතය. මවුන්ගේ බලාපොරොත්තුව වන්නේ අවම මිළක් සහිතව ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර සහ දකුණේ සුන්දර ප්‍රදේශ වෙත සිය මගීන් රැගෙන යාමය.

The start-up fleet will consist of two Cessna 208 Caravan Amphibian aircrafts (seating 09 passengers each) and Cessna 208B Grand Caravan aircraft (seating 12 passengers) that would provide the flexibility for the airline to operate from any of the domestic and international airports as well as from water aerodromes in Sri Lanka.

# ශ්‍රී ලංකා ගුවන් සේවාවට වසර 100 සපිරීම නිමිත්තෙන් දරුවන් 125 දෙනකුට ගුවන් සවාරියක්

125 students join an air tour around the country with parallel to the Centenary celebrations of Aviation in Sri Lanka.

Hundred students were selected from different parts of the country and 25 students from an Art competition held to mark 100 years of island's civil aviation. The tour organized by the Sri Lankan Airlines.

ශ්‍රී ලංකා ගුවන් සේවාවට සියවසක් සපිරීම නිමිත්තෙන් වැඩසටහන් මාලාවක් ඉදිරිපත් කරන ලද අතර එහිදී දිවයිනම ආවරණය වන පරිදි තෝරා ගත් දරුවන් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් පවත්වන ලද චිත්‍ර තරගයේ ජයග්‍රාහකයින් 25 දෙනකු මෙම ගුවන් ගමන සඳහා සහභාගී විය. එහිදී අභිනවයෙන් ඉදිවන මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ නැරඹීම ඇතුළුව ශ්‍රී ලංකාව වටා ගමන් කිරීමේ අවස්ථාව ඔවුනට හිමිවූ අතර ඒ සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් UL 001 දරන A 320 වර්ගයේ ගුවන් යානය ලබා දී තිබුණි.







# තුර්කි ගුවන් සමාගම ශ්‍රී ලංකාවට

## Turkish Airlines commences operations to BIA

තුර්කි ගුවන් සමාගම පසුගිය පෙබරවාරි මස ඉස්තාන්බුල් හි සිට සිය නවතම ගමනාන්තය ලෙස බණ්ඩාරනායක ගුවන් තොටුපළ වෙත ගුවන් මෙහෙයුම් ආරම්භ කරන ලදී. එයාර් බස් 340 වර්ගයේ ගුවන් යානා යොදා ගනිමින් සිදුකරන මෙම ගුවන් මෙහෙයුම් මාලදිවයින හරහා සිදුකරනු ලබන අතර එය සතියකට ගුවන් ගමන් වාර 05 කි. ශ්‍රී ලංකාව, තුර්කි ගුවන් සමාගම සිය මෙහෙයුම් සිදුකරන 89 වන රට වන අතර 219 වන ගමනාන්තය වේ.








# ශ්‍රී ලංකන් ගුවන් සමාගම

## කාබන් දහනය අඩු කිරීමේ වෑයමක

දැනට 2%ක මට්ටමේ තිබෙන සියලු ම ගෝලීය ගුවන් යානා වායු (අංගාරිකාම්ල වායුව Carbon Dioxide) විමෝචනය වර්ෂ 2050 වන විට 2.5% දක්වා ඉහළ යා හැකි බවට ගණන් බලා ඇති බැවින් ලොව සියලු ගුවන් සමාගම් සිය වායු විමෝචනය 2050 වන විට අඩකින් අඩු කිරීමට ප්‍රතිඥා දී ඇත. තවත් වසර 50ක් ගත වන විට ගුවන් යානා මෙහෙයුම්වලින් පිටවන වායු විමෝචනය ශූන්‍ය අගයකට පත් කළ යුතු යැයි ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) ප්‍රබල පණිවුඩයක් සියලු ගුවන් සමාගම් වෙත ලබා දී ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම 2009 ජනවාරි මාසයේ දී සිය ආයතනික පරිසර ප්‍රතිපත්තිය සකස් කළේ එදිනෙදා තත්වයන් අනුව පැන නගින ප්‍රශ්න රාශියක් විසඳීම පිණිසය. එහි ලා ප්‍රධාන අවධානය යොමු වූයේ ප්‍රශස්ත භාවිතයන් අනුගමනය කිරීම තුළින් ගුවන් යානා ඉන්දන කළමනාකරණය හා අරපිරිමැස්ම කෙරෙහිය.

සේවයේ යොදවා ඇති සෑම ගුවන් යානයක ම මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිමයට පත් කෙරෙන බවට වගබලා ගැනීම සඳහා ඒවා ඉතා සමීපස්ථ ව ඇගැයීමට ලක් කෙරේ. ගුවන් යානා පිටුපසට තල්ලු කිරීමේ දී ගුවන් ධාවන පථය හා පර්යන්තය අතර ධාවනයේ දී (Taxing) ගුවනේ සිට යානා පහත් කිරීමේ දී ගොඩබැස්වීමේ දී යානා නවත්වා තිබිය දී පරිශ්‍ර බලගැන්වීම ජනක භාවිතය සහ ගුවන් යානා එන්ජින් නඩත්තුවේ දී හා ඒවා සේවා කිරීමේ දී කාර්යක්ෂමතාව වැඩි කිරීම යනාදිය දැනට ක්‍රියාත්මක කර ඇති පියවරවලින් සමහරකි. ශ්‍රී ලංකන් සමාගම විසින් ක්‍රියාත්මක කර ඇති පියවර සියල්ලම සාගේ කාබන් වායු විමෝචනය අවම කිරීමෙහි ලා දරා ඇති සැලකිය යුතු ප්‍රයත්නයක් බව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) ඉන්ධන කාර්යක්ෂමතාව පිළිබඳ නිලධාරී කණ්ඩායමක් විසින් ඇගැයීමට ලක් කර ඇත.

පරිසරය ආරක්ෂා කිරීම සඳහා සාමූහික වගකීමක් දැරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් මෙන්ම වෙනසක් ඇති කිරීම සඳහා තම තමන් විසින් කවර ක්‍රියාමාර්ගයන් ගත යුතු ද යන්න පිළිබඳ ව සිය කාර්යමණ්ඩලය, සේවාලාභීන් හා පොදු ජනතාව කෙරෙහි බලපෑමක් ඇති කිරීම සඳහා ආරම්භක ආදර්ශමත් පියවරක් වශයෙන් ශ්‍රී ලංකන් සමාගම විසින් දකුණු ආසියාවේ ප්‍රථම 'මිහිකත හිතකාමී ගුවන් ගමන' ක්‍රියාත්මක කර ඇත. ගුවන් යානයක ඉන්ධන ඉතිරිය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන එහි බර අඩු කරලිය හැකි ක්ෂේත්‍ර නිරන්තරයෙන් ම හඳුනා ගැනීම ඒ සඳහා ම කැප වූ පාරිසරික ඒකකයක් මඟින් නිරතුරු ව ම සිදුවේ. ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ දීර්ඝකාලීන අභිප්‍රාය හෙවත් අරමුණ වන්නේ සෑම ගුවන් ගමනක් ම 'මිහිකත හිතකාමී' ගුවන් ගමනක් බවට පත් කිරීමයි.

# ටයිගර් ගුවන් සමාගමේ මෙහෙයුම් ශ්‍රී ලංකාවට

## tiger airways

launched flights to Sri Lanka

සිංගප්පූරුවේ ලියාපදිංචි අඩු මිල (Low cost) ගුවන් සමාගමක් වන ටයිගර් එයාර්වේස් (Tiger Airways)

ගුවන් සමාගම පසුගිය මැයි මාසයේ සිට ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සිංගප්පූරු ගුවන් සමාගම කරනු ලබන මෙහෙයුම් වලට අමතරව මෙම ටයිගර් ගුවන් සමාගමද සතියකට ගමන් වාර 4ක් පවත්වා ගෙන යනු ඇත.

ටයිගර් ගුවන් සමාගම ශ්‍රී ලංකන් සහ සිංගප්පූරු ගුවන් සමාගම් මෙන් නොව සහන මිළට ගුවන් සේවා සපයන ගුවන් සමාගමක් වන අතර ශ්‍රී ලංකාව, එම සමාගමේ දකුණු ආසියාවේ 7 වන ගමනාන්තය වේ. දැනට මෙම සමාගම සතුව A 320 වර්ගයේ ගුවන් යානා 34 ක් ද A 319 වර්ගයේ යානා 2 ක් ද පවතින අතර 2004 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී ගුවන් සමාගම ආරම්භ කර ඇත.




# ශ්‍රී ලංකන් වවුනියාවටත්

## SriLankan Airlines opens

Sales Office in Vavuniya

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ නවතම කාර්යාලය වවුනියාවේ දී පසුගිය පෙබරවාරි මස 28 වන දා උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. නගරයේ ජනතාවට සෑම කටයුත්තක් සඳහාම සෘජුව සහභාගී වීමේ අවස්ථාව සළසමින් මෙම වසරේදී නිල වශයෙන් විවෘත වූ පස්වන සිටි ඒජන්සි කාර්යාලය මෙයයි.

SriLankan Airlines, expanding its services into regions of the country, officially opened its new Sales Office in Vavuniya providing people in the area the opportunity to transact directly with the airline in satisfying their diverse travel needs.






## ඇමරිකානු ගුවන් සමාගම සහ යුනයිටඩ් ගුවන් සමාගම එක්ව ලොව විශාලතම ගුවන් සමාගම ඇරඹීමට සූදානම් වේ

American Airlines and US Airways agree to merge, create world's biggest airline

ඇමරිකානු ගුවන් සමාගම සහ යුනයිටඩ් ගුවන් සමාගම එක්ව ඇමරිකානු ඩොලර් බිලියන 11 ආයෝජනයෙන් ලොව විශාලතම ගුවන් සමාගම ඇරඹීමට සූදානම් වේ. ඒකාබද්ධ ගුවන් සමාගම ඉදිරියේ දී ඇමරිකානු ගුවන් සමාගම ලෙස නම් කිරීමට නියමිත අතරවිහි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස යුනයිටඩ් ගුවන් සමාගමේ ඩග් පාර්කර් නම් කර ඇත.

නව ඇමරිකානු ගුවන් සමාගම සේවකයින් 95,000 ක පමණ පිරිසකගෙන් සමන්විත වන අතර ගුවන් යානා 900 පමණ භාවිත කරමින් දිනපතා ගුවන් ගමන් 3,200 පමණ සිදුකිරීමට සූදානම් වේ.

The new American would have more than 900 planes, 3,200 daily flights and about 95,000 employees

## ගුවන් යානා කළු පෙට්ටිය මෝටර් රථ වලටත්

'Black box' standards coming for cars




Federal agency wants black boxes in every new car by September 2014

මෝටර් රථ වල සිදුවන අනතුරු හඳුනා ගැනීම සඳහා ගුවන් යානා වල භාවිත වන කළු පෙට්ටිය අන්දමේ උපකරණයක් හඳුන්වාදීමට ඇමරිකානු ජාතික මහාමාර්ග සුරක්ෂිතතා පාලක මණ්ඩලය (National Highway Traffic Safety Administration) විසින් තීරණය කර ඇත. මේ වන විටත් 2013 මාදිලියේ මෝටර් රථ වල මෙම තාක්ෂණය භාවිත වීමද විශේෂයකි.

NEWS

# ශ්‍රී ලංකන් ගුවන් සමාගම **oneworld සමග එක්වෙයි**

## **Srilankan Airlines** to join

**නිලංකා** සරෝජිනී

**ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය ලෙස කටයුතු කරන ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ආසියානු මහාද්වීපය තුළ ශීඝ්‍ර සංවර්ධනයක් ළඟා කර ගනිමින් සිටින ගුවන් සේවා ජාලයක් හා එක්ව තැනුනු ගුණාත්මක මිත්‍ර සම්මුතියක් වන oneworld සම්මුතිය සමග අත්වැල් බැඳ ගැනීමට සූදානම් වේ.**

ගුවන් සේවා මිත්‍ර සම්මුතියක් (Aviation Alliance) යනුවෙන් හඳුන්වනු ලබන්නේ ගුවන් සේවා 02 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර සහයෝගය සහ ඒකමුතුකම මූලික කරගනිමින් හරවත් අයුරින් ක්‍රියාත්මක වීම සඳහා එකඟ වන කණ්ඩායමක් ලෙස හැඳින්විය හැක. දැනට ලෝකයේ පවතින ප්‍රධාන ගුවන් සේවා ගුවන් සේවා මිත්‍ර සම්මුතීන් ලෙස Star alliance, Sky team සහ Oneworld යන ත්‍රිත්වය හැඳින්විය හැක. මෙම සම්මුතීන් ප්‍රධාන වශයෙන් මගීන් (Passenger) සහ භාණ්ඩ (Cargo) ප්‍රවාහනය සඳහා යොදා ගන්නා අතර ජාත්‍යන්තර මගීන් (International Passengers) සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිය හැකි අයුරින් ක්‍රමවත්ව සැකසුන ගුවන් සේවා ජාලයක් පවතී.

මෙවැනි ගුවන් සේවා මිත්‍ර සම්මුතියක් පළමුවෙන්ම පිහිටවනු ලැබුවේ 1930 වසරේ Air New Zealand සහ American world airways අතර ලතින් ඇමරිකානු ගුවන් මාර්ග (Air route) කොටස්කරුවන් ලෙස භාවිත කිරීමට ඇතිවූ අවශ්‍යතාවයක් හේතුවෙනි.

මෙවැනි ආකාරයේ ගුවන් සේවා මිත්‍ර සම්මුතියක් ඇති කර ගැනීම තුළින් අදාළ රටට ඇති වන වාසි රැසකි.

1. **පුළුල්ව ව්‍යාප්ත වූ ගුවන් සේවා ජාලයක් ඇතිවීම**
2. **පොදු පහසුකම් බෙදාගැනීමට හැකිවීම තුළින් පිරිවැය අවම වීම**
3. **මගීන් සඳහා අත්වන ප්‍රතිලාභ**

- අවම පිරිවැය නිසාවෙන් අවම මිල
- උපරිම ගුවන් යානා පිටත්වීම් වාර සංඛ්‍යාවක්
- පහසු ළඟා වීමේ හැකියාව සමගින් උපරිම ගමනාන්ත සංඛ්‍යාවක්
- ප්‍රශස්ත සම්බන්ධතා මාරු නිසාවෙන් අවම වූ ගුවන් කාලය



ශ්‍රී ලංකන් ගුවන් සමාගම, සම්බන්ධවීමට බලාපොරොත්තු වන oneworld ආරම්භ කොට ඇත්තේ 1999 වසරේ සාමාජිකයින් 12 දෙනකු සම්බන්ධ වීමෙනි. මෙය දැනට රටවල් 150 කට ආසන්න සාමාජිකත්වයක් දරන අතර ගමනාන්තයන් 800 කට වැඩිප්‍රමාණයක් ඇතුළත්ය. මෙම oneworld සේවාව මගින් වසරකට මගීන් මිලියන 303 ක් සඳහා පහසුකම් සපයයි. ශ්‍රී ලංකන් ගුවන් සමාගම මෙම සම්මුතිය සඳහා ඇතුළත් විය හැකි ගුවන් සේවාවක් ලෙස 2012 IATA World Air Transport Summit මගින් පවත්වනු ලැබූ ඡන්දයෙන් තේරී පත් විය.

ශ්‍රී ලංකන් ගුවන් සමාගම පසුගිය වසර 3 ක් පමණ වූ කෙටි කාලය තුළදී එහි තාක්ෂණ ගුවන් යානා සංඛ්‍යාව දෙගුණයකින් පමණ ඉහළ නංවා ගැනීමට සමත්ව ඇති අතර සවදුරටත් ඔවුන්ගේ ගුවන් සේවා ජාලය හා ගුවන් යානා සංඛ්‍යාව වැඩිකරගනිමින් ජාත්‍යන්තර ගුවන් කර්මාන්තයට සිය උපරිම දායකත්වය සැපයීමට සූදානමින් සිටී. ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂකතුමා පවසන පරිදි ගුවන් සමාගමක් එහි ගුණාත්මක බව පිළිබඳව ඉහළින් සැලකිලිමත් විය යුතු අතර මෙම Alliance සඳහා එකතු වීමට ලැබීම අපට නිතැතින්ම ආඩම්බර විය හැකි කරුණකි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනයේ සඳහන් නිල් ගුවන ජය ගනිමු සංකල්පය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම දරනු ලබන මෙම ප්‍රයත්නය ජාත්‍යන්තර වශයෙන් ඉතා වැදගත් ඉදිරි පියවරක් වනු නිසැකය.




# කොරියන් එයාර් ශ්‍රී ලංකාවට

ඉෂාර **ගුණවර්ධන**

ලෝකයේ ඉහළම ගුවන් සුරක්ෂිතතාව පවතින රට වශයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ විගණනයන් මගින් තහවුරු වී ඇති දකුණු කොරියාවේ ගුවන් සේවය වන කොරියන් එයාර් සතියකට 3 වරක් කොළඹ බලා මෙහෙයුම් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. පසුගිය මාර්තු 9 වන දින මුල්ම යානය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට සිය මංගල පියාසැරිය සිදුකරන ලදි.

දකුණු කොරියාවේ ඉන්චියොන් ගුවන් තොටුපොළේ සිට කොළඹ බලා පියාසර කරන කොරියන් එයාර් ගුවන් යානය මාලදිවයින බලා ගමන් කර යළි කොළඹ හරහා කොරියාවට පියාසර කරයි.

ජපානය සහ කොරියාවේ සංචාරකයින් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමත් ශ්‍රී ලංකාවෙන් 'බූසාන්' මාර්ග කොරියාව හා ජපානය වෙත ගෙන යාමත් ඔවුන්ගේ මෙහෙයුම් වල අරමුණ බලාපොරොත්තු ලෙස සඳහන් වන අතර ඉදිරියේ දී තවත් මෙහෙයුම් වැඩි කිරීමට ද අදහස් කරයි.
දැනට ශ්‍රී ලංකන් ගුවන් සමාගම කොරියාව වෙත මෙහෙයුම් සිදු නොකරන අතර කොරියාවේ ශ්‍රී ලාංකිකයින් 26000 ක් පමණ සේවය කරයි. මේ දක්වා ඔවුන් සිය මව් රට පැමිණීමේ සිංගප්පූරුව, හොංකොං හෝ තායිලන්තය හරහා වන අතර මෙම සෘජු ගුවන් ගමන් ඔවුන්ගේ ගමන සුව පහසු වනු ඇත.





# Aircraft boneyard

## Victorville storage California

Aircraft boneyard is a term for a storage area for aircraft that are retired from service.
Most aircraft at boneyards are either kept for storage or turned into scrap metal.

භාවිතයෙන් ඉවත් කරන ලද ගුවන් යානා නවතා තිබෙන අංගනයක් මෙම ඡායාරූප වලින් පෙන්නුම් කෙරෙන අතර මෙම අංගනය පිහිටා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ, කැලිෆෝනියා හි වික්ටර්විල් නම් ප්‍රදේශයෙහි ය. මෙවැනි භාවිතයෙන් ඉවත් කරන ලද ගුවන් යානා අංගන බොහෝමයක් දකුණු ඇමරිකාවේ නිරිත දිග කාන්තාර ප්‍රදේශයන් හි පවතින අතර මෙවැනි අංගන වල භාවිතයට නොගන්නා සිවිල් මෙන්ම යුධ ගුවන් යානා බොහෝමයක් පවතී.









## 2012 වසර සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ සුරක්ෂිතම වසරයි

## 2012 Named **Safest Year** in Civil Aviation History

According to the organization's statistics, the global rate for all aircraft in service was one crash per 470,000 flights.

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ දත්ත වලට අනුව ගුවන් අනතුරු වල අවම මට්ටම හේතුවෙන් 2012 වසර සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ සුරක්ෂිතම වසර ලෙස 'ද ගාර්ඩියන්' පුවත් පත වාර්තා කොට ඇත.
ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය ගුවන් සමාගම් 240 ක් නියෝජනය කරනු ලබයි. ඔවුන්ගේ තොරතුරු වලට අනුව සියලුම ගුවන් සමාගම් එක්ව ගත් කල අනතුරක් සිදුව ඇත්තේ ගුවන් ගමන් 470,000 වරකි.

2012 වසර තුළ ඛේදජනක ගුවන් අනතුරු 02 ක් ලෙස පකිස්ථානයේ බෝජා ගුවන් සමාගමේ ගුවන් යානයේ අනතුර සහ නයිජීරියාවේ ඩානා ගුවන් අනතුර වාර්තා වූ අතර එහිදී පිළිවෙළින් පුද්ගලයින් 127 සහ 150 දෙනකු ජීවිතක්ෂයට පත් විය.

The air accident rate was at a record low this year, making 2012 the safest year in civil aviation history, the Guardian said.




## A 380 ගුවන් යානය සිය පියසැරියේ පස් වන වසර සමරයි

## 'Superjumbo' A380 marks five years in the sky

The Airbus A380 has just celebrated its fifth anniversary as a commercial aircraft

ලොව සුවිසල්ම මගී ගුවන් යානය සිය සාර්ථක පියසැරියේ පස්වන වසර පසු කරන ලදි. එවකදී පැවති විශාලතම ගුවන් යානය වූ බෝයිං 747 වර්ගයේ ගුවන් යානයට වඩා මීටර 15 ක පමණ පළලින් යුතුව නිර්මාණය වූ එයාර් බස් 380 ගුවන් යානය සිවිල් ගුවන් සේවා ඉතිහාසයේ එදා මෙදා තුර බිහිවූ විශ්මිත නිර්මාණයකි. මේ වන විට එයාර් බස් 380 වර්ගයට අයත් ගුවන් යානා 89 ක් පමණ පියසැරියන්ට දායක වේ. මෑතක දී A 380 ගුවන් යානා භාවිත කරන ලැයිස්තුවට 09 වැනියා ලෙස තායි එයාර්වේස් ගුවන් සමාගම එක් වූ අතර ඉදිරි කාල සීමාව සඳහා ගුවන් යානා 257 ක් වෙනුවෙන් ඇණවුම් ලැබී ඇත.

## ලොව ප්‍රථම Airbus 380 මගී පර්යන්තය ඩුබායිහි

## Dubai opens new airport concourse specially designed for the Airbus A380

20-gate concourse is part of a wider $7.8bn expansion plan for Dubai Airport as it sets to be world's busiest by 2015

වාර්ෂිකව ඩුබායි වෙත ළඟා වන මිලියන 50 ක් වන ගුවන් මගීන් වෙනුවෙන් පහසුකම් සැළසීම සඳහා පසුගිය ජනවාරි 02 දින පැමිණීමේ සහ පිටවීමේ දොරටු 20 ක් සමන්විත වන පරිදි ඉදිකර ඇති මෙම ගුවන් මගී පර්යන්තය නූතන මිනිසාගේ අපූරු නිර්මාණයක් ලෙස හැඳින්විය හැක. මෙය විවෘත කර ප්‍රථම මාසය තුළදී පියසැරියන් **2,450** සිදු කර ඇති අතර එහිදී ගුවන් මගීන් **589,234**, ගුවන් ගමන් මළු **461,972** ක් සඳහා අවශ්‍ය සේවාවන් ලබාදී ඇත.

During the first month of operations following its inaugural flight on January 2, Concourse A has handled 461,972 pieces of luggage carried on over 2,450 flights serving 589,234 passengers.







# මීළඟ වසර 20 තුළ ආසියාවට ගුවන් නියමුවන් 200,000 ක අවශ්‍යතාවයක්

## Asia needs close to 200,000 pilots in the next twenty years

ගුවන් සේවා කර්මාන්තයේ සීඝ්‍ර දියුණුවත් සමඟින් එළඹෙන වසර 20 තුළ ආසියානු ගුවන් ගමන් කර්මාන්තයට ගුවන් නියමුවන් ලක්ෂ 02 කට ආසන්න සංඛ්‍යාවක් අවශ්‍ය වනු ඇතැයි බෝයිං ගුවන් සමාගම පවසයි. ආසියානු ශාන්තිකර කලාපය තුළ ගුවන් කර්මාන්තයේ වේගවත් දියුණුවක් පෙන්නුම් කරන හෙයින් ගුවන් නියමුවනට අමතරව ගුවන් යානා නඩත්තු ශිල්පීන් ද රැසකගේ අවශ්‍යතාවය ද ඇති වන බව ඔවුන් වැඩිදුරටත් සඳහන් කරයි.

තවදුරටත් සිය තොරතුරු සවිස්තරාත්මක දක්වා ඇති බෝයිං සමාගම එය ගුවන් නියමුවන් 185,600 බවත් ගුවන් තාක්ෂණික ශිල්පීන් 243,500 බවත් සඳහන් කර ඇත. ඉන් වැඩි ප්‍රතිශතය චීනය වෙනුවෙන් වන අතර ඒ නව ගුවන් නියමුවන් 71,300 සහ ගුවන් තාක්ෂණික ශිල්පීන් 99,400 කි.

As travel demand increases in the region, Asia will need nearly 200,000 pilots in the next two decades.

Asia-Pacific, the world's fastest-growing aviation market, is facing a possible shortage of technicians and pilots, according to a study by Boeing Airlines.

According to the report, which is part of Boeing's industry forecast, the region would need about 185,600 new pilots and 243,500 new technicians in the next two decades.

# ඊජිප්තුවේ බැලූන අනතුරකින් 19 දෙනකු මිය යයි

## 19 tourists killed in hot air balloon accident in Egypt

The balloon was carrying several foreign nationals when it went down near the tourist town on 26 February 2013

පසුගිය පෙබරවාරි මස 26 වන දින ඊජිප්තුවේදී සිදුවූ උණුසුම් වායු බැලූන අනතුරකින් සංචාරකයින් 19 දෙනකු මිය ගොස් ඇත. අඩි 1000 ක් පමණ ඉහළින් ගමන් කරන අවස්ථාවේ ගෑස් කාන්දුවීමකින් සිදුවූ අනතුරක් බව මේ දක්වා සිදුකරන ලද පරීක්ෂණ වලින් හෙළි වී ඇත. අනතුර සිදුවන අවස්ථාවේ බැලූනය තුළ ප්‍රංශය, බ්‍රිතාන්‍ය, ජපානය, බෙල්ජියම සහ හොංකොං යන රට වල සංචාරකයින් 20 දෙනකු ගමන් කර ඇති අතර බැලූනයේ නියමුවා ලෙස ඊජිප්තු ජාතිකයකු කටයුතු කොට ඇත. දරුණු පිළිස්සුම් තුවාල සහිතව බ්‍රිතාන්‍ය ජාතිකයකු සහ ඊජිප්තු බැලූන නියමුවා දිවි ගලවා ගෙන ඇත.

උණුසුම් වායු බැලූන ඉතිහාසයේ සිදුවූ මෙම දරුණු අනතුරෙන් පසුව ඊජිප්තු රජය මගින් එරට සියලු බැලූන ගමන් අත්හිටුවා ඇත. මෙවන විට සිදුකරන ලද පරීක්ෂණ මගින් හෙළිවී ඇත්තේ බැලූනයේ ආධාරක කඹයක් හිලියම් ගෑස් නලයේ ගැටී ගිනි ගෙන ඇති බවයි.



NEWS



NEWS

අශාන් හෙට්ටිගේ

# ඩුබායි, Burj Al Arab හෙලිකොප්ටර් යාත්‍රාංගනය

## Burj Al Arab Hotel Helipad

ඩුබායි හි පමණක් නොව ලොව පුරාට අති සුඛෝපභෝගී හෝටල් අතරින් ප්‍රමුඛ ස්ථානයක ඇති Burj Al Arab ලොව සුපිරිතම තරු 7 හෝටලයකි. මෙම සුපිරි හෝටලය තට්ටු 70 කින් සහ කාමර 205 කින් සමන්විත වන අතර දැනට ආසියාවේ ඇති උස්ම හෙලිකොප්ටර් අංගනය පවතින ස්ථානයද වේ. අඩි 1,053 ක උසින් නිමවා ඇති මෙම අංගනය විටෙක ටෙනිස් පිටියක් ලෙසද භාවිතා කරයි. ඩුබායි වාස්තු විද්‍යාඥයින්ගේ අනර්ඝ නිර්මාණයක් වන මෙය 2005 වසරේ දී ඉදිකිරීම අවසන් කර ඇත. හෙලිකොප්ටර් යාත්‍රාංගනයේ වර්ගඵලය වර්ග අඩි 4467 කි.

NEWS

# වර්ජින් ගැලක්ටික් ප්‍රථම ගුවන් ගමන මේ වසරේ

## Virgin Galactic first flight expected in this year

The first passenger flight of Virgin Galactic is expected by the end of this year.

The craft, which is being designed to take passengers 100 km to the very edge of, will take Richard Branson and his two children on its maiden voyage at some point within the year.

The exact timeline for the first trip is yet to be finalized as is a lot of the other fine detail regarding the Virgin Galactic procedures, not least because of the fledgling nature of the commercial space (or, more accurately "edge of space") tourism industry.

The area with the most potential for causing delays in the flights is, understandably, the safety of passengers and crew during voyages.



# හීත්‍රෝ ගුවන් තොටුපළේ පසුබෑම පිළිබඳ 'බිසිග්නානි' විස්තර කරයි

Heathrow Airport is used by over 90 airlines flying to 170 destinations worldwide

ලන්ඩන් හීත්‍රෝ ගුවන් තොටුපළ, ධාවන පථ ධාරිතාවයේ අඩුපාඩු හේතුවෙන් යුරෝපයේ ගුවන් කේන්ද්‍රස්ථානය ලෙස මෙතෙක් කල් රඳවාගෙන සිටි තත්වය අහිමිව ගොස් ඇති බව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA - International Air Transport Association) හිටපු ප්‍රධාන විධායක 'ජියෝවානි බිසිග්නානි' (Giovanni Bisignani ) මහතා පවසයි.

ලන්ඩනයේ පැවති 'ගුවන් ප්‍රවාහනයේ අනාගතය' (Future of Air Transport) මැයෙන් වූ සමුළුවක් අමතමින් බිසිග්නානි මහතා තව දුරටත් පවසා සිටියේ මීට වසර 20 ට ප්‍රථම හීත්‍රෝ ගුවන් තොටුපළ සමග සම්බන්ධ වූ ගමනාන්ත ප්‍රමාණයට වඩා අඩු ගමනාන්ත ප්‍රමාණයක් වර්තමානයේ සම්බන්ධ වන බවත් ෆ්‍රැන්ක්ෆර්ට්, පැරිස් හි 'චාල්ස් ඩි ගෝල්' සහ ඇම්ස්ටඩෑම් හි 'ස්කිපෝල්' වැනි යුරෝපයේ වෙනත් තරඟකාරී ගුවන් තොටුපළ සමග සැසඳීමේ දී මෙහි ගමනාන්ත ප්‍රමාණය අඩු බවත්ය.

ඔහු තව දුරටත් පවසා සිටියේ හීත්‍රෝ හි 'ආසියා' ශාන්තිකර ගුවන් ජාලය ද වෙනත් යුරෝපීය ගුවන් තොටුපළ හා සැසඳීමේ දී දුර්වල මට්ටමක පවතින බවත් නව ගුවන් ධාවන පථයක් ගොඩනැගීමට වසර 10 ක් පමණ වැය වන නිසා යලි යථා තත්වයට පත් වීමට එම ගුවන් තොටුපළට තරමක් අපහසු බවයි. ලන්ඩන් හීත්‍රෝ ගුවන් තොටුපළෙහි තෙවනි ධාවන පථය සකස් කිරීමේ සැලසුම 2010 වසරේ දී ඉවත දැමිණ.






# 2012 වසරේ ලෝකයේ හොඳම ගුවන් සමාගම් 10

## The World's Top Airlines



QATAR AIRWAYS القطرية

ලෝකය පුරා පවතින ගුවන් සමාගම් භාවිත කරමින් සිය ගමනාගමන කටයුතු සිදුකරන ගුවන් මගීන්ගේ කැමැත්ත මත ලබා ගන්නා තොරතුරු අනුව හොඳම ගුවන් සමාගම් වාර්ෂිකව තෝරා ගනු ලබයි. ප්‍රධාන වශයෙන් මෙම දත්ත කොටස් 02 ක් යටතේ විශ්ලේෂණය කරනු ලබයි. ඒ ව්‍යාපාරික සහ සාමාන්‍ය වශයෙන් සියලුම ගුවන් යානා මැදිරින් තුළ. සම්පූර්ණ ගුවන් යානය පුරා විහිදී යන අයුරින් ගමන් කරන මගීන් ආවරණය වන පරිදිය. මෙම සමීක්ෂණය ලොවපුරා විහිදී පවතින ජාත්‍යන්තර මෙන්ම අභ්‍යන්තර ගුවන් සේවා 200 ක් පමණ ආවරණය වන පරිදි පවත්වා ඇත.

The World Airline Awards are the primary benchmarking tool for Passenger Satisfaction levels of airlines throughout the world, delivering a unique survey format based on analysis of business and leisure travellers, across all cabin travel types (First Class, Business Class, Premium Economy Class and Economy class passengers).

| 2012 | Airline | 2011 |
|---|---|---|
| 1 | Qatar Airways | 1 |
| 2 | Asiana Airlines | 3 |
| 3 | Singapore Airlines | 2 |
| 4 | Cathay Pacific Airways | 4 |
| 5 | ANA All Nippon Airways | 11 |
| 6 | Etihad Airways | 6 |
| 7 | Turkish Airlines | 9 |
| 8 | Emirates | 10 |
| 9 | Thai Airways International | 5 |
| 10 | Malaysia Airlines | 12 |

http://www.worldairlineawards.com
වෙබ් අඩවිය ඇසුරිනි.

NEWS

# 2012 වසරේ ලෝකයේ හොඳම **ගුවන් තොටුපළ 10**

## The World's Top 10 Airports in the year 2012

ගුවන් මගීන් මිලියන 12 යොදා ගනිමින්, මාස 10 ක කාල සීමාවක් තුළ ලෝකයේ ගුවන් තොටුපළ 385 ක් යොදා ගනිමින් සිදුකරනු ලබන සමීක්ෂණයකින් අනතුරුව මෙම ප්‍රතිඵල නිකුත් කර ඇත.

The results are based on 12 million passenger surveys completed during a 10-month survey period, covering over 385 airports. The survey evaluates the total passenger experience across 39 airport service and product features, from arrival at an airport, through transit and departure processes to the boarding gate. Operated since 1999, the annual airport customer survey is respected for clarity and independence, having no airport influence or bias.

The World Airport Awards are the global benchmark of airport excellence and known in the travel industry as the Passengers Choice Awards

| 2012 | Airport | 2011 |
|---|---|---|
| 1 | Incheon International Airport | 3 |
| 2 | Singapore Changi Airport | 2 |
| 3 | Hong Kong International Airport | 1 |
| 4 | Amsterdam Schiphol Airport | 6 |
| 5 | Beijing Capital International Airport | 5 |
| 6 | Munich Airport | 4 |
| 7 | Zurich Airport | 7 |
| 8 | Kuala Lumpur International Airport | 9 |
| 9 | Vancouver International Airport | 12 |
| 10 | Central Japan International Airport | 11 |

http://www.worldairportawards.com
වෙබ් අඩවිය ඇසුරිනි.



# තුර්කිය ලොව **විශාලතම** **ගුවන් තොටුපළ** **ඉදිකිරීමට සූදානම් වේ**

Turkey unveils plan for
## world's biggest airport

තුර්කියේ, ඉස්තාන්බුල් හි ඇමරිකානු ඩොලර් බිලියන 9.3 ක ව්‍යාපෘතියක් ලෙස ලොව විශාලතම ගුවන් තොටුපළ ඉදිකිරීමේ සැලසුම් සකස් කොට ඇති අතර මෙය නිර්මාණය වන්නේ වසරකට මගීන් මිලියන 150 ක් සඳහා පහසුකම් සැපයිය හැකි වන අයුරිනි. ගුවන් ධාවන පථ 06 කින් සමන්විත වන පරිදි ඉදිකරනු ලබන මෙම ගුවන් තොටුපළ ඉස්තාන්බුල් හි තෙවන ගුවන් තොටුපළයි. මෙය පියවර දෙකක් යටතේ සිදුකරනු ලබන අතර ප්‍රථම අදියර 2017 වසරේ දී විවෘත කිරීමට බලාපොරොත්තු වන බව තුර්කි ප්‍රවාහන අමාත්‍ය බිනලි යිල්ඩිරිම් මහතා පවසයි.

Turkey plans to build the largest Airport in the world in Istanbul and the Airport able to handle 150 million passengers per year.

# ගෝලීය ගුවන් මගී තදබදය **5.3% ඉහළ යයි**

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය
Global air passenger traffic up 5.3% in 2012 - IATA

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය නිකුත් කර ඇති නවතම දත්ත වලට අනුව 2012 වසරේ වාර්ෂික ගෝලීය ගුවන් මගී තදබදය 5.3% කි. මෙය පසුගිය 2011 වසරේ 5.9% ක් විය. සංගමය නිකුත් කරන ලද දත්ත මගින් මෙම වසරේ අභ්‍යන්තර ගුවන් ගමන් වලට සාපේක්ෂව ජාත්‍යන්තර ගුවන් ගමන් වල අභිවෘද්ධි යාමක් ලෙස පෙන්වා දී ඇත.

The International Air Transport Association (IATA) released the latest data, showing that the global air passenger traffic in 2012 rose 5.3% year-on-year, following an increase of 5.9% in 2011. In particular, the international aviation market outperformed the domestic aviation market.





NEWS

# ගුවන් යානා සමාගම

අශාන් හෙට්ටිගේ

Airbus ගුවන් යානය ශ්‍රී ලංකාවටද ඉතා සුවිශේෂී ගුවන් යානයකි. එසේ වන්නේ මේ වන විට ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය වන ශ්‍රී ලංකන් ගුවන් සමාගම මෙන්ම මිහින් ලංකා ගුවන් සමාගම විසින් ද භාවිත කරණු ලබන්නේ එයාර් බස් ගුවන් සමාගමට අයත් ගුවන් යානා වීමයි. අතීතයේ දී බෝයිං ගුවන් සමාගමට අයත් ගුවන් යානා අප සතුව පැවතුනද වර්තමානය වන විට පවතින යානා සියල්ලක්ම පාහේ එයාර් බස් සමාගමට අයත්ය.



ගුවන්සර පසුගිය කලාප මගින් අප ලොව ප්‍රකට ගුවන් යානා නිෂ්පාදන සමාගම් දෙකක් වන බෝයිං හා සෙස්නා ගුවන් සමාගම් පිලිබඳව කරුණු ඉදිරිපත් කරන ලද අතර මෙවර කලාපය තුළින් ලොව විශාලතම ගුවන් යානය නිපද වූ Airbus ගුවන් යානා සමාගම පිලිබඳ තොරතුරු විමසීමට අදහස් කළෙමු.

ඇමරිකානු ප්‍රධාන ගුවන් යානා නිෂ්පාදන සමාගම් වන Boeing, McDonnell Douglas සහ Lockheed ගුවන් යානා නිෂ්පාදනයේ පෙරමුණේ සිටි අවධිය වූ වර්ෂ 1970 දෙසැම්බර් මස 18 වන දින Airbus සමාගම ආරම්භ කර ඇත. මෙම ගුවන් සමාගම ප්‍රංශය, ජර්මනිය හා එංගලන්තය යන රජයන් ත්‍රිත්වය සමග එක්ව ඇරඹුණු අතර එවකට යුරෝපීය ප්‍රධාන ගුවන් යානා නිෂ්පාදන සමාගම් කිහිපයක් කොටස් හවුල්ව තබාගෙන පවත්වාගෙන ගියහ. Airbus සමාගමේ ප්‍රථම ගුවන් යානය Airbus 300 වේ.

එහි ප්‍රථම අදියර යටතේ නිපදවන ලද ප්‍රථම ගුවන් යානය ආසන 320 සහිතව හා එන්ජින් දෙකකින් සමන්විතව නිපදවා ඇත. එහි නියමු කුටිය, පාලන උපාංග සහ යානයේ බඳෙහි පහළ කට්ටුව ප්‍රංශයේ දී නිපදවා ඇත. බ්‍රිතාන්‍ය Hawker Siddeley සමාගම මගින් යානයේ තටු ද ජර්මනියේ දී බඳ කොටසෙහි ඉතිරි නිෂ්පාදන කටයුතු සිදු කර ඇති අතර නෙදර්ලන්තය සහ ස්පාඤ්ඤය ද නිෂ්පාදන කටයුතු සඳහා දායකත්වය ලබාදී ඇත. Rolls Royce සමාගම එහි එන්ජිම නිපදවීය. ප්‍රථම යානය වර්ෂ 1972 දී සාර්ථකව ගුවන් ගත වූ නමුත් මෙම යානය එළිදක්වන අවධියෙහිදීම අධිවේගී Concorde යානයද එළිදැක්වූ බැවින් A 300 යානය එතරම් ප්‍රසිද්ධියට පත් නොවුණි. එවකට Airbus සමාගමෙහි ප්‍රධානියෙකු වූ Bernard Lathière මූලිකව ඇමරිකාව හා ආසියාව තුළ ප්‍රධාන ගුවන් සමාගම් වෙත A 300 යානයේ ප්‍රචාරණ කටයුතු සිදු කරන අතරතුරදී ඇමරිකානු ගුවන් සමාගමක් වූ Eastern ගුවන් සමාගම මෙම යානය ප්‍රථමයෙන් මිළට ගත්හ.

වර්ෂ 1979 වන විට කෙමෙන් කෙමෙන් යානය සඳහා වූ ඇණවුම් වැඩිවන්නට විය. ඒ සමගම Airbus සමාගම තවත් නව ගුවන් යානා නිපදවීමට තීරණය කරන ලද අතර ඒ අනුව A 310 හා A 320 යානා නිෂ්පාදනය 1981 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. A 320 යානයත් සමගම



Air
bus
සමාගම

fly-by-wire නම් විශේෂ තාක්ෂණයද ලොවට හඳුන්වා දුනි. Airbus යානා වලට පමණක් ආවේණික වූ එම තාක්ෂණය පිළිබඳ ගුවන් සමාගම් බොහෝමයකගේ අවධානය යොමු විය. ඒ සමගම Airbus සමාගමේ නිෂ්පාදන කටයුතු ද පුළුල් වූ අතර A 320 හා A 330 යානා වල වාර්තාගත අලෙවියක් සිදු වීමත් සමගම එන්ජින් 4 ක් සහිත A 340 යානාව නිපදවන ලදී. එයද ලොව්පුරා බොහෝ දෙනාගේ විශේෂ අවධානයට ලක්වූ අතර ඉතා සාර්ථක අලෙවියක් ද සිදු වුණි. ඒ සමගම Airbus සමාගම ගුවන් යානා නිපදවීමේ කර්මාන්තය තුළ යම් ස්ථාවර බවක් රඳවා ගැනීමට සමත් විය.

A 340 යානා මාලාවේ A 340-600 යානයේ දිග 75.30m ක් වන අතර එය දැනට ලොව ඇති දිගම මගී ගුවන් යානය වේ. ඉන් පසු එවක දී ලොව විශාලතම මගී ගුවන් යානය වූ Boeing 747 යානයට අභියෝගයක් ලෙස 1994 වර්ෂයේදී ඔවුන් විසින් A 3XX නමින් විශාල මගී ගුවන් යානයක් නිපදවීමේ සැළසුම් දියත් කළහ. සැළසුම්

ඇමරිකානු ප්‍රධාන ගුවන් යානා නිෂ්පාදන සමාගම් වන Boeing, McDonnell Douglas සහ Lockheed ගුවන් යානා නිෂ්පාදනයේ පෙරමුණේ සිටි අවධිය වූ වර්ෂ 1970 දෙසැම්බර් මස 18 වන දින Airbus සමාගම ආරම්භ කර ඇත. මෙම ගුවන් සමාගම ප්‍රංශය, ජර්මනිය හා එංගලන්තය යන රජයන් ත්‍රිත්වය සමග එක්ව ඇරඹුණු අතර එවකට යුරෝපීය ප්‍රධාන ගුවන් යානා නිෂ්පාදන සමාගම් කිහිපයක් කොටස් හවුල්ව තබාගෙන පවත්වාගෙන ගියහ. Airbus සමාගමේ ප්‍රථම ගුවන් යානය Airbus 300 වේ.

සාර්ථක වීමත් සමඟම 2002 වසරේදී Airbus A 380 යානයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදි. එක් එක් රටවල නිපදවන ලද A 380 යානයේ කොටස් එකලස් කිරීමේ කටයුතු සිදු වූයේ ප්‍රංශයේ Toulouse හිදී ය. 2005 වසරේදී එයාර්බස් සමාගම එතෙක් මෙතෙක් ඉතිහාසයේ සිහිකරන ලද විශිෂ්ට නිර්මාණයක් වූ A 380 යානයේ ප්‍රථම ගුවන් ගමන සිදුකරන ලද්දේ ලොවම මවිතයට පත් කරමිනි. එහි සාර්ථකත්වයත් සමඟම Airbus සමාගමේ A 350 නම් අති ස්වයංක්‍රීය ගුවන් යානය නිපදවීමේ කටයුතු මේ දිනවල සිදු වේ.

## එයාර් බස් ගුවන් සමාගමේ නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු
Product list and details

| ගුවන් යානා මාදිලිය Aircraft | තොරතුරු Description | ආසන Seats | උපරිම Max | ප්‍රථම ගුවන් ගමන 1st flight |
|---|---|---|---|---|
| A 300 | 02 Engines | 228 | 361 | 28 October 1972 |
| A 310 | 02 Engines | 187 | 279 | 3 April 1982 |
| A 318 | 02 Engines | 107 | 117 | 15 January 2002 |
| A 319 | 02 Engines | 124 | 156 | 25 August 1995 |
| A 320 | 02 Engines | 150 | 180 | 22 February 1987 |
| A 321 | 02 Engines | 185 | 220 | 11 March 1993 |
| A 330 | 02 Engines | 253-295 | 406-440 | 2 November 1992 |
| A 340 | 04 Engines | 239-380 | 420-440 | 25 October 1991 |
| A 350 | 02 Engines | 270-350 | 550 | 2013 |
| A 380 | 04 Engines | 555 | 853 | 27 April 2005 |



**Airbus සමාගම සතුව A 300-600 ST Beluga නමින් විශේෂ භාණ්ඩ ප්‍රවාහනය සඳහා නිපදවූ ගුවන් යානයක් ද වේ. බොහෝ අවස්ථාවල ගුවන් යානා නිෂ්පාදන කටයුතු වලදී එක් එක් රටවල නිපදවන යානාවන්හි බඳ, තටු සහ එන්ජින් කොටස් ආදිය අවසන් එකලස් කිරීමේ ස්ථානය වෙත ගෙන එනු ලබන්නේ මෙම Beluga යානය මගිනි.**



Airbus සමාගම සතුව A 300-600 ST Beluga නමින් විශේෂ භාණ්ඩ ප්‍රවාහනය සඳහා නිපදවූ ගුවන් යානයක් ද වේ. බොහෝ අවස්ථාවල ගුවන් යානා නිෂ්පාදන කටයුතු වලදී එක් එක් රටවල නිපදවන යානාවන්හි බඳ, තටු සහ එන්ජින් කොටස් ආදිය අවසන් එකලස් කිරීමේ ස්ථානය වෙත ගෙන එනු ලබන්නේ මෙම Beluga යානය මගිනි.

වර්ෂ 1990 දී Airbus සමාගම යුධ කටයුතු සඳහා ගුවන් යානා නිපදවීම සඳහා සැලසුම් සකස් කරන ලද අතර පසුව දීර්ඝ කාලීන සැලසුම්කට අනුව යුධ කටයුතු වලදී බෙහෙවින් වැදගත් වන ගුවනේ දී තවත් ගුවන් යානාවකට ඉන්ධන ලබා දිය හැකි Airbus A310 MRTT හා Airbus A330 MRTT නම් යානා පිළිවෙළින් වර්ෂ 2003 දෙසැම්බර් හා 2007 ජුනි මස දී එළි දක්වන ලදි. එමෙන්ම

ඇන්ටනොව් An-124 හා C-130 Hercules ආකාරයේ යානාවක් Airbus A400M නමින් වර්ෂ 2008 ජුනි මස දී එළිදක්වනා ලදි.

Airbus සමාගම සැම විටම Boeing සමාගම සමග තරඟකාරීව සිටිනා බව ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ ප්‍රකට කරුණකි. සමාගම් දෙක එකම වර්ගයේ ගුවන් යානා නිපදවීම මෙයට ප්‍රධාන හේතුවයි. Boeing 747 යානාව දීර්ඝ කාලයක් ලොව විශාලතම මගී ගුවන් යානාව ලෙස පැවති අතර මෑතකදී Airbus සමාගම විසින් එය අභිබවා යන අන්දමින් Airbus A 380 යානාව එළි දක්වන ලදි. නවද Airbus සමාගමේ නවතම යානාවක් වන Airbus A 350 හා Boeing සමාගමේද නවතම යානාවක් වන Boeing 787 Dreamliner යානා අතරද මේ වන විට තරගයක් පවතී. එම යානා දෙකම අති සුඛෝපභෝගී ගුවන් යානා වන අතර Boeing 787 Dreamliner යානය ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද වර්තමානය වන විට මගී ගුවන් යානා අතුරින් Airbus සමාගම සිය නාමය ඉහළින් රඳවා ගෙන සිටී.

Airbus සමාගම, 52,000 ක සේවක පිරිසක් යොදා ගනිමින් ප්‍රධාන වශයෙන් ජර්මනිය, ප්‍රංශය, එංගලන්තය සහ ස්පාඤ්ඤය යන රටවල දී සිය නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන අතර නිෂ්පාදනය වූ එක් එක් කොටස් එකලස් කිරීමේ කටයුතු සිදුවන්නේ ප්‍රංශයේ Toulouse හිදී හා ජර්මනියේ Hamburg හිදී ය. Airbus සමාගම, 2009 වසරේ සිට ඇමරිකා එක්සත් ජනපදය චීනය හා ඉන්දියාව යන රටවල් හිද සිය මූලස්ථාන පිහිටුවා ඇත.



වසර ගණනක අභිමානවත් ඉතිහාසයක් පවතින Airbus ගුවන් යානා සමාගම කුඩා ගුවන් යානා කිහිපයක් නිපදවමින් සිය ආරම්භක පියවර තබන ලද අතර අද වන විට ලොව පවතින දැවැන්තම මගී ගුවන් යානයට හිමිකම් කියයි. ලොව ප්‍රබල රටවල් කිහිපයකම පාහේ සුවිසල් මූලස්ථාන පිහිටුවා ඇති මෙම Airbus සමාගම ආසියාකරය තුළද මේ වන විට සිය ආධිපත්‍ය පතුරවා අවසන්ය. මහජන චීන සමූහාණ්ඩුව පවා අද Airbus සමාගමෙන් ගුවන් යානා සිය ගණනින් ලබා ගැනීමට ගිවිසුම් අත්සන් කර හමාරය. ඒ ඔවුන්ගේ ගුවන් යානා වල පවතින සුවිශේෂීභාවය නිසාවෙන් මෙන්ම එහි ඇති සුරක්ෂිතභාවය හේතුවෙනි. ගුවනින් ගමන් කරන සැමගේ පොදු අපේක්ෂාව වන්නේ ද එහි සුරක්ෂිතභාවයයි. එකී අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීම සඳහා Airbus ගුවන් සමාගම දක්වා ඇත්තේ සුළු පටු දායකත්වයක් නොවන බව ඔවුන්ගේ අනතුරු අනුපාතය ඉතා පහළ අගයක පැවතීමෙන් මනාව පැහැදිලි වේ.

**Airbus සමාගම, 52,000 ක සේවක පිරිසක් යොදා ගනිමින් ප්‍රධාන වශයෙන් ජර්මනිය, ප්‍රංශය, එංගලන්තය සහ ස්පාඤ්ඤය යන රටවල දී සිය නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන අතර නිෂ්පාදනය වූ එක් එක් කොටස් එකලස් කිරීමේ කටයුතු සිදුවන්නේ ප්‍රංශයේ Toulouse හිදී හා ජර්මනියේ Hamburg හිදී ය. Airbus සමාගම, 2009 වසරේ සිට ඇමරිකා එක්සත් ජනපදය චීනය හා ඉන්දියාව යන රටවල් හිද සිය මූලස්ථාන පිහිටුවා ඇත.**

FEATURE





# A 320 FAMILY

A 320 පවුල යනු ප්‍රමාණයන් 04 කින් යුතු වූ ගුවන් යානා මාදිලි 04 කි. ඒවා පිළිවෙලින් A 318, A 319, A 320, A 321 වේ. මෙම යානාවන්හි පවතින විශේෂත්වයන් නම් fly-by-wire තාක්ෂණය, නොනවතින නවීකරණයන්, අවම ඉන්ධන ප්‍රමාණයක් වැයවීම සහ ශබ්දය අවම වීමය. තවද මේවායේ පාලන ක්‍රමවේදයන්, ගුවන් නියමු කුටිය, ක්‍රියාත්මක කිරීම මෙන්ම නඩත්තු කිරීමේ ක්‍රමවේදයන්ද එක හා සමානය. මේ වන විට A 320 පවුලේ ගුවන් යානා 7,000 ක් පමණ විකිණී අවසන් අතර ඉන් 4,500 ක් පමණ වත්මන් පියසැරියන් සඳහා දායක වේ.



A 330 යානය පළල් බඳ සහිත යානා අතර වැඩිම ඉල්ලුමක් පවතින යානයකි. මෙහි මගී ආසන 220 - 330 දක්වා ප්‍රමාණයන් ගෙන් යුක්තය. වර්තමානය වන විට සතියකදී ගුවන් මෙහෙයුම්කරුවන් 80 ක් දෙනා ලෝකය පුරා ගුවන් තොටුපළ 300 දී පමණ A 330 යානා භාවිත කරමින් සිය දීර්ඝ ගුවන් ගමන් මෙන්ම සාමාන්‍ය ගුවන් ගමන් සිදුකරයි.

මේ වන විට A 340 ගුවන් යානා 400 පමණ විකිණී අවසන්ය. මෙහි මගී ආසන 300 - 400 දක්වා ප්‍රමාණයන් ගෙන් යුක්තය. ඉහළ සැප පහසුකම් ඇති ගුවන් යානා අතර ප්‍රමුඛයෙකි. ඉතා ඉහළ ඉල්ලුමක් පවතින ගුවන් මාර්ගයන්හි ගුවන් ගමන් වැඩි ප්‍රමාණයක් සඳහා A 340 ගුවන් යානා යොදා ගන්නේ එහි ඇති සුරක්ෂිත බව නිසා මෙන්ම එහි ඇති පහසුකම් හේතුවෙනි.

# A 330 A 340 FAMILY

FEATURE




# A 350 XWB

ENVIRONMENTAL IMPACT IS KEPT TO A MINIMUM BY THE EXTREMELY LOW EMISSIONS AND NOISE CHARACTERISTICS OF THE A 350 XWB, THUS ENSURING A SUSTAINABLE FUTURE FOR AVIATION.

A 350 XWB යනු Airbus ගුවන් සමාගමේ නවතම නිර්මාණයයි. වෙළඳ පොළ පවතින අවශ්‍යතාවයනට අනුව මෙහි මගී ආසන 270 - 350 දක්වා ප්‍රමාණයන් ගෙන් යුක්තය.

මගී සුරක්ෂිතතාවය වෙනුවෙන් A 350 XWB යානය අති නවීන අංගෝපාංග රාශියක් එක් කොට ඇති අතර ඒවා ඔවුනට සුව පහසු ගුවන් ගමනකට ඉහළ දායකත්වයක් සපයනු ඇත.

වැයවන ඉන්ධන ප්‍රමාණය අවම වීම මෙන්ම ගුවන් මෙහෙයුම් වැය ප්‍රමාණය පහළ අගයක පැවතීම හේතුවෙන් නවීන A 350 XWB යානය බෝයිං ගුවන් සමාගමේ Boeing 787 යානයට වඩා පියවර කිහිපයක් ඉදිරියෙන් සිටී. A 350 XWB යානය මගින් සිදුවන පරිසර බලපෑම් ඉතා අවම මට්ටමක පැවතීම හේතුවෙන් පරිසකාමී ගුවන් සේවා කර්මාන්තයක් සඳහා මෙම යානය ඉතා හොඳ පිළිතුරකි.

A 380 යනු Airbus ගුවන් සමාගම විසින් නිපදවන ලද මගී තදබදය වෙනුවෙන් 2007 වසරේදී එළිදක්වන ලද මගී ගුවන් යානයයි. තට්ටු දෙකකට බෙදී යන අයුරින් නිර්මාණය කරන ලද මෙහි, මගී ආසන 500 - 850 දක්වා ප්‍රමාණයකින් යුක්තය. පවතින නව පරිසර හිතකාමී නීති, රීතීන්ට අනුකූලව නිර්මාණය කරන ලද මෙම යානය ගුවන් මගීන්ගේ දැඩි ආකර්ෂණයට ලක්ව ඇති අතර අවම ඉන්ධන ප්‍රමාණයක් වැයවීම ගුවන් සමාගම් සඳහාද අමතර ආර්ථිකමය වාසියකි. A 380 යානය Airbus ගුවන් සමාගම විසින් නිර්මාණය කරන ලද 21 වන සියවසේ සුවිශේෂී මෙන්ම විශ්මිත නිර්මාණයකි.

# A 380



FEATURE





# ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

# පාදුක්ක

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපනික කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ තවත් විශේෂ වැඩසටහනක් සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමාගේ ඉල්ලීමකට අනුව සීතාවක අභිමන් ප්‍රදර්ශනයට සමගාමීව, පසුගිය ජනවාරි මස 11 වනදා පාදුක්ක ශ්‍රී පියරතන විද්‍යාලයේ දී පවත්වන ලදි. වැඩසටහන සඳහා ජලප්‍රවාහන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගීතාංජන ගුණවර්ධන, කොළඹ නගර සභාවේ හිටපු නගරාධිපති ප්‍රසන්න ගුණවර්ධන යන මහත්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය.

ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ හඳුන්වාදීමේ දේශනය සඳහා ශ්‍රී පියරතන විද්‍යාලය නියෝජනය කරමින් ආචාර්යවරුන් ඇතුළු පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් 350 ක පමණ පිරිසක් සහභාගී වූ අතර ක්‍රීඩාංගණයේ පැවති දුරස්ථපාලක ආදර්ශ ගුවන් යානා සංදර්ශනය නැරඹීම සඳහා පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් ඇතුළු මහජනතාව 3000 කට ආසන්න පිරිසක් සහභාගී විය.

එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය නියෝජනය කරමින් අධ්‍යක්ෂ ජෙනරාල් එච් එම් සී නිමල්සිරි මහතා සහ අධ්‍යක්ෂ පණ්ඩුක ජයවීර මහතා සහභාගී වූ අතර පාසල් සිසුන් සඳහා වූ දේශනය සිදුකරන ලද්දේ අධ්‍යක්ෂ ජෙනරාල් එච් එම් සී නිමල්සිරි මහතා විසිනි. එහිදී ගුවන් සමාගම් කර්මාන්තය පිළිබඳ දේශනය බෝයිං ගුවන් යානා සමාගමේ හිටපු ගුවන් යානා ඉංජිනේරු තිලක් දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලදි.







CADEC has conducted a special Aviation awareness programme at Padukka Sri Piyarathana Vidyalaya and a model aircraft show at Padukka Public Grounds yesterday the 11th January with parallel to the Seethawaka Abhiman Exhibition. These programmes were requested by Deputy Minister of Civil Aviation, Hon. Gitanjana Gunawardena.

Mr. H.M.C.Nimalsiri, DGCA & CEO conducted the main presentation on 'Introduction to Aviation' and Mr.Tilak Dissanayake conducted a presentation on 'Introduction to Airline Industry.

Minister of Water Supply and Drainage, Hon.Dinesh Guanwardana, Deputy Minister of Civil Aviation, Hon.Gitanjana Gunawardena and Mr.Prasanna Gunawardana, Former Mayor of the Colombo Municipal Council have participated at this events. Nearly 350 students and teachers participated at this programme. End of the programme there was a quiz programme and prizes were given to the winners.










# විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන ගාල්ල දිස්ත්‍රික්කය

## Principals Meeting for **Galle District**



ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපනික කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ ගාල්ල දිස්ත්‍රික්කය සඳහා වූ විදුහල්පතිවරුන් දැනුවත් වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කථානායක අධි නීතිඥ, චන්දිම වීරක්කොඩි මැතිතුමාගේ ඉල්ලීමකට අනුව පසුගිය ජනවාරි මස 07 වනදා ගාල්ල නගරසභා ශාලාවේ දී පවත්වන ලදි.

මෙම වැඩසටහන සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් ගුවන් සේවා සමාජ 36 නියෝජනය කරමින් විදුහල්පතිවරුන්, ගුවන් සේවා සමාජ භාර ආචාර්යවරුන් ඇතුළු පාසල් සිසු/ සිසුවියන් 200 ක පමණ පිරිසක් සහභාගී විය.

එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය නියෝජනය කරමින් අධ්‍යක්ෂ පණ්ඩුක ජයවීර මහතා සහභාගී වූ අතර එතුමා විසින් පාසල් විදුහල්පතිවරුන් වෙනුවෙන් වූ ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුවත් කිරීම සහ පාසලක ගුවන් සේවා සමාජයක් පිහිටුවීමේ වැදගත්කම පිළිබඳ ඉදිරිපත් කිරීම සිදුකරන ලදි.











GUWANSARA

# Principals Meeting for **Galle District**

The Principals Meeting for Galle District was held on 07 January 2013, as per the request of Hon. Chandima Weerakkodi, Deputy Speaker of the Sri Lanka Parliament. Over 200 persons participated at this meeting including Principals, Teacher In charge of the school Aviation Clubs, Presidents and Secretaries of 36 Aviation clubs in Galle district.

Mr.Panduka Jayaweera, Director (corporate), Civil Aviation Authority of Sri Lanka, conducted a presentation on Value of Aviation Clubs and Mr.Tilak Dissanayake, Former Engineer, Boeing Company, has conducted a presentation on Introduction to Aviation Industry.

# ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ **ප්‍රධාන වැඩසටහන** ගාල්ල දිස්ත්‍රික්කය

## Main Aviation Awareness Programme for the **Galle District**




ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ, සිවිල් ගුවන් සේවා සංවර්ධන සහ අධ්‍යාපනික කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ ගාල්ල දිස්ත්‍රික්කය සඳහා වූ වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කථානායක අධිනීතිඥ චන්දිම වීරක්කොඩි මැතිතුමාගේ ඉල්ලීමකට අනුව පසුගිය ජනවාරි මස 15 වනදා ගාල්ල ඇල්පිටිය ආනන්ද විද්‍යාලයේ දී උත්සවාකාරයෙන් පවත්වන ලදි.
එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු නියෝජ්‍ය කථානායක අධි නීතිඥ චන්දිම වීරක්කොඩි මැතිතුමා, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු ශාන් විජයලාල් ද සිල්වා මැතිතුමා, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය නියෝජනය කරමින් අධ්‍යක්ෂ ජෙනරාල් එච් එම් සී නිමල්සිරි මහතා, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ අධ්‍යක්ෂ පණ්ඩුක ජයවීර මහතා, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ අතුල ජයවික්‍රම මහතා, ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු අමුත්තන් සහ පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විශාල පිරිසක් සහභාගී විය.

වැඩසටහන ප්‍රධාන අංග 03 යටතේ පැවැත්විණ.

1. ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ හඳුන්වාදීමේ දේශනය
2. දුරස්ථපාලක ආදර්ශ ගුවන් යානා සංදර්ශනය
3. දැනුම මිනුම වැඩසටහන

ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ හඳුන්වාදීමේ දේශනය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් ගුවන් සේවා සමාජ 36 නියෝජනය කරමින් ගුවන් සේවා සමාජ භාර ආචාර්යවරුන් ඇතුළු පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් 500 ක පමණ පිරිසක් සහභාගී වූ අතර ඇල්පිටිය ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගණයේ පැවති දුරස්ථපාලක ආදර්ශ ගුවන් යානා සංදර්ශනය නැරඹීම සඳහා පාසල් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් ඇතුළු මහජනතාව 5000 ට ආසන්න පිරිසක් සහභාගී විය. වැඩසටහනට සහභාගී වූ ගරු නියෝජ්‍ය කථානායක අධිනීතිඥ චන්දිම වීරක්කොඩි මැතිතුමා සිය අදහස් දක්වමින් පවසා සිටියේ නගරයෙන් බැහැර ප්‍රදේශ වල පාසල් දරුවන් වෙනුවෙන් ගුවන් සේවාව පිළිබඳ දැනුම ලබාදීමට ගත් මේ පියවර ඉතාමත් වැදගත් බවයි. වැඩිදුරටත් අදහස් දැක්වූ එතුමා මෙම කාර්යය ඉදිරියට ගෙන යාමට කාර්යක්ෂම දායකත්වයක් ලබා දෙන සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ මෙම වැඩසටහන සඳහා නායකත්වය ලබාදෙන සිවිල් ගුවන් සේවා අමාත්‍ය පියංකර ජයරත්න මැතිතුමාට සිය ස්තුතිය පුද කළේය.



CADEC conducted the Main Aviation Awareness Programme for the Galle District on 15 January 2013 at Elpitiya Ananda College, Galle. The chief guest was Hon.Chandima Weerakkody, Deputy Speaker of the Sri Lanka Parliament. Other guests were Hon.Shan Wijelal De Silva, Chief Minister – Southern Province, Mr.H.M.C.Nimalsiri, DGCA & CEO, Chairman of the Pradeshiya Sabha – Elpitiya, Divisional Secretary, Elpitiya, Mr.Atula Jayawickrama, D (AS) and Mr.Panduka Jayaweera, D (CP).



There were three main events of the main Aviation awareness programme.

1. Model Aircraft show – Negombo Aero modellers
2. Introduction to Aviation Lecture – Capt. Menaka Fernando
3. Quiz Programme

**Over 500 persons** participated at this seminar (introduction to Aviation) including Principals, Teacher in charge of the school Aviation Clubs and members of **36 Aviation clubs in Galle district**, and also entertained nearly **3,000 students & general public** thorough Model our Aircraft show Hon. Deputy Speaker mentioned that this awareness programme is very effective to the children in rural areas and also thanked to the Hon.Piyankara Jayarathne, Minister of Civil Aviation to conduct this valuable programme. End of the programme there was a quiz programme and prizes were given to the winners.











# MATTALA RAJAPAKSA
# INTERNATIONAL AIRPORT

**Mattala Rajapaksa International Airport** will be Sri Lanka's second international airport, after Bandaranaike International Airport. It will also serve as the secondary hubs for Sri Lankan Airlines and Mihin Lanka.






**TERMINAL BUILDING**

The Terminal building will be of area 12,000m$^2$ (apprx) with the capacity to handle 1,000,000 passengers per annum



මත්තල, **රාජපක්ෂ ගුවන් තොටුපළේ** ප්‍රථම අදියරේ ඉදිකිරීම් කටයුතු සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 209 ක් වැය වී ඇති අතර, ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් වන විට එය හෙක්ටයාර් 2000 ක් පුරා ව්‍යාප්ත වනු ඇත. මෙම නවීන ගුවන් තොටුපළ එයාර් බස් 380 (A 380) නම් දැනට ලෝකයේ විශාලතම ගුවන් යානය පවා ගොඩබැස්සවිය හැකි අයුරින් නිර්මාණය කර ඇත.

The airport is estimated to cost US $210 million and, by the end of its constructions, will cover 2,000 hectares. It is being built to be compatible with the latest Airbus A380 aircraft and has been designed according to recommendations of the International Civil Aviation Organization.